ධම් දානය සඳහා නොමිලයේ බෙදා දීම පිණිසයි.



බුදු දහම ප්‍රඥාවෙන්ම විමසිය යුතු දහමකි. පටිච්ච සමුප්පාදයේ නිරෝධා යන්න එහි සඳහන් සියලුම කොටස්, එනම් අවිද්‍යා, සංඛාර, විඤ්ඤාණ, ... භව, ජාති, දුක්ඛ යන සියල්ලටම පොදු විය යුතුයි. නමුත් අද බොහෝවිට අසන්නට ලැබෙන්නේ රහතන් වහන්සේ යනු තණ්හා, උපාදාන, භව, ජාති යන්න පමණක් දුරු කළ නමුත් විඤ්ඤාණ, නාමරූප, සළායතන, ඵස්ස, වේදනා ඉතුරු වූ පිරිසක් ලෙසටයි. රහත් වූ පසුත් පිරිනිවන් පෑම දක්වාම සළායතන පවතින බවත්, ඒ නිසා ඵස්ස, වේදනා පවතින බවත්, නාමරූප, විඤ්ඤාණ එනම් පංචස්කන්ධ (රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ) පහල වන බවත්, ඒවා ඉතිරි නැතිව නිරෝධ වන්නේ පරිනිර්වානයේදී බවත් බොහෝ විට අසන්නට ලැබේ. මෙය බුදුරජාණන් වහන්සේ දේශනා කළ පටිච්ච සමුප්පාදයට එකඟදැයි නුවණින් විමසීම බොහෝවිට ධර්මාවබෝධය පිණිස හේතුවනු ඇත. රහත්වීම යනු දුක සම්පූර්ණයෙන් ඉතිරි නැතිව නිරෝධ වීම නම් තව දුරටත් සළායතන, ඵස්ස, වේදනා ඉතිරි විය හැකිද යන්න ප්‍රඥාවෙන් විමසිය යුතු කරුණකි.

මහා නිදාන සූත්‍රයේදී බුදුරජාණන් වහන්සේ ආනන්ද හිමියන්ට දුන් අවවාදය, ''ආනන්ද එසේ කියන්න එපා, මේ පටිච්ච සමුප්පාදය ඔබ සිතන තරම්, ඔබට වැටහෙන තරම් සරළ දහමක් නොවේ'' යන්න නැවතත් සිහිපත් කරගෙන **''යො ධම්මං පස්සති සො පටිච්ච සමුප්පාදං පස්සති''** යන බුද්ධ වචනයන් සිහිපත් කරගෙන තමන් තුළ දැනට ඇති දෘෂ්ටීන්ගෙන්, මතවාද වලින් ඉවත් වී නැවතත් නුවණින් පටිච්ච සමුප්පාදය විමසීම උතුම් ධම්මාවබෝධය පිණිසම හේතුවන නිසා ඔබ සැමට ඒ සඳහා කරන ආරාධනාවකි මෙය.


රවිඳු කොග්ගලගේ
http:\\ravi.harimaga.com



ISBN 978-955-41184-0-9


# බුදු දහම දැක ගනිමු - 1

## පටිච්ච සමුප්පාද සාකච්ඡා





රවිඳු කොග්ගලගේ

# බුදු දහම දැක ගනිමු - 1

## පටිච්ච සමුප්පාද සාකච්ඡා

2013 වර්ෂයේදී නුගේගොඩ සුභද්‍රාරාමයේදී

මහාචාර්ය රවී කොග්ගලගේ මහතා විසින්

පැවැත්වූ ධර්ම සාකච්ඡා කිහිපයක්

2013 නොවැම්බර්

ප්‍රථම මුද්‍රණය : 2013 නොවැම්බර්

**ISBN 978-955-41184-0-9**

පොත පිළිබඳ විමසීම්:

මහාචාර්ය රවීන්ද්‍ර කොග්ගලගේ
Email: koggalage@yahoo.com
Web: http://ravi.harimaga.com
Mobile : 0777234239

මුද්‍රණය:
චැනල් ලින්ක් පුද්ගලික සමාගම
473/1, සමූපකාර මාවත, පැලන්වත්ත, පන්නිපිටිය
දු.ක. 0777 551 911

උතුම් ධර්ම දානයකි. නොමිලයේ බෙදා දීම පිණිසයි.

# සබ්බ දානං ධම්ම දානං ජිනාති

### සියළු දානයන් අතරින් ධර්ම දානය උතුම්වේ

## පුණ්‍යානුමෝදනාව

ගම්පහ පහළයාගොඩ, ශ්‍රී සුමංගල මාවතේ පදිංචිව සිට පරලෝ සැපත් ලැම්බට් රූපසිංහ සහ චන්ද්‍රාවතී හඳපාන්ගොඩ යන දෙමව්පියන්ට පින් පිණිස CECB ආයතනයේ සභාපති නිහාල් රූපසිංහ මහතා, සුධර්මා රූපසිංහ මහත්මිය, එම දෙපළගේ ආදරණීය පුතා සහ දියණිය විසින් මෙම ධර්මදාන කටයුත්ත සඳහා දායකත්වය ලබා දී ඇත. තවද සුභද්‍රාරාමයේ භාවනා වැඩසටහනට සහභාගී වන සියළුම පින්වත් පිරිසත් ඒ අයගේ පවුල්වල මිය ගිය ඥාතීන්ට පින් පිණිස මෙම ධර්මදාන කුසලයට දායක වී ඇත. ඔවුන් සියළු දෙනාටම මේ පින් උතුම් ධර්මාවබෝධය පිණිසම හේතු වාසනා වේවා.

මෙම පොතේ පරිගණක පිටු සැකසීමට උපකාර වුනු දිල්රුක්ෂි වීරරත්න මහත්මියගේ දෙමව්පියන් වන ෆැන්සිස් සහ ඇග්නස් වෛද්‍යරත්න, එච්.බී. වීරරත්න යන ඥාතීන්ට පින් පිණිසත් මේ කුසලය හේතුවේවා.

මෙම උතුම් ධර්මදානමය කුසල බලය හේතු කොට ගෙන මෙයට සහසම්බන්ධ වූ සියළුම දෙනාට නිදුක්, නිරෝගී සුවපත්භාවය ලැබීම පිණිසත්, මේ ගෞතම බුදු සසුනේදීම චතුරාර්‍ය සත්‍යය ධර්මය අවබෝධය පිණිසත්, නිවන් සුව අවබෝධය පිණිසත් හේතුවේවා.

සාදු! සාදු! සාදු!

# හැඳින්වීම

ඔබේ ආගම කුමක්දැයි ඇසූ විට බෞද්ධ යැයි පිළිතුරු දෙනවා ඇත. ඔබ බෞද්ධ යැයි සිතා සිටිනවා විය හැක. ඒ ගැන සමහර විට උදම් අනනවා විය හැක. අන්‍යාගමිකයෝ මිථ්‍යා දෘෂ්ටිකයින් යැයි සිතනවා, පවසනවා විය හැක. නමුත් අප නියම බෞද්ධයකු වශයෙන් මේ ලැබූ අවස්ථාවෙන් ප්‍රයෝජනයක් ලබා ගන්නේද යන්න නැවත නුවණින් සලකා බැලීම මේ මොහොතේ සිට හෝ අප්‍රමාද වීමට හේතු විය හැක.

''**දුර්ලභං මනුස්ස ජීවිතං - දුරලභෙන ක්ෂණ සම්පත්ති**'' යනුවෙන් බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කොට ඇත. මෙයින් මනුෂ්‍ය ජීවිතයක් ලබා ගැනීම කෙතරම් දුර්ලභ කරුණක්ද යන්න දැක්වීමට බුදුරජාණන් වහන්සේ දක්වන ලද උපමාව කන කැස්බෑවෙකු විය සිදුරෙන් අහස දකින්නාක් මෙනි යන්නයි. සමහර විට බුදු කෙනෙකුන් පහළ නොවී කල්ප ගණනක් ගතවන බවත්, ලෝකයේ බුදු දහම පවතින කාලයක මනුෂ්‍යයෙකු ලෙස උපත ලැබීම එයටත් වඩා දුර්ලභ කරුණක් වන බවයි. මනස උසස් මනුෂ්‍යයෙකු ලෙස උපත ලබා මේ මහා සසර දුකින් මිදීම පිළිබඳව ධර්මයක් අසන්නට ලැබීම ඉතා දුර්ලභ කරුණක් වන ක්ෂණ සම්පත්තියයි. මේ දුර්ලභ වූ කරුණු සම්පූර්ණ කිරීමට අප සැවොම පුණ්‍යවන්ත සහ භාග්‍යවන්ත වී ඇත. නමුත් ඒ ලැබුණු අවස්ථාවෙන් අප මේ වන විට කොපමණ ප්‍රයෝජනයක් ලබා ඇත්ද? එම වටිනා ජීවිතයේ කොපමණක් දැනට ගෙවී ඇත්ද? මෙය කියවන ඔබ සමහර විට මැදිවියේ පසුවන්නකු විය හැකියි. අද මනුෂ්‍ය ආයුෂ සමග බලන විට සමහර විට ඔබට තව වසර 20ක් පමණ ජීවත් විය හැකි යයි අනුමාන කළ හැක. ඔබ පොහොය දවසට පමණක් නොවරදවා ධර්මයේ හැසිරුනහොත් එය වසරකට දින 12කි. ජීවිත කාලයටම 12 x 20 = දින 240කි. එම දිනද ඔබ අවංකව නිවැරදි ලෙස ධර්මය අසන්නේ හෝ හැසිරෙන්නේ පැය 4ක පමණ කාලයක් විය හැක. එසේ වන්නේ සිල් සමාදන් වී සිටියත් පන්සලේ ගත කරන පැය 8ක පමණ කාලයෙන් වැඩි හරියක් දානමාන කටයුතු, පූජා හෝ කථා කිරීම් ආදී වෙනත් කටයුතු වලට වැය වන බැවිනි. එවිට දින 240න් ධර්මයේ හැසිරී ඇති දින ගණන (240 x 4/24 = දින 40) දින 40කි. එනම් තව අවුරුදු 20ක් ජීවත් වුවහොත් ධර්මයේ

හැසිරීමට ඒ මුළු කාලය තුළ යොදවන්නේ තවත් දින 40ක් වැනි සුළු කාලයකි. එනම් මාස දෙකකටත් වඩා අඩු කාලයකි. මෙයද සිදුවන්නේ නොවරදවාම සෑම පුන්පොහෝ දිනයකම සිල් සමාදන් වුවහොත් පමණි. අසනීපයක් වුවහොත්, මඟුල් අවමඟුල් හෝ වෙනත් වැදගත් යයි සිතන කරුණු නිසා දින කීයක් මගහැරිය හැකිද? ඉතා වයසට ගිය විට, වෙනත් දීර්ඝ කාලීන අපහසුතා ඇති අසනීපයක් වූ විට (තමන්ට හෝ තමන් ඇලුම් කරන කෙනෙකුට) මේ අවස්ථාව ලැබේද? අද මිය යන අය දකින විට තමන් අනිවාර්යයෙන්ම තව වසර 20ක් ජීවත් වේද? වසර 10ක් ජීවත් වුවහොත් මෙය දින 20ක් වේ. ඔබ මේ ගැන නුවණින් සිතා නොබැලුවහොත් අද ගත කරන ජීවිතයට අනුව සිදුවන සත්‍ය තත්වය මෙයයි. ඊළඟ ජීවිතයෙහි නැවත මේ ලැබුණු දුර්ලභ අවස්ථා දෙක ලැබේ යයි සිතීම බුදු වදන අනුව කොතරම් සාධාරණදැයි සිතා බලන්න.

ඔබට මේ සඳහා වෙලාව නැත්තේ ඇයි! ඔබ දැනට යෙදෙන වැඩකටයුතු, වගකීම්, යුතුකම් නිසයි. ඒවා පංචකාම සම්පත්ති ලැබීම, දෙමාපිය අඹුදරුවන් සඳහා, ගේදොර, භවභෝග සම්පත් ලබා ගැනීම, ආරක්‍ෂා කිරීම, වැඩිදියුණු කිරීම, සමාජ සේවය සඳහා විය හැකියි. මේවායේ නිවැරදි ලෙස යෙදීම පව් යයි බුදුරජාණන් වහන්සේ දේශනා කොට නැත. සමහර විට ඒවා පිං විය හැක. හොඳ ප්‍රතිඵල ලැබිය හැක. නමුත් එයින් ලැබෙන නිවනක් (දුකින් මිදීමක්) නම් නොමැති බව බුදුන් වහන්සේ ඉතා පැහැදිළිව දේශනා කොට ඇත. එසේ නම් මේ ලැබුණු ක්‍ෂණ සම්පත්තියෙන්, අසන්නට ලැබුණු දුර්ලභ වූ බුදු දහමෙන් ප්‍රයෝජනය ගන්නා කෙනෙක් ලෙස, නියම බෞද්ධයෙක් ලෙස ඔබ හඳුන්වා ගැනීම සුදුසුද?

බුදු දහම ප්‍රඥාවන්තයන්ට යයි බුදුන් වහන්සේ දේශනා කළ සේක. තමන් මෙතෙක් බුදු දහම පිළිබඳව දන්නා දේ නිවැරදි නම් අඩුගණනේ සෝවාන් මාර්ගයේ වත් සිටින අප්‍රමාද වූවකු විය යුතුයි. එසේ නොමැති නම් ඒ සඳහා නුවණින් විමසන්නෙකුට මෙහි සාකච්ඡා වන ධර්මය යම් පිටුවහලක් වේයැයි යන අදහසින් මේ පොත් පිංච මුද්‍රණද්වාරයෙන් එළි දක්වීමට අදහස් කරන ලදී. මෙහි දක්වෙන සියලුම අදහස් මා බුදු දහම විමසීමේදී ඇති වූ අදහස් මිස, එහි යම් අඩුපාඩුවක් වරදක් වෙතොත් එය මාගේම මිස මා ඇසුරු කළ, ඇසුරු කරන

කළ්‍යාණ මිත්‍රයන් වහන්සේලාගේ අදහස් නොවන බවත් කාරුණිකව සිහිපත් කරමි.

බුදු දහම මේ ජීවිතයේදීම පසක් කළ යුතු, කළ හැකි දෙයක් බව පෙන්වා දී ඒ සඳහා මා මූලිකව යොමුකළ අපවත්වී වදාළ පූජ්‍ය අමත ගවේසී හිමියන්ට මේ පින් අනුමෝදන් වේවා. මෙතෙක් මා ඇසුරු කළ අපවත් වී වදාළ අනෙකුත් කළ්‍යාණ මිත්‍රයන් වහන්සේලාටද මේ පින් අනුමෝදන් වේවා. දැනට ජීවතුන් අතර සිටින මා ඉතා ධර්ම ගෞරවයෙන් ඇසුරු කරන පූජ්‍ය කටුකුරුන්දේ ඥාණානන්ද හිමි, මාන්කඩවල සුදස්සන හිමි, පිටිගල ගුණරතන හිමි මෙන්ම විදේශ රටවල සිටින හේනේපොල ගුණරතන හිමි, අජාන් බ්‍රහ්මවංසෝ, අජාන් කළ්‍යානො හිමි ඇතුලු මෙහි නම් සඳහන් නොකළ, මෙතෙක් මා ලැබූ ධර්මාවබෝධයට උපකාරී වූ සියලුම කළ්‍යාණ මිත්‍රයන් වහන්සේලාටද මේ පින් අනුමෝදන් වේවා. එමෙන්ම මා සමග ධර්ම සාකච්ඡා වල යෙදුණු සියලුම ගිහි පැවිදි පිංවතුන්ටත්, භාවනා වැඩසටහන් වලට සහභාගී වූ සියලුම පිංවතුන්ටත් මේ පින් අනුමෝදන් වේවා. විශේෂයෙන් දැනට ජීවතුන් අතර නොසිටින මා මෙලොවට බිහිකළ දයාබර මෑණියන් වහන්සේටත්, අනෙකුත් මියගිය සහෝදර, ඥාති සමූහයාටත් මේ පින් අනුමෝදන් වේවා. සතුටට පත්වේවා. උතුම් ධර්මාවබෝධය පිණිසම හේතු වාසනා වේවා. සසර සත්‍ය මේ යැයි දැක්මට යන ගමනේදී නොයෙකුත් ආකාරයෙන් උපකාරී වූ මාගේ පියාණන්ටත්, සහෝදර සහෝදරියන්ටත්, අනෙකුත් සියලුම දෙනාටත් මේ පින් අනුමෝදන් වී සසර දුකින් ගැලවෙන ධර්ම මාර්ගයට වැටීම සඳහාම මේ පින් අනුමෝදන් වේවා.

මෙය මුද්‍රණය සඳහා මූලික අඩිතාලම වන පරිඝණක ගත කිරීමේ කටයුතු මහත් වෙහෙසක් දරා ඉටුකළ දිල්රුක්ෂි වීරරත්න මහත්මියටත්, පිටකවරය නිර්මාණය කර දුන් මොරටුව විශ්වවිද්‍යාලයේ ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කිත්සිරි සමරසිංහ මහතාටත්, මෙය නොමිලේ බෙදාහැරීම සඳහා මූල්‍යමය වශයෙන් දායකවූ සුභද්‍රාරාමයේ භාවනා වැඩසටහනට සහභාගී වන අයටත්, CECB ආයතනයේ සභාපති නිහාල් රූපසිංහ මහතාට, සුධර්මා රූපසිංහ මහත්මිය, සහ දරු දෙදෙනාටත්, මනා නිමාවකින් මුද්‍රණය කර දුන්

මුද්‍රණාලාධිපති ඇතුලු සේවක මණ්ඩලයටත් මේ පින් අනුමෝදන් වේවා, උතුම් ධර්මාවබෝධය පිණිසම හේතුවාසනා වේවා.

මෙහි සඳහන් කරුණු වෙනස් නොකරමින්, ඕනෑම අයෙකුට තමන් කැමති පුණ්‍යානුමෝදනාවක් සහිතව මෙම පොත නැවත මුද්‍රණය කොට නොමිලේ බෙදා හැරීමට අවස්ථාව ඇත. මෙම පොත සහ අනෙකුත් ධර්ම පොත් නොමිලේ බෙදාහැරීමට මුද්‍රණය සඳහා දායක වීමට කැමති පින්වතුන් විමසීම් සඳහා අමතන්න;


රවින්ද්‍ර කොග්ගලගේ

Email: koggalage@yahoo.com
Web: http://ravi.harimaga.com
Mobile : 0777234239

2013 අගෝස්තු 10 වැනි දින සුභද්‍රාරාමයේදී
මහාචාර්ය රවී කොග්ගලගේ මහතා විසින් පැවැත්වුන ධර්ම සාකච්ඡාව

# පටිච්ච සමුප්පාදය

---

පටිච්ච සමුප්පාදය කියල මොන ප්‍රශ්ණය ඇහුවත් කමක් නැහැ, මොකද පටිච්ච සමුප්පාදය තේරුම් ගත්ත දවසට ධර්මය දැක්කා වෙනවා. පටිච්ච සමුප්පාදය දැකලා නැති තරමට හැමදාම ප්‍රශ්න කරන්නත් වෙනවා - ධර්මය දැකලා නැහැ. පටිච්ච සමුප්පාදය කියන්නේ මොකක්ද කියන තැනින් පටන් ගන්න ඕනේ. තමුන් පටිච්ච සමුප්පාදය කියලා හිතාගෙන ඉන්නේ මොකක්ද? බොහෝ ධර්ම පොත්වල පටිච්ච සමුප්පාදය තියෙනවා - ඒ කොහොමද? **අවිජ්ජාපච්චයා සංඛාරා, සංඛාරපච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණපච්චයා නාමරූපං, නාමරූපපච්චයා සළායතනං, සළායතනපච්චයා ඵස්සො, ඵස්සපච්චයා වෙදනා, වෙදනාපච්චයා තණ්හා, තණ්හාපච්චයා උපාදානං, උපාදානපච්චයා භවො, භවපච්චයා ජාති, ජාතිපච්චයා ජරාමරණංසොකපරිදෙවදුක්ඛ දොමනස්සුපායාසා සම්භවන්ති.** සම්භවන්ති කියන්නේ ඇති වෙනවා. **එවමෙතස්ස කෙවලස්ස දුක්ඛඛන්දස්ස සමුදයො හොති.** සමුදය කියන්නේ හේතුව - මොනවා හටගන්න හේතුවද? **දුක්ඛකන්දස්ස** - දුක් කන්දරාව හටගන්න හේතු. පටිච්ච සමුප්පාදයේ එක පැත්තක් ඕතන තියෙනවා. ඒකට අපි කියනවා පච්චයා, එහෙම නැත්නම් හටගන්න ස්වභාවය.

ඊළඟට පටිච්ච සමුප්පාදයේ තව පැත්තකුත් පෙන්නනවා - නිරෝධා කියන එක - නැතිවෙන ස්වභාවය - හට නොගන්න ස්වභාවය. **අවිජ්ජායත්වෙව අසෙස විරාග නිරොධා සංඛාර නිරොධො, සංඛාර නිරොධා විඤ්ඤාණ නිරොධො, විඤ්ඤාණ නිරොධා නාමරූප නිරොධො, නාමරූප නිරොධා සළායතන නිරොධො, සළායතන නිරොධා ඵස්ස නිරොධො, ඵස්ස නිරොධා වෙදනා නිරොධො, වෙදනා නිරොධා තණ්හා නිරොධො, තණ්හා නිරොධා උපාදාන නිරොධො, උපාදාන නිරොධා භව නිරොධො, භව නිරොධා ජාති නිරොධො, ජාති නිරොධා ජරාමරණංසොකපරිදෙවදුක්ඛ දොමනස්සුපායාසා නිරුජ්ඣන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛඛන්ධස්ස නිරොධො හොති.** මේ කියන විදියට දුක් කන්දරාව නිරෝධ වෙන හැටි පෙන්නනවා. නිරෝධ

ධර්මතාවය පෙන්වන එක පටිච්ච සමුප්පාදයේ තව පැත්තක්. **පච්චයා** කියන එක එක පැත්තක්, **නිරෝධා** කියලා පෙන්වන එක අනික් පැත්ත. **පච්චයා** කියලා හටගන්න ස්වභාවය පෙන්වන එකට කියනවා අනුලෝම පටිච්ච සමුප්පාදය කියලා. **නිරෝධා** කියලා නිරුද්ධ වීම පෙන්වන එකට කියනවා පටිච්ච සමුප්පාදයේ පටිලෝම (ප්‍රතිලෝම) පැත්ත. සමහරු හිතනවා මුල සිට අගට කියනකොට අනුලෝම, අග ඉඳන් මුලට කියනකොට පටිලෝම කියලා. නමුත් මේක එහෙම එකක් නෙවෙයි. එහෙම හිතාගෙන ඉන්නවා නම් ඒක හදාගන්න. අනුලෝම කියන්නේ **පච්චයා** - හේතුන්ගෙන් මෙහෙම හටගන්නවා. පටිලෝම කියන්නේ **නිරෝධ** පැත්ත. මේ හේතුප්‍රත්‍ය නැත්නම් හටගන්නේ නැහැ. නිරෝධා කියලා කියන්නේ ඒ ටික. මේ වචන දෙක තමයි පටිච්ච සමුප්පාදයේ වැදගත්ම වචන දෙක - '**පච්චයා**' කියන එක හටගන්න ස්වභාවය පෙන්නනවා, '**නිරෝධා**' කියන එක හට නොගන්න ස්වභාවය පෙන්නනවා. දුක හටගන්න හැටි පෙන්වන එක '**පච්චයා**'. මේ හේතුන් යෙදෙන කොට දුක තියෙනවා. දුක හටනොගන්න ස්වභාවය පෙන්වන එක **නිරෝධා** - මේ හේතු නිරෝධයි නම් දුක නිරෝධයි. දුක හටගන්නේ නැහැ. ප්‍රතිලෝමය.

මේවා මුලින් තේරුම් කරගන්න ඕනේ පටිච්ච සමුප්පාදය හොයන්න කලින්. **පච්චයා** කියන එක තව ටිකක් තේරුම් ගන්න ඕනේ. මේ හේතු තියෙනවා නම් මේ ඵලය තියෙනවා. මෙහෙම කියන කොටත් තේරුම් ගන්න දෙයක් තියෙනවා. අපිට හිතෙන්නේ හේතුන් ටික මුලින් ඇතිවෙන්න ඕනේ, ඊට පස්සේ තමයි ඵලය හටගන්නේ කියලා. එහෙම අදහසක් එන්න පුළුවන්. හේතුන් ටික වැය වෙලා තමයි ඵලය හටගන්නේ කියලා. නමුත් පච්චයා කියන එකේ ඊට වඩා වෙනස් තේරුමක් තියෙනවා. පච්චයා කියන එක පාළියෙන් **ඉමස්මිං සති ඉදං හොති ඉමස්ස උප්පාදා ඉදං උප්පජ්ජති** කියලා දෙවිදියකට විස්තර කරනවා. **ඉමස්මිං සති** මේ දෙය තියෙනවා නම්, **ඉදං හොති** මෙය තියෙනවා. ඔය කියන්නේ හේතුවයි ඵලයයි ගැන. හේතුව තියෙනා කොට ඵලය තියෙනවා කියන එක. නැතුව හේතුව හටගෙන ඉවර වෙලා, හේතුව නැති වුනාට පසුව (හේතු වැය වෙලා) ඵලයක් හටගන්න කථාවක් නෙවෙයි. නමුත් මේ ටික උදව් වෙලා තියෙනවා ඵලය හටගන්න. ආධාර වෙනවා කියන එකෙයි, මේ ටික වැය වෙලා අළුත්

දෙයක් හටගත්තා කියන එකයි වෙනස් කථා දෙකක්. මේ ටික වැය වෙලා අළුත් දෙයක් හටගත්තා නම් අපි අළුත් දෙය ගැන කථා කරන කොට අර හේතු ටික තියෙන්න පුළුවන්ද? නැහැ, ඒ ටික වැය වෙලා ඉවරනේ. එතකොට ඵලය විතරක් තනියෙන් තියෙනවා. දන් හේතු නැහැ, ඵලය විතරයි. එහෙම නැත්නම් හේතු ටික කථා කරන කොට ඵලය තවම ඇතිවෙලා නැහැ. එහෙම අදහසක් එන්න පුලුවන්. ඒක නෙවෙයි පටිච්ච සමුප්පාදය. පටිච්ච සමුප්පාදය කියන්නේ මේ හේතු තියෙන කොට ඵලයත් තියෙනවා, හේතුත් තියෙනවා. ඵලයයි හේතුයි දෙකම තියෙනවා. අමුතු කථාවක් කියන්නේ. හේතු ඉවරවෙලා ඵලය ලැබුනා නෙවෙයි. මේක හොඳට පැහැදිළිව තේරුම් ගන්න.

ඒකට උපමාවක් ගත්තොත් - දැල්ලක් පත්තු වෙන කොට ඒකේ පාටක්, එළියක්, රස්නය ආදී දැල්ලට අදාළ දේ තියෙනවා. දන් පාට ඉවරවෙලාද එළිය එන්නේ? නැහැ. සියල්ලම එකට පවතින්නේ. **ඉමස්මිං සති ඉදං හොති** - **ඉමස්මිං** කියන්නේ හේතු වලට. **ඉදං** කියන්නේ ඵලයට. එතකොට හේතු තියෙන කොට ඵලයත් තියෙනවා. ඒ කියන්නේ විද්‍යමාන වෙනවා. අපට විද්‍යමාන වෙන ස්වභාවයක්නේ ඔය කියන්නේ. හේතු තියෙනවා කියලා අපිට පෙනෙනවා, නැත්නම් හිතෙනවා. එහෙම හිතෙන කොට ඵලයත් තියෙනවා කියලා හිතෙනවා - විද්‍යමාන වෙනවා. ඒකෙන් කියන්නේ නැහැ හේතුව ඉවර වෙලා ඵලය වෙනම තියෙනවා කියලා. ඵලයක් තියෙන්න බැහැ හේතුන්ගෙන් තොරව.

මේකට ලස්සන උපමාවක් දීලා තියෙනවා සැරියුත් හාමුදුරුවොයි කොට්ඨිත හාමුදුරුවොයි කථා කරන විට, බට මිටි දෙකේ උපමාව. බට මිටි දෙකක් එකකට එකක් හේත්තු කළ විට කෙලින් තියන්න පුළුවන් නේද? එයින් එකක් අයින් කළොත් අනිත් එකට තනිව තියෙන්න පුළුවන්ද? බැහැ. මේ වගේ තමයි හේතු පැත්තයි (මිටියයි), ඵලය පැත්තයි (මිටියයි). ඵලයට තනියම ඉන්න බැහැ හේතු නැතුව. හේතුවට තනියම ඉන්න බැහැ ඵලය නැතුව. බට මිටි දෙකම එක මොහොතේ තියෙන්නේ. හේතු විද්‍යමාන වෙන මොහොතේම ඵලයත් විද්‍යමාන වෙනවා කියලා ගන්න. එහෙම කිව්වහම කාට හරි ඵලය විතරක් පෙනෙන්න පුළුවන්ද හේතු නැතුව? බැහැ. ඵලයට පවතින්න බැහැ හේතුන්ගෙන් තොරව. හේතුන් ටිකට පවතින්නත් බැහැ ඵලයෙන් තොරව. මේක අන්‍යොන්‍ය

සම්බන්ධතාවයක්, එකකට එකක් උපකාරී වෙනවා. අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍ය කියලත් කියනවා. එකකට එකක් ප්‍රත්‍ය වෙනවා. ඒක පච්චයා කියන එකේ එක ලක්‍ෂණයක්.

තව ලක්‍ෂණයක් තමයි **ඉමස්ස උප්පාදා** - මේ පැත්ත උත්පාදනය වුනොත් - **ඉදං උප්පජ්ජති** - මේ පැත්තත් උත්පාදනය වෙනවා. මුලින් මුකුත් විද්‍යමාන නැහැ. එක පාරටම මේ පැත්ත විද්‍යමාන වෙන කොටම මේ පැත්තත් විද්‍යමානයි. **ඉමස්ස උප්පාදා ඉදං උප්පජ්ජති**. ඒකෙත් හිතන්න එපා එක පැත්තක් ඉස්සෙල්ලා හටගෙන අනිත් පැත්ත හටගන්නවා නෙවෙයි. ඔය දෙකම එකවර - මේ දෙය හටගත්තොත් මේ දෙයත් හටගෙන. හේතුව ඵලයට උපකාරවීමක් තියෙනවා. ඉස්සෙල්ලා පස්සේ කථාවක් නැහැ. පච්චයා කියන කොට එකටම විද්‍යමාන වෙනවා. මේක කාල පරතරයකට දමන්න යන්න එපා. හේතුන්ගෙන් තත්පරයකට පස්සේ ඵලය හටගන්නේ කිව්වොත්, තත්පරය ගතවෙන්න කලින් හේතු විතරයි විද්‍යමාන වෙන්නේ. තත්පරයෙන් පසුව ඵලය විතරයි විද්‍යමාන වෙන්නේ ඇයි හේතු ටික වැයවෙලා නේ. එහෙම නෙවෙයි. ඔය දෙකම එකට විද්‍යමාන වෙන්නේ - **ඉමස්මිං සති ඉදං හොති** - මේ දෙය (හේතුව) තියෙනවා නම් ඵලයත් තියෙනවා. නැතුව හේතුව ඉවර වෙලා ඵලයක් ගැන කථා කරන්න බැහැ. මෙයින් තේරුම් ගන්න ඵලය ගැන කථා කරනවා නම් හේතු සම්බන්ධ කරලාමයි කථා කරන්න ඕනේ. හේතුන්ගෙන් තොරව ඵලයට පැවැත්මක් නැහැ. ඵලයට තනියෙන් පැවතීමේ හැකියාවක් නැහැ. හේතු එක්කමයි ඵලය විද්‍යමාන වෙන්නේ. ඵලය විද්‍යමාන වෙන්න හේතු ටික යෙදෙන කොට විතරමයි ඵලය විද්‍යමාන වෙන්නේ. හේතු ටික නැත්නම් ඵලය විතරක් ඉතුරු කරගන්න බැහැ. තව විදියකට කියනවා නම් ඒ දෙක වෙන් කරන්න බැහැ. පච්චයා කියන එකේ වෙන් කරන්න බැහැ කියන අදහසත් තියෙනවා. මේකට කාල පරතරයක් දැම්මොත් පටලවා ගන්නවා. මොකද හේතුන් තියෙන කොට තවම ඵලය ඇතිවෙලා නැහැනේ. තනියෙන් පවතින්න බැහැ කියන එකමයි මේ හේතුඵල වාදය කියන්නේ. කිසිම දෙයකට අනිත් ඒවායේ උපකාරයක් නැතුව වෙනම පවතින්න බැහැ. හේතුන් නිසාමයි මේ ඵලය තියෙන්නේ. හේතුන් නැතුව ඵලයක් ගැන කථා කරන්න බැහැ.

'**සමුප්පාද**' කියන්නේ උත්පාදනය වෙනවා. හේතුන් නිසා

උත්පාදනය වෙනවා යම්කිසි ස්වභාවයක් - පෙන්නුම් කරනවා. එයින්මයි පැන නගින්නේ. වෙන කිසිම බාහිරයකින් නෙවෙයි. හේතූන් නැතුව හටගන්න පුළුවන් දෙයකුත් නෙවෙයි. එයින්ම උපදින කියන එක තමයි පටිච්ච සමුප්පන්න කියන්නේ. තියෙන දේවල් වලින්ම විද්‍යමාන වෙන ස්වභාවයකට කියනවා පටිච්ච සමුප්පන්න කියල. තියෙන දේවල් වලින්ම විද්‍යමාන වෙනවා නම් තියෙන දේවල් වලින් තොරව අපිට ඒක ගැන කථා කරන්න පුළුවන්ද? බැහැ. **ඉමස්මිං සති ඉදං හොති.** උපදිනවා කිව්වහම තේරුම් ගන්න එයින්ම තව පෙන්නුම් කරන ස්වභාවයක්. ඒ දෙය නැතුව ඒක පෙන්නුම් කරන්නේ නැහැ. පටිච්ච සමුප්පන්න කියන්නේ ඒ වගේ ධර්මතාවයක්. පටිච්ච කියන්නේ 'නිසා' - ආධාරක ධර්ම නිසා තමයි උත්පාදනය වෙන්නේ. ආධාර, ප්‍රත්‍ය වන ධර්ම නැත්නම් උත්පාදනයක්, පෙන්නුම් කිරීමක් නැහැ.

අපි පටිච්ච සමුප්පන්න කියන එක තේරුම් ගත්තොත් - පටිච්ච සමුප්පන්න ධර්මතා තියෙනවා. ඒවා තමයි මුලින් කිව්වේ - අවිද්‍යාව, සංඛාරය, විඤ්ඤාණය, නාමරූප, සළායතන, ඵස්ස, වේදනා, තණ්හා, උපාදාන, භව, ජාති, දුක - මේ **සියල්ලම පටිච්ච සමුප්පන්න වුන ධර්මතා මිසක්, පටිච්ච සමුප්පාදය නෙවෙයි**. තව විදියකට කිව්වොත් පටිච්ච සමුප්පන්නව විද්‍යමාන වන ධර්මතා. පටිච්ච සමුප්පාදය කියන්නේ අවිද්‍යාව වත්, සංඛාර වත්, විඤ්ඤාණය වත් කියන ඒවා ටික නෙවෙයි. පටිච්ච සමුප්පන්න කියන කොට තේරුම් ගන්න ඕනේ මොකක්ද? ඒ එකක්වත් තනිව පවතින්න බැහැ. උදාහරණයක් වශයෙන් සංඛාරය ගැන කථා කරනවා නම් සංඛාරය වෙන් කරලා කථා කරන්න බැහැ - මොකද ඒක පටිච්ච සමුප්පන්නයි. ඒකට ආධාර වුන, ප්‍රත්‍ය වුන ධර්මතා ටිකත් එක්කමයි සංඛාරය පවතින්නේ. සංඛාරය කියන එක වෙනම වෙන් කරලා ගන්න බැහැ. පහන් දැල්ලේ පාටක් තියෙනවා, පාට පටිච්ච සමුප්පන්නයි කියන්නේ පාට වෙන් කරලා දැල්ලෙන් පැත්තකට අරන් පෙන්වන්න බැහැ. ඒකට ප්‍රත්‍ය වන අනික් ධර්මතා එක්කමයි ඒ පාට ගැන කථාකරන්න පුළුවන්. දැල්ලෙන් තොරව පාට ගැන කථා කරන්න බැහැ. ඒ වගේ දෙයක් ඔය පටිච්ච සමුප්පන්න කියන එක. එතනින් තේරුම් ගන්න අර ධර්මතා ටික ඔක්කොම පටිච්ච සමුප්පන්නයි. වෙනම පවතින්න බැහැ. විඤ්ඤාණය පටිච්ච සමුප්පාදයද පටිච්ච සමුප්පන්න ධර්මතාවයක්ද? පටිච්ච සමුප්පන්න ධර්මතාවයක්. එතකොට විඤ්ඤාණය

අනිත් ඒවාගෙන් තොරව පවතින්න පුළුවන්ද? බැහැ. විඤ්ඤාණයක් ගැන කථා කරන්න බැහැ විඤ්ඤාණයට ආධාර වන ධර්ම ටික නැතුව. **ඉමස්මිං සති ඉදං හොති. ඉමස්ස උප්පාදා ඉදං උප්පජ්ජති** - කියන එකෙන් ඕක තේරුම් ගන්න ඕනේ. එතකොට භවයෙන් භවයට යන විඤ්ඤාණයක් ගැන කථා කරන්න බැහැ. ඇයි ඒ? විඤ්ඤාණය පටිච්ච සමුප්පන්න ධර්මතාවයක් නිසා.

උදාහරණයක් වශයෙන් එක පහනකින් තවත් පහනක් පත්තු කළොත් පළමු පහනෙන් අනිත් පහනට ආපු දැල්ලක් නැහැ. දෙවෙනි පහනෙත් පාට, ආලෝකය ආදී දේවල් පටිච්ච සමුප්පන්නයි. පහන් දෙකේ සම්බන්ධයක් නැහැ. පටිච්ච කියන කොට තේරුම් ගන්න ඕනේ හේතු ප්‍රත්‍ය එක්කමයි අපිට ඵලය ගැන කථා කරන්න පුළුවන්. හේතු ප්‍රත්‍යයන් ගෙන් තොරව ඵලය වෙන් කරලා කථා කරන්න පුළුවන්කමක් නැහැ. විඤ්ඤාණයට තනිව පවතින්න පුළුවන්කමක් ඇත්තේම නැහැ. විඤ්ඤාණයක් ගැන කථා කරනවා නම් එයට ආධාර වන, ප්‍රත්‍ය වන ධර්ම එක්ක මයි කථා කරන්න තියෙන්නේ. විඤ්ඤාණය කියන්නේ හිතම තමයි. එතකොට හිතත් පටිච්ච සමුප්පන්නයි කියන එක තේරුම් ගන්න. චිත්ත නියාමයේ ඕක තමයි තියෙන්නේ.

සළායතනත් පටිච්ච සමුප්පන්න ධර්මතාවයක්. එතකොට ඇහැ කියන්නේ සළායතනයෙන් එකක්, ඇහැත් පටිච්ච සමුප්පන්නයි. එතකොට ඇහැක් තියෙනවා කියලා වෙනම කථා කරන්න පුළුවන්ද ඒකට හේතු ප්‍රත්‍ය වන ධර්මතා වලින් තොරව? කථා කරන්න පුළුවන් නමුත් ඒ කථා කරන කෙනා පටිච්ච සමුප්පාදය අවබෝධ කරලා නම් නැහැ. සළායතනය පටිච්ච සමුප්පන්න නම් සළායතනය වෙන් කරලා පවතිනවා කියලා වෙනම කථා කරන්න පුළුවන් කමක් නැහැ. ඕකයි පටිච්ච සමුප්පාදය දකිනවා කියන්නේ. ඔබට ඇහැක් තියෙනවා කියලා හිතුනොත් - සම්මතයට ඇස් දෙකක් තියෙනවා. ඒ ලෝකයාගේ දැක්ම. එතන පටිච්ච සමුප්පාදය දැකලා නෙවෙයි. එතනදී ඇස් දෙක ගැන වෙනම කථා කරන්න පුළුවන් වෙන කිසිම හේතු ප්‍රත්‍යයක් නැතුව. ඒක ලෝකයට අයිති දැක්ම. අපි කථා කරන්නේ ලෝකෝත්තර දැක්මක්, ලෝකය ඉක්මවා ගිය දැක්මක්. ඒ දැක්ම ගන්න නම් පටිච්ච සමුප්පන්න බව දකින්න ඕනේ. පටිච්ච සමුප්පාදය දකින්න ඕනේ. කෙනෙක් පටිච්ච

සමුප්පාදය දැක්කා නම් තමයි ධර්මය දැක්කා වෙන්නේ. පටිච්ච සමුප්පාදය දැක්කේ නැත්නම් ධර්මය දැක්කේ නැහැ. යම් දෙයක් පවතිනවා කිව්වොත් ඊයෙත් තිබුණා, අදත් තියෙනවා, හෙටත් තියෙනවා - ඔය පටිච්ච සමුප්පන්න භාවයක් දැකලා නෙවෙයි. යම් දෙයක් වෙනම පවතින්න පුළුවන් කිව්වොත් ඒක පටිච්ච සමුප්පන්න නෙවෙයි. පටිච්ච සමුප්පන්න නම් අපිට කියන්න තියෙන්නේ මේ හේතු ප්‍රත්‍යයන් යෙදෙන කොට විතරයි ඒක තියෙන්නේ. හේතු ප්‍රත්‍ය නැත්නම් නැහැ. ඒ පැත්ත තමයි නිරෝධා කියන්නේ. පටිච්ච සමුප්පාදයේ දකින්න ඕනේ දෙය තමයි නිරෝධා කියන එක. **ඉමස්මිං අසති** - මේ දෙය නැත්නම් - **ඉදං න හොති** - මේ දෙය නැහැ. ඔය ස්වභාවයට කියනවා නිරුද්ධයි කියලා. ඉපදිලා නැහැ. තව විදියකට කිව්වොත් හේතු ටික පෙන්නුම් කරන්නේ නැත්නම් ඵලය පෙන්නුම් කරන්න විදියකුත් නැහැ.

ඔය නිරුද්ධා කියන එකේ එක පැහැදිලි කිරීමක්. අනිත් පැහැදිලි කිරීම තමයි මේ දෙය නිරුද්ධ නම් - හේතු ටික නිරුද්ධයි, හටගෙන නැහැ. **ඉමස්ස නිරොධා ඉදං නිරුජ්ඣති** - මේ දෙය හටගෙන නැත්නම් මේ දෙයත් හටගෙන නැහැ. අපිට විද්‍යමාන වෙන හේතුයි ඵලයි තියෙනවා කියලා හිතන්න. **ඉමස්ස නිරොධා** මේ පැත්ත පෙනෙන්නේ නැති වුනොත් මේ පැත්තත් පෙනෙන්නේ නැති වෙන්න ඕනේ. ඒකටත් කාල පරතරයක් දෙන්න එපා. හේතු ඉස්සෙල්ලා නිරුද්ධ වෙලා ඵලය පසුව නිරුද්ධ වෙනවා නෙවෙයි. දැල්ල නිවුනොත් පාටත් නැහැ, ආලෝකයත් නැහැ. එකකට පස්සේ එකක් නිරුද්ධ වෙනවා නෙවෙයි. ඒ දෙකම එක මොහොතේ නිරුද්ධ වෙනවා. හේතු පැත්ත නිරුද්ධ නම් ඵල පැත්තත් නිරුද්ධයි. බට මිටි දෙක කඩන් වැටෙනවා වගේ. එක පැත්තක් වැටුන ගමන් අනිත් පැත්ත පහුවෙලා වැටෙනවා නෙවෙයි, එක සැරේ කඩන් වැටෙන්නේ. ඕක හොඳට තේරුම් අරගෙන තමයි පටිච්ච සමුප්පන්න ධර්ම වලට යොදලා බලන්න ඕනේ. පටිච්ච කියන එකයි, නිරුද්ධ කියන එකයි හොඳ අවබෝධයකින් දැකලා කථා කරන්න ඕනේ. කාල පරතරයට දමලා බලන්න ගියොත් නම් පටිච්ච සමුප්පාදය තේරුම් ගන්න බොහොම අපහසු වෙනවා. ඵලය විද්‍යමාන වෙනවා නම් හේතු තියෙන තැනමයි ඵලය විද්‍යමාන වෙන්නේ. හේතු ටික පෙනෙනවා නම් ඵලයත් එතනම තියෙන්න ඕනේ, අපට නොපෙනුනත් එතනම තියෙන්න ඕනේ. හාල් ලිපේ තියලා බත් වෙනවා වගේ වැඩක් නෙවෙයි මේක.

හාල් හේතුවෙන් බත් හටගන්නවා කියන එක පටිච්ච සමුප්පාදය නෙවෙයි. ඵලය ගැන කථා කරන කොට ඒකේ හේතු ටිකත් දකින්න පුළුවන් වෙන්න ඕනේ. එක මොහොතේදීම විද්‍යමාන කිව්වත් හරි. බට මිටි දෙක හේත්තු කරලා තියෙන කොට ඒ දෙපැත්තම විද්‍යමාන වෙනවා. පටිච්ච සමුප්පාද සම්බන්ධයේදී එකකින් තොරව අනිත් එක ගැන කථා කරන්න බැහැ. හේතු ප්‍රත්‍ය නැතුව ඵල ගැන කථා කරන්න බැහැ. අපි ඵලය ගැන විතරක් කථා කරනවා නම් මතක තියාගන්න පටිච්ච සමුප්පාදය දැකලා නැහැ. එයින්ම පැන නගින ස්වභාවයක් - **තජ්ජෝ සමන්නාගත**. ඵලය වෙන් කරලා ගන්න බැහැ. අපි හැම තිස්සේම හදන්නේ ඵලය වෙන් කරලා ගන්න.

අනිත්‍ය, දුක්ඛ කියන්නේ පටිච්ච සමුප්පාදය නෙවෙයි, පටිච්ච සමුප්පන්න වෙන දෙයෙහි අනිත්‍ය දුක්ඛ විද්‍යමාන වෙනවා. හේතූන් නිසා හට ගන්න (විද්‍යමාන) දෙය හේතු නොයෙදෙනකොට නිරුද්ධයි. ඇති වෙලා නැති වුනා. ඒකට අනිත්‍ය කියලා කියනවා. පටිච්ච සමුප්පන්න වෙන ධර්මතාවයක් අනිවාර්යයෙන් අනිත්‍යයි. හේතු තියෙන කල් විතරයි තියෙන්නේ. හේතු සදාකාලික නැත්නම් ඵලය සදාකාලික වෙන්න බැහැ. හේතු හින්දමනේ ඵලයක් ගැන කථා කරන්නේ. හේතු වෙනස් වෙනවා නම් ඵලය වෙනස් වෙන්නම ඕනේ, ඒකයි පටිච්ච සමුප්පාදය කියන්නේ. දැන් ඕක සාමාන්‍ය ජීවිතයේ දේවල් වලට දමන්න ඕනේ. ඕගොල්ලන්ට හිතෙනවා නම් ඇහැයි රූපයයි වෙනස් ජාති දෙකක්, පටිච්ච සමුප්පන්න දේවල් නෙවෙයි කියලා, ඇහැ වෙනම පවතිනවා, රූපය වෙනම පවතිනවා කියලා, ඕක තමයි ලෝකයාගේ දෘෂ්ටිය. සසරෙ යන කෙනාගේ දෘෂ්ටිය තමයි ඇහැ වෙනම තියෙනවා, රූප ටික වෙනම තියෙනවා කියන එක. ලෝකෝත්තර දැක්ම වෙන්නේ පටිච්ච සමුප්පාදය දකින කොට. ඒ නිසයි පටිච්ච සමුප්පාදය බොහොම ගැඹුරු වෙන්නේ. ධර්මතා වෙනස් නමුත් ඒ ධර්මතා පටිච්ච සමුප්පන්නයි කියන කොට ඊට වඩා ගැඹුරක් දකින්න වෙනවා. පටිච්ච සමුප්පන්නයි කියන කොටම හිතට ගන්න ඕනේ ඒකට වෙනම පැවැතීමේ හැකියාවක් නැහැ. හේතූන් නිසාමයි විද්‍යමාන වෙන්නේ. හේතූන්ගෙන් තොරව ඵලය ගැන කථා කරන්න බැහැ පටිච්ච සමුප්පන්න නම්. ආයතන හයම පටිච්ච සමුප්පන්නයි. නාමරූප පච්චයා සළායතන කියන කොට පච්චයා කියන එකේ දකින්න ඕනේ පටිච්ච සමුප්පන්න සම්බන්ධය. නාමරූප

තියෙනවා නං විතරයි සළායතන විද්‍යමාන වෙන්න ඕනේ. නාමරූපයෙන් තොරව ආයතනයක් ගැන කථා කරන්න බැහැ. කථා කරනවා නම් ධර්මය දැකලා නෙවෙයි, ඒක ලෝකෙට අයිති දැක්ම. ධර්මය නොදැකපු කෙනාට කථා කරන්න පුළුවන් - ඇහැ, කණ, නාසය, දිව, ශරීරය පවතිනවා කියලා කියනවා.

පටිච්ච සමුප්පාදය දකින කොට එක වාදයකටවත් අහු වෙන්නේ නැහැ. වාද කියන්නේ දෘෂ්ටි. දෘෂ්ටි සියල්ලෙන්ම මිදීමක් තමයි පටිච්ච සමුප්පාදය දැකීම කියන්නේ. පරණ තියෙන දෘෂ්ටි ඔක්කෝම කැඩෙනවා. ඒක බොහොම ලස්සණට පෙන්නනවා 62ක් මිථ්‍යා දෘෂ්ටි සේරම කැඩෙනවා - කැඩුවේ මොකෙන්ද - පටිච්ච සමුප්පාදයෙන්. අපි එක එක විදියට දෘෂ්ටි ගත වෙලා ඉන්නවා - ඇහැ තියෙනවා, රූප තියෙනවා, මේ ශරීරය තියෙනවා, මම ඉන්නවා - මේවා එක එක දෘෂ්ටි. බුදුහාමුදුරුවෝ ඔය ඔක්කෝම කැඩුවා එක දෙයකින් - පටිච්ච සමුප්පාදයෙන් - ඕකත් පටිච්ච සමුප්පන්නයි. ඒක තේරුම් ගන්න, දකින්න ලේසි නැහැ. ඒකට නුවණක්, ප්‍රඥාවක් ඕනේ. පටිච්ච සමුප්පාදය දැක්කේ නැති කෙනාට සළායතන වෙනම අරන් කථා කරන්න පුළුවන්. ඒ අය පටිච්ච සමුප්පන්න බව දැකලා නැහැ. පටිච්ච සමුප්පන්න ඒවා තව විදියකට තේරුම් ගන්න හේතු ප්‍රත්‍යයන්ගෙන් හටගන්න දේවල්. නැත්නම් සංඛත ධර්ම කියනවා. සංඛත ධර්ම සියල්ලම පටිච්ච සමුප්පන්නයි, අපිට වෙනම පවතිනවා වගේ පෙනුනාට. ප්‍රශ්ණය තමයි අපි පටිච්ච සමුප්පන්න බව දකින්නේ නැහැ. ඇහැ පටිච්ච සමුප්පන්නයි කියන අවබෝධයක් නැහැ. ඇහැට නිකම් පවතින්න පුළුවන් කියලා හිතනවා, අර බට මිටි දෙකෙන් එකක් වගෙයි ඇහැ. පටිච්ච සමුප්පන්න වුනා නම් දෙපැත්තක් තියෙන්න ඕනේ ආධාර වෙන සහ මේ නිසාම විද්‍යමාන වෙන. හේතු නිසාමයි මේක තියෙන්නේ කියන ස්වභාවයක් දකින්න ඕනේ. අපි ඇහැ තියෙනවා කියන කොට හේතු නිසා පවතින ඇහැක් ගැනද කියන්නේ නැත්නම් සතර ඉරියව්වේම තියෙන ඇහැක් ගැනද කියන්නේ? තියෙනවා කියන කොටම පටිච්ච සමුප්පාදය නැහැ. වැරදි දෘෂ්ටියෙන් බලන කොට හේතු තිබුණත් නැතත් ඇහැ තියෙනවා, ඒ ඇහැ මගේ. ඉපදිලා මැරෙන කල්ම ඒක තියෙනවා. තව තැනක ඉපදුනොත් එතනත් තියෙනවා. මේ භවය පුරාම තියෙන දෙයක් ඇහැ, කණ, නාසය, දිව, ශරීරය. ඇයි? අපි පටිච්ච සමුප්පාදය දැකලා නැහැ.

පච්චයා, නිරෝධ කියන ධර්මතා දෙක දැකලා නැහැ. අපිට පවතින පැත්ත මිසක් නිරුද්ධ පැත්ත පෙනෙන්නේ නැහැ. ලෝකයා දකින ආකාරයට ඇහැ, කණ, නාසය, දිව, ශරීරය නිරුද්ධ වෙන්නෙ මැරුණහම. අපට ජීවිත කාලයේම පවතින දේවල් ටිකක් තියෙන්නේ. අපට උපදිනවා පේනවා නමුත් මැරෙන එක පෙනෙන්නේ නැහැ. ඒකෙන් තේරුම් ගන්න පටිච්ච සමුප්පාදය දැකලා නැහැ කියන එක. ඇහැ සංඛත ධර්මයක් කියන එක පිළිගන්නවාද? හේතු ප්‍රත්‍යයන්ගෙන් හටගත්ත එකක් කියලා පිළිගන්න වෙනවා. හේතු ප්‍රත්‍යයන්ගෙන් හටගත්ත ඒවා හේතු නිරුද්ධ වෙනකොට නිරුද්ධ වෙන්න ඕනේ. ඕක තමයි ධර්මතාවය. **හෙතුං පටිච්ච සම්භූතං හෙතු භංගා නිරුජ්ඣති** - කියනවා හේතූන්ගෙන් හටගත්තා කියලා, නමුත් නිරුද්ධ වීම ගැන දන්නේ නැහැ. ඔය ධර්මතාවය තව විදියකින් කියනවා නම් **යං කිංචි සමුදයධම්මං සබ්බං තං නිරොධධම්මං** - ඕක දැක්කොත් සෝවාන් වෙනවා. දැන් පේනවාද සෝවාන් වෙන්න නම් මොකක්ද දකින්න ඕනේ කියලා. සංඛත ධර්ම වල පටිච්ච ස්වභාවයයි නිරුද්ධ ස්වභාවයයි දකින්න වෙනවා පටිච්ච සමුප්පාදය දකින්න නම්. හේතු ප්‍රත්‍යයන්ගෙන් හටගන්න ධර්ම වල හේතු නිරුද්ධ වෙන කොට ඵලයත් නිරුද්ධයි කියන ධර්මතාවය දකින්න වෙනවා.

ප්‍රසාද රූපය කියන්නේ එක ධර්මතාවයක්, විඤ්ඤාණය කියන්නේ තව ධර්මතාවයක්. ඔය හැම ධර්මතාවයම දකින්න පටිච්ච සමුප්පන්න ලෙස. පටිච්ච සමුප්පන්න කියන කොට තේරුම් ගන්න ඕනේ ධර්මතා දෙක තමයි හේතු ප්‍රත්‍යයන් තියෙනවා නම් විද්‍යමාන වෙනවා, හේතු ප්‍රත්‍යයන් නැත්නම් ඒක ගැන කථා කරන්නවත් බැහැ - නිරුද්ධයි. විඤ්ඤාණය පටිච්ච සමුප්පන්න දෙයක් නැත්නම් සංඛත ධර්මයක් කියලා දකින්න. විඤ්ඤාණය හටගන්න හේතු ටික තියෙන කොට විඤ්ඤාණය තියෙනවා. විඤ්ඤාණය හටගන්න හේතු ටික නැතිවෙන කොට විඤ්ඤාණයක් ගැන කථා කරන්නවත් බැහැ. ඒ විඤ්ඤාණය නිරුද්ධයි. ඇහේ චක්ඛු විඤ්ඤාණය ගත්තොත් ඒක හටගන්න අවශ්‍ය හේතු ටික තියෙන කොට විද්‍යමානයි. ඒ හේතු නොයෙදෙන කොට චක්ඛු විඤ්ඤාණයක් ගැන කථා කරන්නවත් බැහැ. ඒක නිරුද්ධයි. විඤ්ඤාණය ගැන කථා කරන්න පුළුවන් ඒක හටගන්න හේතු ටික යෙදිලා හටගෙන තියෙන මොහොතක විතරයි. ඒ හේතු ප්‍රත්‍ය නැත්නම් විඤ්ඤාණයක් ගැන කථා කරන්න බැහැ. ඒක නිරුද්ධයි. හැම

මොහොතේම චක්ඛු විඤ්ඤාණය දිගටම පවතිනවාද? නිදා ගත්තහම තියෙනවාද? ඇහිපිය ගහන මොහොතේ ඇහැ වැහුනහම චක්ඛු විඤ්ඤාණය තියෙනවාද? නැහැ. ඔය අපිට සාමාන්‍යයෙන් පෙනෙන අවස්ථා. බලාගෙන ඉන්න ගමන් වෙන එකක් ගැන ගැඹුරට කල්පනා කරන කොට චක්ඛු විඤ්ඤාණය තියෙනවා කියලා කියන්න පුළුවන්ද? බැහැ. වෙන ආයතනයක් වැඩ කරන්නේ. එක විඤ්ඤාණයක් තියෙන කොට තව විඤ්ඤාණයකට තියෙන්න බැහැ. චිත්ත නියාමය කියන්නේ එක මොහොතක එක විඤ්ඤාණයයි. ඒක නිරුද්ධ වෙලාමයි තව විඤ්ඤාණයක් පහළ වෙන්නේ. ඒක බලන්න බැහැ, නමුත් නුවණින් දැනගන්න ඕනේ දෙයක්. හිත් දෙකක් එක මොහොතේ තියෙන්න බැහැ. මේ හිත ඉතාමත් වේගවත්. මේ ලෝකයේ තියෙන වේගවත්ම දෙය තමයි හිත.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා මේ හිතට උපමා කරන්න මේ ලෝකයේ වෙන දෙයක් හොයාගන්න බැහැ කියලා. හිත තමයි වේගවත්ම දෙය. දෙන්න පුළුවන් ළඟම උපමා තමයි ඇසිපිය ගහන ක්ෂණය, අකුණු සැරය වගේ දේවල්. විඤ්ඤාණය කියන එක අපට හිතාගන්නත් බැරි ඉක්මනට හටගෙන නිරුද්ධ වෙලා ඉවරයි. ඒ තරම් වේගවත්. ක්ෂණිකයි. එක විඤ්ඤාණයක් හට ගන්න කොට අනිත් විඤ්ඤාණ නිරුද්ධයි. ඒවා පටිච්ච සමුප්පන්න වෙලා නැහැ. ඒවා විද්‍යමාන වෙන්නේ නැහැ. දකින සිතේදී චක්ඛු විඤ්ඤාණය හටගෙන, වෙන විඤ්ඤාණ හටගන්න බැහැ. තව විඤ්ඤාණයක් හටගන්න නම් මේ විඤ්ඤාණය අනිවාර්යයෙන්ම නිරුද්ධ වෙන්න ඕනේ. ඒක චිත්ත නියාම ධර්මයක්. එතකොට ප්‍රශ්නයක් එනවා බලන ගමන් ශබ්ද ඇහෙන්නේ, ගඳ සුවඳ දැනෙන්නේ කොහොමද කියලා. ඒ වේගය වැඩි නිසා. හිත් වෙන් කරලා දකින්න ශක්තියක් අපිට නැහැ. නමුත් නුවණින් තේරුම් ගන්න ඕනේ මේවා එක එකක් එක එකකට වෙනස් සිද්ධීන් බව. එකක් වෙන අතරේ අනිත් එක වෙන්න බැහැ.

දැන් විඤ්ඤාණය පටිච්ච සමුප්පන්න බව පේනවා. චක්ඛු විඤ්ඤාණය හටගන්නවා, ඒ වගේම නිරුද්ධ වෙනවා. හටගන්න හේතු ප්‍රත්‍ය යෙදිලා තියෙන කොට හටගෙන, හේතු ප්‍රත්‍ය නොයෙදෙන විට නිරුද්ධයි. අනිත් විඤ්ඤාණත් ඒ වගේමයි. චක්ඛු විඤ්ඤාණය පහළ

වෙන්න නම් ඒකට හේතු ප්‍රත්‍ය වෙන ධර්මතා මොනවාද? ඇසයි රූපයයි. **චක්ඛුං ච පටිච්ච රූපෙ ච** - නැවතත් පටිච්ච කියන කථාව එනවා. **උප්පජ්ජති චක්ඛුවිඤ්ඤාණං** - පටිච්ච කියන්නේ ඔතන 'නිසා' කියන එක, පතිත වුනා නෙවෙයි. ඇසයි රූපයයි නිසා චක්ඛු විඤ්ඤාණය හටගන්නවා. නැවතත් පටිච්ච සමුප්පාදය. ඇසයි රූපයයි එක පැත්තක තිබ්බොත් හේතු විදියට - **ඉමස්මිං. ඉදං** කියන්නේ චක්ඛු විඤ්ඤාණයට. ඇසයි රූපයයි හේතු පැත්තේ, ඵල පැත්තේ චක්ඛු විඤ්ඤාණය. ප්‍රත්‍ය වෙන, ආධාර වෙන ධර්මතා හුඟක් තියෙනවා, වැදගත් දේවල් විතරයි අප කථා කරන්නේ. ඇසයි රූපයයි තිබුනට ආලෝකය නැත්නම් චක්ඛු විඤ්ඤාණය හටගන්නේ නැහැ. ධර්මයේ ප්‍රත්‍ය 24ක් (සූවිසි ප්‍රත්‍ය) සඳහන් වෙනවා. පළමුවෙන් සරළව කථා කරන්න ඕනේ. පච්චයා සහ නිරුද්ධා සම්බන්ධය බලන්න. ඇසයි රූපයයි තියෙන කොට චක්ඛු විඤ්ඤාණය තියෙනවා, ඇසයි රූපයයි නැති කොට චක්ඛු විඤ්ඤාණය තියෙන්න බැහැ. නිරුද්ධයි. **ඉමස්මිං සති ඉදං හොති ඉමස්මිං අසති ඉදං න හොති ඉමස්ස උප්පාදා ඉදං උප්පජ්ජති ඉමස්ස නිරුද්ධා ඉදං නිරුජ්ඣති.** පටිච්ච සමුප්පන්න කියන කොට ඔය කරුණු හතරටම ගැලපෙන්න ඕනේ. ඇසයි රූපයෙනුයි තොරව චක්ඛු විඤ්ඤාණයක් ගැන කථා කරන්න බැහැ. ඕකම අනිත් පැත්තටත් හිතන්න ඕනේ චක්ඛු විඤ්ඤාණයෙන් තොරව ඇසයි රූපයයි ගැන කථා කරන්නත් බැහැ. ඒ වගේ නුවණක් පිහිටන්න ඕනේ. අපට නැත්තේ ඔය නුවණ. අපි චක්ඛු විඤ්ඤාණයෙන් තොරවත් ඇහැත් තියෙනවා, රූපෙත් තියෙනවා කියලා දැඩි විශ්වාසයක ඉන්නවා. ඒක ලෝකයට අයිති දෘෂ්ටියක්. පටිච්ච සමුප්පාදය දැකපු නැති දෘෂ්ටියක්.

චක්ඛු විඤ්ඤාණයෙන් තොරව ඇසත් රූපයත් පවතින්න පුළුවන්ද? පටිච්ච සමුප්පාදය අනුව නම් බැහැ කියන එක තේරුම් ගන්න ඕනේ. පටිච්ච සමුප්පාදය නොදන්නා අයට නම් සතර ඉරියව්වේ පවතින ඇසත් රූපයත් තියෙනවා. ඉපදිලා මැරෙන තුරුම පවතින ඇසත් රූපයත් තියෙනවා. රූප සමහර විට මැරුනාට පස්සෙත් තියෙනවා. හැම දෙයක්ම අපි ජීවත් වෙන කාලයේ විතරක් නෙවෙයිනේ පවතින්නේ? චෛත්‍ය, ශාලාව වැනි දෙය. ඒක ලෝකයට අයිති දැක්ම. ඕක වෙන් කර ගන්න ඕනේ. අපි හැම තිස්සේම ඉන්නේ ලෝකයට අයිති දැක්මෙන්. ඒක නිසයි ලෝකෝත්තර ධර්මය පටලවා ගෙන පටිච්ච සමුප්පාදයත්

ලෝකයට අයිති දැක්මෙන් විස්තර කරන්නේ. පටිච්ච සමුප්පන්න බව කියන්නේ ම ලෝකෝත්තර දැක්මක්. ධර්මය දැකීමක්. බුදු කෙනෙක් ලෝකයට දේශනා කරන්නේ පටිච්ච සමුප්පාදය. ඒක පෙර නොඇසූ විරූ ධර්මතාවයක්. **පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු**. පටිච්ච සමුප්පන්න බව කියන කොට මෙච්චර කල් දැකපු එකට එහා ගිය දැක්මක්, ධර්මයක් තියෙනවා. මෙතෙක් කල් අපට තිබුනේ සතර ඉරියව්වේ පවතින ඇහැක්. අපි හිටියත් නැතත් පවතින රූප ගොඩක්. සම්මාදිට්ඨියේදී බුදුරජාණන් වහන්සේ පෙන්වනවා ඇහැත් පටිච්ච සමුප්පන්න ධර්මතාවයක්, ලෝකයත් පටිච්ච සමුප්පන්න ධර්මතාවයක් කියලා. ඒ නිසා දකින්න කියනවා ඇහැ කියන්නේ මොකක්ද? ඇහේ සමුදය මොකක්ද? ඇහේ නිරෝධය මොකක්ද? නිරෝධ කරන මාර්ගය මොකක්ද? ඕක දැක්ක කෙනා සම්මාදිට්ඨිය ඇති කරගන්නවා කියනවා.

එහෙම නැත්නම් ලෝකය කියන්නේ මොකක්ද? ලෝක සමුදය මොකක්ද? ලෝක නිරෝධය මොකක්ද? නිරෝධ මාර්ගය මොකක්ද? ඕක අවබෝධ කරන කෙනා සම්මා දිට්ඨිය ඇති කරගන්නවා. මොන සම්මාදිට්ඨියද? ලෝකෝත්තර සම්මාදිට්ඨිය. මේ සසරින් මිදෙන, දුක නැති කරන සම්මාදිට්ඨිය. සම්මාදිට්ඨිය කියන්නේ දුක නැති කළා නෙවෙයි, රහත් වුනා නෙවෙයි. මෙහෙම දෙයක් තියෙනවා කියලා දකිනවා. එහෙම කෙනාට තමයි මාර්ගය උපදවා ගන්න පුළුවන්.

**ප්‍රශ්නයක්:** පටිච්ච සමුප්පන්න නොවන දේවල් තියෙනවාද? නිවන විතරක් පටිච්ච සමුප්පාදයට යටත් නැහැ. නිවන හේතු ප්‍රත්‍යයෙන් හටගත් එකක් නෙවෙයි. සංඛත ධර්මයක් නෙවෙයි. අසංඛතයි. මේ ලෝකයට අයිති අනිත් හැම දෙයක්ම සංඛතයි, පටිච්ච සමුප්පන්නයි, හේතු ප්‍රත්‍යයන්ගෙන් හටගන්නේ.

**ප්‍රශ්නයක්:** ඉපදී ඉපදී මැරි මැරී යන හිතකට පටිච්ච සමුප්පාදය සම්බන්ධ වෙන්නේ කොහොමද? හේතු ප්‍රත්‍ය හුඟක් තියෙනවා. කර්මයත් එක ප්‍රත්‍ය වන ධර්මතාවයක්, ආධාර වෙන, උපකාර වෙන ධර්මතාවයක්. උදාහරණයක් වශයෙන් අපිට මේ මනුෂ්‍ය මට්ටමේ ඇහැක් ලැබිලා තියනවා නේ. ඒක ඉබේ ලැබුනු එකක් නෙවෙයි. එයට කර්මයත් ප්‍රත්‍ය වෙලා තියෙනවා. ඒ කර්මය පහත් වුනා නම් සමහර විට තිරිසන් සතෙක්ගේ මට්ටමේ ඇහැක් ලැබෙන්නේ. උසස් වුනා නම් දිව්‍ය මට්ටමේ

ඇහැක් ලැබෙන්නේ. එතකොට දකින්න පුළුවන් හැකියාව වෙනස්. පටිච්ච සමුප්පාදය කියන කොට අපි වෙන වෙනම හොයන්නේ නැහැ මොනවද ප්‍රත්‍ය කියන එක. පටිච්ච සහ නිරුද්ධ කියන එක, නැත්නම් පච්චයා නිරුද්ධා කියන එක තමයි පටිච්ච සමුප්පාදයට අදාළ වෙන්නේ. පටිච්ච සමුප්පාදය ගැඹුරින්ම දකපු කෙනාට තවත් කළ යුතු දෙයක් නැහැ. ඒ තමයි රහතන් වහන්සේ. කළ යුතු සියල්ල නිම කරන ලදී. අපි ඕක දැකලා, අවබෝධ කරලා නැහැ. පටිච්ච සමුප්පාදය ගැඹුරින් දැකලා අවබෝධ කලාට පස්සේ තවත් අනිත්‍ය බල බලා ඉන්න ඕනේ නැහැ. ඒක දැකලා ඉවරයි. නමුත් ඒක දකින කල්, අවබෝධ කරන කල් කරන්න දෙයක් තියෙනවා. දුකෙන් මිදෙන්න අවශ්‍ය නම් විතරක් කරන්න දෙයක් තියෙනවා. ඒකත් වෙන්නේ සම්මාදිට්ඨිය තියෙන කෙනාට විතරයි. සම්මාදිට්ඨිය නැති කෙනාට ඕක කලා කියලා වැඩක් නැහැ. ඒක ධර්මය නෙවෙයි. පටිච්ච සමුප්පාදය ගැන අවබෝධයක් නැති කෙනාට පටිච්ච සමුප්පාදය දකින්න කරන්න ඕනේ දෙය හිතා ගන්න බැහැ. අපි තේරුම් ගන්න ඕනේ පටිච්ච සමුප්පාදය දැකලා නැහැ, බුදු කෙනෙක් පෙන්නුම් කරනවා පටිච්ච සමුප්පාදය.

අපි හටගන්න, නිරුද්ධ වෙන බව දන්නෙ නැහැ. අපිට තියෙන්නේ පවතින දෙයක්. ලෝකය පවතිනවා. පෙර නොතිබීම හටගන්න දෙයක් කියලා අපි දැකලා නැහැ. ඇත්ත ස්වභාවය දකින්නේ නැහැ. ලෝකයට අයිති දැක්ම කියන්නේ ඇත්ත වහලා බොරුව පෙන්වන්නේ. අපි හදාගත්ත ලෝකය අපට පවතින ලෝකය නේ. මේ පටිච්ච සමුප්පන්න ලෝකයක් සාමාන්‍ය ලෝකයාට පෙනෙන්නේ නැහැ. හේතු ප්‍රත්‍යයෙන් හටගන්න ලෝකයක් කියන එක පෙනෙන්නේ නැහැ. එහෙම කෙනාට දෘෂ්ටියකින් හදාගත්ත පවතින, ස්ථිර ලෝකයක් තියෙනවා. එයාට තියෙනවා නිරුද්ධ කරන්න දෙයක්. පටිච්ච සමුප්පාදය දැක්ක කෙනාට එහෙම දෙයක් නැහැ. එයා හටගන්න හැටිත් දකිනවා, නිරුද්ධ වෙන හැටිත් දකිනවා. මේ සම්බන්ධව මූලික දැක්ම ආවාට පස්සේ - ඒ කියන්නේ සම්මා දිට්ඨිය ආවාට පස්සේ තවම ප්‍රත්‍යක්ෂ ඥාණයෙන් හැම මොහොතේම පෙනෙන්නේ නැහැ. නමුත් එයා දන්නවා දන් මොනවා හරි කළ යුත්තක් තියෙනවා මේක අවබෝධ කරන්න. එයාට මාර්ගය උපදිනවා. ධර්මතාවය නුවණින් බලන කොට පෙනෙනවා, සාමාන්‍ය ජීවිතයේදී පෙනෙන්නේ නැහැ. එයා දන්නවා

සාමාන්‍ය ජීවිතයේදී වෙන්නේ රැවටීමක් කියලා. එතකොට රැවටීමෙන් මිදෙන්න නම් කළ යුත්තක් තියෙනවා. ඒක තමයි මාර්ගය කියන්නේ. මාර්ගය වඩාගෙන යන කොට තවත් කළ යුතු දෙයක් නැත කියන මට්ටමට අවබෝධය ආව දවසට නැවත කරන්න දෙයක් නැහැ. දැකලා ඉවරයි.

විඤ්ඤාණය නම් හරි අහිංසකයි, අපි රැවටුනොත් තමයි ප්‍රශ්නෙ තියෙන්නේ. අපි ගෙදර ටී.වී. බලන කොට ඒක ගෙනාපු කෙනා හෝ හදපු කෙනා හතුරෙක්ද? තමන් තුළින් තමයි හතුරා හදාගෙන තියෙන්නේ. හතුරු කම තියෙන්නේ ඕකේ ඇත්ත ඇති හැටියෙන් දකින්නේ නැති තාක් කල් විතරයි. හතුරෝ ඇති කරගන්නේ තමන්මයි. තමන් රැවටෙන තාක් කල් තමන්ගේ මෝඩ කමට, තමන්ගේ මුලාවට, තමන්ගේ අවිද්‍යාවට තමයි ඔක්කෝම හදාගෙන තියෙන්නේ. වෙන බාහිර කාටවත් බනින්න ඉඩක් ඉතුරු කරලා නැහැ බුදුරජාණන් වහන්සේ. ප්‍රඥාවෙන්මයි මේක කරන්න තියෙන්නේ. ප්‍රඥාව වඩා ගන්න ඕනේ. ප්‍රඥාව කියන්නේ ඇත්ත ඇති සැටියෙන් දකින්න පුළුවන්කම. ඒකට උදව් වෙන්න අපට ධර්මය, පටිච්ච සමුප්පාදය දේශනා කරලා තියෙනවා.

ඇහැත් රූපත් නිසා චක්ඛු විඤ්ඤාණය - ඇහැත් රූපත් නැති වුනා නම් චක්ඛු විඤ්ඤාණයක් නැහැ. විඤ්ඤාණයත් පටිච්ච සමුප්පන්නයි කියලා දකින්න ඕනේ. එතන හේතු ප්‍රත්‍ය ප්‍රධාන වශයෙන් ඇහැයි රූපයයි වෙනවා. එහෙම කිව්වහම හිතන්න එපා ඔය ටික විතරයි තියෙන්නේ කියලා. ඇහැයි රූපයයි නැති වුනාට පස්සේ විඤ්ඤාණය පහළ වෙනවා නෙවෙයි. ඇහැයි රූපයයි තියෙන අවස්ථාවේමයි විඤ්ඤාණය. ඇහැයි රූපයයි නැත්නම් විඤ්ඤාණයක් ගැන කථා කරන්න බැහැ. පටිච්ච සමුප්පන්න කියන්නේ ඔය වගේ ධර්මතාවයක්. කොටසක් පවතිනවා, කොටසක් නිරුද්ධවෙනවා කියලා කථාවක් නැහැ. අපි රැවටුන දේවල් වලට තමයි ඔය එක එක ඒවා කියන්නේ. මොකක් හරි අනාත්මයි, මොකක් හරි අනිත්‍යයි, දුකයි. මොකක් හරි කියන්නේ මොකක්ද? සංඛත ධර්මයක්, සකස් වුනු දෙයක්. නිර්වානය සංඛත නැහැ. නිර්වානයට හේතු ප්‍රත්‍ය නැහැ. ඒක දෙයක් නෙවෙයි. ඒ නිසා නිර්වානය අනිත්‍යයත් නැහැ, දුකත් නැහැ, අනාත්මත් නැහැ. කිසිම ලක්ෂණයක්

නැහැ මොකද ඒක සංඛත නෙවෙයි. අසංඛතයි. වෙන එකක් හින්දා පවතින දෙයක් නෙවෙයි. නිවන කියන්නේ නිවී යෑමක්. දැල්ල නිවී ගියා වගේ. නැවත දැල්ලක් ගැන කථා කරන්න බැහැ. නිරුද්ධයි. සංඛත බවින් මිදීමමයි අසංඛත. නිවන කියන එක මේ ලෝකයේ තියෙන දේවල් වලින් විස්තර කරන්න බැහැ. දෙයක් කියන්නේ සංඛත දේවල් වලට, හේතු ප්‍රත්‍යයෙන් හටගන්න දේවල් වලට, ලෝකෙට අයිති දේවල් වලට. නිවන කියන්නේ එහෙම දේවල් ඉපදිලා නැති බවමයි. නැවත හට නොගන්න ස්වභාවයමයි නිවන කියන්නේ. තියන දේ නැති කිරීම නෙවෙයි නිවන කියන්නේ. එහෙම වුනා නම් නිවනත් සංඛතයිනේ. ඒකට හේතු ප්‍රත්‍ය කොහෙන්වත් සම්බන්ධ කරන්න බැහැ. ඒකයි අසංඛතයි කියන්නේ. මේ වැරදි දෘෂ්ටි ටික හඳාගැනීම නැවැත්වීමමයි නිවන කියන්නේ.

දැන් ලෝකය පිළිබඳව වැරදි දෘෂ්ටි ටිකක් තියෙනවා නේ. ඒ දෘෂ්ටි ඇවිල්ලා තියෙන්නේ පටිච්ච සමුප්පන්න බව, හේතු ප්‍රත්‍යයෙන් හටගන්න බව දකින්නේ නැති හින්දා. අපි වෙන් කරලා ගන්නවා. දෘෂ්ටි වල ඉඳන් තේරුම් ගන්න එකත් ලේසි නැහැ. පටිච්ච සමුප්පන්න කියන්නේ පෙර නොතිබීමයි හටගන්නේ. ඊට මොහොතකට කලින් තියෙන්න බැහැ. නිරුද්ධ වෙන්නේ කිසිම ඉතුරුවක් නොකර. පටිච්ච සමුප්පාදය කියන කොට - පච්චයා කියන කොට අවිජ්ජා පච්චයා සංඛාරා කියලා කිව්වා. නමුත් නිරෝධා කියන කොට තව වචන ටිකක් කිව්වා - **අවිජ්ජායත්වෙව අසෙසවිරාගනිරොධා සංඛාර නිරොධො** - අවිජ්ජාව තියෙන නමුත් එය ශේෂයක් නැතිවම, ඉතුරුවක් නැතිවම නිරුද්ධ වුනොත්, සංඛාරයක් ගැන කථා කරන්න බැහැ. සංඛාර නිරෝධ නම් විඤ්ඤාණය නිරුද්ධයි. නැවතත් පටිච්චයි නිරෝධයි - හේතු ඵල. **ඉමස්මිං සති ඉදං හොති ඉමස්ස උප්පාදා ඉදං උප්පජ්ජති** - නිරෝධා කියන කොට **ඉමස්මිං අසති ඉදං න හොති** - සංඛාර නැත්නම් විඤ්ඤාණ නැහැ. **ඉමස්ස නිරොධා ඉදං නිරුජ්ඣති** - සංඛාර නිරුද්ධ වුනොත් විඤ්ඤාණය නිරුද්ධයි. ඕතන ලොකු ගැඹුරක් තියෙනවා, අපි කථා කරන්න පුරුදු වෙලා තියෙන්නේ සංඛාර පච්චයා විඤ්ඤාණං, සංඛාර නිරුද්ධා විඤ්ඤාණ නිරොධා කිව්වාට මෙහෙම විද්‍යමාන වෙන ස්වභාවයක් නෙවෙයි. සංඛාර ඉවරවෙලා තමයි විඤ්ඤාණය හටගෙන තියෙන්නේ. ඕතන තමයි පටලවා ගත්ත තැන. ඒ පටිච්ච සමුප්පදය

දැකලා නෙවෙයි. ඕක තේරුම් ගන්න. යම්කිසි සංඛාරයක් තියෙනවා නම් ඒකට අදාල විඤ්ඤාණයකුත් එතනම විද්‍යමාන වෙනවාමයි. නැතුව ඒ සංඛාරය ඉවර වෙලා ඒ නිසා හටගත්ත විඤ්ඤාණයක්, වෙනම පවතින්න පුළුවන් විඤ්ඤාණයක් නෙවෙයි බුද්ධ දේශනාව.

අපි ඕකට වෙනස් විදියකට හිතුවොත් ලෝකෙට අහුවෙන දෘෂ්ටියක ඉඳන් තමයි කථා කරන්නේ. සසරේ යන දෘෂ්ටිය. පටිච්ච සමුප්පන්න භාවය අමතක වෙනවා. කථා කරන හැම වචනයක්ම ලෝකයට අයිති වචන. ලෝකයට අයිති කියන්නේ සංඛත ධර්ම. පටිච්ච සමුප්පන්න ධර්ම. පටිච්ච සමුප්පන්න කියන ධර්මතාවය දැක්කා නම් ඒක ඔය හැම වචනයටම දාන්න. පටිච්ච සමුප්පාදය දකින කොටම අපි අත් හරින දෘෂ්ටි ටිකක් තියෙනවා. දර්ශනයෙන් පහ කළ යුතු ධර්මතා පහ වෙනවා දැක්ම ඇති වෙනකොට. මේ හේතු ඵල දහම නැත්නම් පටිච්ච සමුප්පන්න දහම දකින කොට ඒක දකින්නේ නැතුව ඇති කර ගෙන හිටිය දෘෂ්ටි ටික අයින් වෙනවා. සම්මා දිට්ඨිය ඇති වෙන කොටම, වැරදි දෘෂ්ටි වලින් මිදෙනවා. යම්කිසි මොහොතක සම්මා දිට්ඨිය පහළ වෙනවා නම් ඊට කලින් තිබුණ දෘෂ්ටි සමහරක් අතහරිනවාමයි. අළුත් දැක්මක් එන කොට පරණ මුලා වෙල හිටිය ටික අතහැරෙනවා නේ ඉබේම. ඒකෙත් කාල පරතරයක් නැහැ. සම්මා දිට්ඨිය ඇති වෙනවා කියන්නේම වැරදි දෘෂ්ටි ටික නැති වෙනවා. ඔය දෙක එකම කරුණක්. වෙනදා දැක්ක නැති දැක්මක් එනවා කියන්නේ පරණ දැක්ම එතනින්ම අයින් වෙනවා කියන එක. යමක් අවබෝධ කරනවා කියන්නේ වැරදියට හිතන් හිටිය ටික එතනින් අයින් වෙනවා. ඒ දෙකම එක මොහොතේ වෙන්නේ.

කර්මඵල වලිනුත් එහාට යෑමක් තමයි ලෝකෝත්තර වෙන්නේ. කර්මඵල විශ්වාස කිරීම එක්තරා සම්මාදිට්ඨියක්. ඒක ලෝකෙට අයිති කම්මස්සකතා සම්මාදිට්ඨිය. කර්මඵල අදහන සම්මාදිට්ඨිය. මේ කියන්නේ ලෝකෝත්තර නැත්නම් චතුසච්ච සම්මාදිට්ඨිය. මේක දැක්කොත් කර්මඵල කිසිවක් අදාළ නැහැ ඊළඟට. කළින් පින් කලාද පව් කලාද කියන එක යෙදෙන්නේ නැහැ. ඒක වැඩකුත් නැහැ. කරලා ඉවර ඒවා වෙනස් කරන්නත් බැහැ. මේ මොහොතේ පටිච්ච සමුප්පාදය දකින කොට පින් ද පව් ද කියන කථා අදාළ නැහැ. කර්ම වලට බලයක් තියෙන්නේ

ලෝකේ යන තුරු විතරයි. සසර ගමනේ යන කෙනාට තමයි කර්ම වල බලයක් තියෙන්නේ. සසරෙන් මිදෙන කෙනාට කර්ම වැදගත් නැහැ. ඒක දුකයි කියලා දැකලා ඒකත් ඉක්මවා යෑමක් ලෝකෝත්තර දැක්ම කියන්නේ. පටිච්ච සමුප්පාදය තියෙන්නේ ඔය සඳහා. ලෝකයට අයිති දැක්මෙන් මිදෙන විදිය තමයි පටිච්ච සමුප්පාදයෙන් පෙන්වන්නේ. ලෝකයට අයිති දැක්මෙ ඉන්න කෙනාට ඒකෙන් මිදෙන්න උදව් වෙන්න තමයි පටිච්ච සමුප්පාද දේශනාව තියෙන්නේ. ධර්මය තියෙන්නේ. පටිච්ච සමුප්පාදය දකින කෙනා ලෝකයට අයිති දෘෂ්ටි වලින් මිදෙනවා. කලින් තිබුණේ ලෝකයට අයිති දැක්ම නේ. ඒක ඉක්මවා යනවා. පින් කරලා තියෙන නිසා තමයි මනුෂ්‍ය ජීවිතයක් ලැබිලා තියෙන්නේ, ධර්මයක් අහන්න, හිතන්න නුවණක් ලැබිලා තියෙන්නේ. ඒ ටික ලැබිලා තියෙන හින්දා තමයි දැන් මෙහෙම ධර්මයක් සාකච්ඡා කරන්නේ. ත්‍රිහේතුක ප්‍රතිසන්ධිය නැති කෙනාට මෙහෙම ධර්මයක් සාකච්ඡා කරන්න බැහැ. ප්‍රඥාව පැත්ත නැහැ. ප්‍රඥාව මුල් වෙලා අපි ඉපදුන නිසා තමයි අපට මේ වගේ දෙයක් සාකච්ඡා කරන්නවත් පුළුවන්. ධර්මය මෙනෙහි කරන විට වැඩෙන්නේ ප්‍රඥා චෛතසිකය. මාර්ගයට වැටෙනවා. සම්මාදිට්ඨිය කොහෙන් හරි ඇති වුනොත් ඊළඟට මාර්ගයයි වැඩෙන්නේ. ඒ වැඩෙන්නේ ලෝකෝත්තර ආර්‍යඅෂ්ඨාංගික මාර්ගය.

ලෝකයට අයිති දෘෂ්ටියෙන් මිදෙන හැටි තමයි වැදගත් වෙන්නේ. ඒකට පටිච්ච සමුප්පන්න බව දකින්න ඕනේ. ඔතන ඇහැත් රූපයත් නිසා විඤ්ඤාණයේ පටිච්ච සමුප්පන්න බව තමයි ඔය පෙන්නුවේ. ඕකේ ඊට වඩා තව ගැඹුරක් තියෙනවා, ඇහැත් පටිච්ච සමුප්පන්නයි, ඇහැත් සංඛත ධර්මයක්. රූපත් පටිච්ච සමුප්පන්නයි, ලෝකෙට අයිති රූප කියන ඒවත් පටිච්ච සමුප්පන්නයි. එතනත් දකින්න ඕනේ පටිච්ච සමුප්පන්න බව. ඒ කියන්නේ හේතු ප්‍රත්‍යයන්ගෙන් විද්‍යමාන වෙන දෙයක්. හේතුන් නිසාම හටගත්ත දෙයක්. හේතුන් නිරුද්ධ වෙන කොට නිරුද්ධ වෙනවා. **හෙතුං පටිච්ච සම්භූතං හෙතු භංගා නිරුජ්ජති** - කියන ධර්මතාවයට අදාළ ධර්මතාවයක් ඇහැ කියන එකත්. ඇහැට හේතු ප්‍රත්‍ය වෙන ධර්මතා ටිකත් හොයාගන්න වෙනවා. ඒ වගේම මේ ඇහැ නිසා පෙන්නුම් කරන රූප, ඒ රූපත් පටිච්ච සමුප්පන්නයි. එතනත් දකින්න වෙනවා පටිච්ච සමුප්පන්න ධර්මතාවයක්. පටිච්ච සමුප්පන්න කියන කොට අදහසක් ආවා නේද පෙර නොතිබීම

හටගන්න ඕනේ, ඔය ධර්මතාවයට අදාළයි. ඇහැ කියන එකත් පෙර නොතිබීම හටගෙන ඉතුරු නැතුවම නිරුද්ධ වෙන ධර්මතාවයක් වෙන්න ඕනේ. අපට දැනට ලෞකික වශයෙන් පෙනෙන ස්වභාවය නෙවෙයි ඒ. ඕක ටිකක් ගැඹුරුයි නමුත් නුවණින් දකින්න බැරි දෙයක් නෙවෙයි ඒ. අපේ දෘෂ්ටි ගත වුනු, මේ සතර ඉරියව්වේම පවත්වන ඇහැ පටිච්ච සමුප්පන්න නෙවෙයි. ඒකේ නිරුද්ධ වීමක් නැහැ. සංඛත ධර්මයක් වුනාට සංඛත ලක්ෂණය අපි දැකලා නැහැ. හේතු ප්‍රත්‍යයෙන් හටගන්න නිසා නේ සංඛත කියන්නේ. ඒ වුනාට ඒ සංඛත ලක්ෂණය අපි නුවණින් දැකලා නැහැ. අපි පවතින ඇහැක් කියන දෘෂ්ටියක තමයි ඉන්නේ.

ඇහැ කියන ධර්මතාවය හොයන්න වෙනවා. ඇහැක් තියෙනවා කියලා දැනගත්තේ කොහොමද? මාංශ ඇහැ කියන්නේ මේ දකින ඇහැ නෙවෙයි. මාංශ ඇහැ කියන්නේ කයට අයිති කොටසක්. මේ ඇස් බෝලයේ ඕනේ තැනක් අල්ලලා බැලුවොත් එහෙම පේනවාද දැනෙනවාද? දැනෙනවා. පෙනීම නෙවෙයි සිද්ධ වෙන්නේ දැනීම. කාය විඤ්ඤාණය පහළ වෙන්නේ. කාය විඤ්ඤාණය පහළ වෙන තැනට අපි කියන්නේ කායායතනය කියලා. චක්ඛායතනය නෙවෙයි. එතකොට මාංශ ඇහැ කියන එක කායාතනය. නමුත් චක්ඛායතනය මාංශ ඇහැ ඇසුරු කරගෙන කොහේ හරි ඇති චක්ඛායතනය කියන එක. චක්ඛු ඉන්ද්‍රිය සොයන්න නම් පෙනෙන ස්වභාවය - චක්ඛු විඤ්ඤාණය හටගන්න තැන හොයාගන්න වෙනවා. කාය විඤ්ඤාණය හටගන්න තැනක් හොයලා ඇහැක් හම්බවෙන්නේ නැහැ. තව විදියකට කිව්වොත් දැකීම ඇති කරන තැන හොයාගන්න වෙනවා ඇහැ හොයාගන්න නම්. තව විදියකට කිව්වොත් චක්ඛු විඤ්ඤාණය පහල වෙන තැන තමයි ඇහැ.

දැන් අපි ඇහැ කියලා හිතාගෙන ඉන්නේ මොකටද? මේ හිතාගෙන ඉන්න ඇහැ, මේ මාංශ ඇහැ වෙන්න පුළුවන්ද චක්ඛායතනය - බැහැ. ඒක කායාතනයට අයිති එකක්. තමන්ට පෙනීම සිද්ධ වෙන තැනම තමයි චක්ඛායතනය වෙන්නේ. එතකොට චක්ඛායතනය හටගත්තා කියලා දැනගන්න තියෙන්නේ එක විදියයි - පෙනීමක් නිසා. ඇහැක් තියෙනවා කියලා දැනගන්නේ පෙනීම නිසාමයි. දොස්තර වුනත් පරීක්ෂා කරන්නේ එහෙමයි - පෙනෙනවාද කියලා බලලා. පෙනීම සිද්ධ වෙන්නේ නැත්නම් ඇහැක් තියෙනවා කියයිද? නැහැ. එතකොට තේරුම්

ගන්න ඇහැ ඉපදිලා තියෙන්නේ, නැත්නම් ඇහැක් පවතිනවා කියන්න පුලුවන් පෙනෙන මොහොතක විතරයි පෙනෙන්නේ නැති මොහොතක ඇහැක් තියෙනවා කියන එකට තේරුමක් නැහැ. ඒක වචන ගොඩක් විතරයි. චක්ඛායතනය නැත්නම් චක්ඛු ඉන්ද්‍රිය කියන එකට තේරුමක් තියෙන්නේ පෙනීම සිද්ධ වෙනවා නම් විතරයි. දැනීම සිද්ධ වුනා කියලා චක්ඛු ඉන්ද්‍රියක් ගැන කථා කරන්න බැහැ. ඒක කාය ඉන්ද්‍රිය. එහෙම නම් තේරුම් ගන්න ඇහැ කියන ධර්මතාවය පෙනීම සිද්ධවෙන මොහොතේ විතරයි තියෙන්නේ. පෙනීම සිද්ධ වෙන්නේ චක්ඛු විඤ්ඤාණය පහල වෙන මොහොතේ. එතකොට චක්ඛු විඤ්ඤාණය පහල වෙන මොහොතේ තමයි ඇහැ කියන දෙය තියෙන්නේ. චක්ඛු විඤ්ඤාණය පහල නොවෙන මොහොතක ඇහැ කියන එකට තේරුමක් නැහැ. ඇහැ ඉපදිලා නැහැ. තව විදියකට කිව්වොත් ඇහැ නිරුද්ධයි. චක්ඛු විඤ්ඤාණය තියෙන මොහොතේ ඉපදිලා. චක්ඛු විඤ්ඤාණය නැති මොහොතක ඇහැක් ගැන කථා කරන්න බැහැ - නිරුද්ධයි. පටිච්ච සමුප්පන්නව හිතන්න ඕනේ - හේතු ඵල විදියට. චක්ඛු විඤ්ඤාණය නිසාමයි අපිට ඇහැක් තියෙනවා කියලා කියන්න වෙන්නේ. ඉස්සෙල්ලා ධර්මතාවෙන් පෙනෙනවා නේද හේතු ඵල සම්බන්ධය. පච්චයා නිරුද්ධා කියලා විස්තර කලේ. එතකොට ඇහැ කියන ධර්මතාවය තියෙන්නේ පෙනීම තියෙන මොහොතක විතරයි. අපි දන්නවා පෙනීම තියෙන මොහොත තියෙන්නේ චක්ඛු විඤ්ඤාණ සිත තියෙන කල් විතරයි. චක්ඛු විඤ්ඤාණ සිත පහළ වෙන්න කලින් පෙනීම කියන ධර්මතාවය නැහැ. චක්ඛු විඤ්ඤාණ සිත නිරුද්ධ වෙලා අපි කියමු සෝත විඤ්ඤාණ සිතක් නම් හටගෙන තියෙන්නේ, එතකොටත් පෙනීම කියන ධර්මතාවය නැහැ. එතකොට ඇසීම තියෙන්නේ. එහෙනම් චක්ඛු ඉන්ද්‍රිය කියන ධර්මතාවය චක්ඛු විඤ්ඤාණය පහළ වෙන මොහොතේ පටිච්ච සමුප්පන්න වුන ධර්මතාවයක්. ඇහැ කියන ස්වභාවය චක්ඛු විඤ්ඤාණය පහළ වුන මොහොතේ විතරක් කථා කරන්න පුළුවන් ස්වභාවයක්. චක්ඛු විඤ්ඤාණය නැති මොහොතක ඇහැක් ගැන කථා කරන එක තේරුමක් නැහැ - නිරුද්ධයි.

එහෙනම් තේරුම් ගන්න වෙනවා චක්ඛු විඤ්ඤාණය පහළ වෙන මොහොතේ පටිච්ච සමුප්පන්න වුන ධර්මතාවයක් තමයි ඇහැ කියන එක. චක්ඛු විඤ්ඤාණය නිරුද්ධ වෙන කොට ඒ ධර්මතාවයත් නිරුද්ධයි.

ඇහැ කියන ධර්මතාවයත් ඉතුරු නැතුවම නිරුද්ධයි. ඇහැට පෙනුන රූපය කියන එකත් දැන් චක්ඛු විඤ්ඤාණය එක්කම නේ පෙනෙන්නේ. චක්ඛු විඤ්ඤාණය නැත්නම් පෙනෙන්න විදියක් නැහැනේ. එතකොට ඒ රූප ස්වභාවය කියන ධර්මතාවයත් ඒ මොහොතේ පටිච්ච සමුප්පන්න වෙලා ඒවා නිරුද්ධ වෙනකොට නිරුද්ධ වෙන ධර්මතාවයක්. ඇහැත් පටිච්ච සමුප්පන්නයි. පෙර නොතිබීම ඒ මොහොතේ හටගත්තා, එහෙමම නිරුද්ධ වුනා. රූපයත් පටිච්ච සමුප්පන්නයි. ඇහැ නිසා දැනගත්ත යම් රූපයක් වේද, ඒකත් ඒ මොහොතේ හටගත්තා, එහෙමම නිරුද්ධ වුනා. පටිච්ච සමුප්පන්නව හටගත්තා, එහෙමම නිරුද්ධ වුනා. හේතු ප්‍රත්‍යයන් නොයෙදෙන කොට යෙදෙන්නේ නැහැ. චක්ඛු විඤ්ඤාණයත් පටිච්ච සමුප්පන්නයි. පෙර නොතිබීම හටගත්තා, ඉතුරු නැතුවම නිරුද්ධ වුනා. ඔය ධර්මතාවය තේරුම් ගන්න ඕනේ. ඇහැත් පටිච්ච සමුප්පන්නයි. පෙර නොතිබීම හටගෙන ඉතුරු නැතුවම නිරුද්ධ වෙනවා. ඇහැ නිසා දැනුවත් වෙන රූපයත් පටිච්ච සමුප්පන්නයි. පෙර නොතිබීම හටගෙන ඉතුරු නැතුවම නිරුද්ධ වෙනවා. හැම රූපයම එහෙම තමයි. ඇහැ නිසා දැන නොගත්ත වෙන රූපයක් තියෙනවාද? රූප කියලා අපි පොදුවේ කියනවා - කන නිසා දැනගන්නේ ශබ්ද රූප. එතැනදී අදාල වෙන්නේ සෝත ඉන්ද්‍රිය. කනෙන් ශබ්ද රූප දැනගන්නේ. ඒකට මුල් වෙන්නේ සෝත විඤ්ඤාණය. සෝත විඤ්ඤාණය පවතින මොහොතක තමයි කන (සෝත ඉන්ද්‍රිය) කියන ධර්මතාවය හටගෙන තියෙන්නේ. සෝත විඤ්ඤාණය නැත්නම් සෝත ඉන්ද්‍රියක් ගැන කථා කරන්න බැහැ. හැම රූපයක්ම පටිච්ච සමුප්පන්නයි.

උදාහරණයක් ගමු - චෛත්‍ය පටිච්ච සමුප්පන්නද නැත්ද? ධර්මයට අනුව නම් පටිච්ච සමුප්පන්න වෙන්න ඕනේ. අපිට නම් පටිච්ච සමුප්පන්න නැහැ - එනකොටත් තිබුනා, දැනුත් තියෙනවා, යනකොටත් දකින්න පුළුවන් - පවතිනවා. ඒකෙන් තේරුම් ගන්න අපි ඒකේ පටිච්ච සමුප්පන්න බව දැකලා නැහැ. අවබෝධ කරලා නැහැ. ලෝකයට අයිති දෘෂ්ටියේදී චෛත්‍ය තියෙනවා. පටිච්ච සමුප්පාදයෙන් දකින කොට ඕක හටගෙන නිරුද්ධ වෙන දෙයක්. අපිට පෙර නොතිබීම හටගත්තා කියලා පෙනෙන්නෙත් නැහැ, ඉතුරු නැතුවම නිරුද්ධ වෙනවා කියන ධර්මතාවය පෙනෙන්නෙත් නැහැ. ඇයි පෙනෙන්නේ නැත්තේ? පටිච්ච සමුප්පාදය දැකලා නැහැ. පටිච්ච සමුප්පන්න බව දැකලා නැහැ. අපි චෛත්‍යට

පැවැත්මක් දීලා තියෙන්නේ. මේ ඇහැට පැවැත්ම දීලා තියෙන්නෙත් අපි. සතර ඉරියව්වේම පවතින ඇහැක්. උපදින කොට ලැබිලා මැරෙන කොට නැතිවෙන ඇහැක්. මේක අපේ තියෙන මෝඩ කමට අපි හිතපු දෙයක්. අවිද්‍යාව නිසා හටගත්ත මෝහයක්.

පටිච්ච සමුප්පාදය දක්කොත් මරණෙන් මිදෙන්න පුළුවන්. නිවන කියන්නේ අජර අමර - ජරාවක්, මරණයක් නැහැ. මේ අවබෝධය සඳහා ධර්‍මය දකින්න ඕනේ. ධර්‍මය කියන්නේ පටිච්ච සමුප්පාදය. හැම සංඛත ධර්‍මයේම පටිච්ච සමුප්පන්න ස්වභාවය දකින්න වෙනවා. චෛත්‍ය කියන්නෙත් සංඛත ධර්‍මයක්. චෛත්‍ය තියෙනවා කියලා දැනගත්තේ හිතෙන්. හිත තමයි දැනුවත් වෙලා තියෙන්නේ චෛත්‍ය තියෙනවා කියලා. විඤ්ඤාණයක් පහළ වෙන්න ඕනේ දැනගන්න නම්. මේක දැනුවත් වුනේ ඇහෙන් - චක්ඛායතනයෙන්. ඇහැක් උපද්දලා තමයි චෛත්‍ය දැක්කේ. තිබුණ ඇහෙන් චෛත්‍ය දැක්කා නෙවෙයි. ලෝකෙට අයිති දැක්ම වෙනස් - මම එනකොට අරන් ආපු ඇහෙන් අතන තියෙන චෛත්‍ය දැක්කා - යනකොට ගෙනියන ඒ ඇහෙන්ම ඒ චෛත්‍ය දකින්න පුළුවන්. ඔය ලෝකෙට අයිති දැක්ම. පටිච්ච සමුප්පාදය දැක්කා නම්, පටිච්ච සමුප්පන්න වුන ඇහැකින්, පටිච්ච සමුප්පන්න වුන චෛත්‍යයක් දැකලා. ඒක දැන් නැහැ, පටිච්ච සමුප්පාදය දැක්කා නම් නිරුද්ධයි. දැක්කේ නැත්නම් තවම තියෙනවා. පටිච්ච සමුප්පාදය දැක්කා නම් අතීත, අනාගත, වර්තමානය යෙදෙන්නේ නැහැ.

උපමා තියෙන්නේ ඕවා තේරුම් ගන්න. වතුරට එබෙන බල්ලා ගේ උපමාව බලන්න. බල්ලා ගහක් යටට ගිහිල්ලා කියන්නේ අන්න වතුරේ බල්ලෙක් ඉන්නවා. අපිත් කියන්නේ අතන චෛත්‍යයක් තියෙනවා. එතනදී ඇහැක් උපද්දවලා බැලුවා, අපි රැවටිලා අල්ල ගෙන තියෙන දේමයි දැක්කේ කියලා හිතුවා. දැන් මෙතන ඉඳන් කථා කරනවා අතන තියෙන චෛත්‍ය ගැන. අර බල්ලත් වතුරට එබිලා ඊළඟට ගහක් යටට ඇවිල්ලා වතුරේ ඉන්න බල්ලා ගැන තමයි දැන් සිහින මවන්නේ. පටිච්ච සමුප්පාදයක් දැක්කේ නැහැ. වතුරට එබෙන බල්ලාට වතුරේ ඉන්න බල්ලෙක්ව හැදිලා තියෙනවා නේ. ඒක විශ්වාස කරන කල් ඒ බල්ලා මොන වගේද කියලා ඇහුවොත් කියයි සතර මහා ධාතු බල්ලෙක්. එහෙම නැත්නම් ලේ, මස්, ඇට ආදියෙන් හැදුනු පන තියෙන බල්ලෙක්

තමයි ඒ ඉන්නේ කියලා. ඒ දෘෂ්ටියේ ඉන්න කල් උඹට ලෝකයට අයිති, පවතින බල්ලෙක් ඉන්නවා. ඒ බල්ලා මම දකින්න කලිනුත් හිටියා, දැනුත් ඉන්නවා, නැවත ගිහින් බැලුවොත් තවම ඉන්නවා. ඔන්න දෘෂ්ටිය. ඒක දෘෂ්ටියක් කියලා පෙනෙනවා නේද? අපි කියනවා ඒ බල්ලා රැවටිලා. ඡායාව හටගන්නේ බල්ලා එබෙන මොහොතේදී. ඒක පෙර නොතිබීමයි හටගන්නේ. ඔළුව අහකට ගන්න කොට ඉතුරු නැතුවම නිරුද්ධ වෙනවා. ඒක යථාභූත තත්වය. නමුත් බල්ලාගේ මානසික තත්වය තමයි මම එබෙන්න කලිනුත් ඔය බල්ලා වතුරේ හිටියා. බලන මොහොතෙත් ඉන්නවා. දැන් නැවත බැලුවොත් ඒ බල්ලාව නැවත දකින්න පුළුවන්. අළුත් බල්ලෙක් නෙවෙයි දකින්නේ. පෙර නොතිබීම හටගන්න බල්ලෙක් නෙවෙයි දකින්නේ. අලුතෙන් ඇහැක් උපද්දලා දැක්කාට හිතන්නේ අර පවතින බල්ලාවම දකිනවා කියලා. දැන් පැවැත්මකුත් දීලා. පටිච්ච සමුප්පන්න වුන බල්ලා - හේතු ප්‍රත්‍යයන් යෙදුන නිසා හටගත්ත ඡායාව. ඡායාව ඡායාව විදියට දැක්කේ නැහැ. දෘෂ්ටිගත වුනා එළියේ ඉන්න රූපයක් කියලා. ඒ රූපයට පැවැත්මක් දුන්නා. අතීතයෙත් තිබුණා, අනාගතයෙත් තියෙනවා, දැනුත් තියෙනවා කියලා. රූපයට පැවැත්ම දීපු ගමන් අහුවුනා. ඒ රූපය  තමයි බල්ලෙක් කියලා අඳුනගත්තේ. ඒ රූපය සංඛත ධර්මයක් කියලා දැක්කේ නැහැ. පටිච්ච සමුප්පන්න වුන ධර්මයක් කියලා දැක්කේ නැහැ. පටිච්ච සමුප්පන්න බව දැක්කා නම් පෙර නොතිබීම හටගත්තා, හේතු යෙදෙන කල් එහෙම පෙනුනා, හේතු නිරුද්ධ වෙනකොට නිරුද්ධයි. බල්ලා අවිද්‍යාවෙන් බල්ලෙක්ගේ රූපයක් හැදුවා. අවිද්‍යාව නැති කෙනාට ඒක යෙදෙන්නේ නැහැ. නිරුද්ධයි. බල්ලාගේ මානසිකත්වයට අවිද්‍යාවයි, මුළාවයි යෙදිලා. එතකොට බල්ලෙක් ඉන්නවා.

ඒ දෘෂ්ටිය. අපට ඒ අවිද්‍යාව යෙදිලා නැහැ. අපි දන්නවා ඒක ඡායාවක් කියලා. එතකොට අපිට ඒ බල්ලාව පිහිටන්නේ නැහැ. නිරුද්ධයි. එක දෘෂ්ටියකින් බලන කොට බල්ලෙක් ඉන්නවා. ඒ දෘෂ්ටිය නැතුව බලන කොට බල්ලා පිහිටන්නේ නැහැ. නිරුද්ධයි. නිරුද්ධයි කියන්නේ හටගන්නේ නැහැ. ඉන්න බල්ලා නැතිවුනා නෙවෙයි. හටගන්න හේතු නැහැ. මුලාවෙන් බලන කොට බල්ලෙක් හටගන්න හේතුටික යෙදිලා. හේතු ටික යෙදෙන කොට ඵලය විද්‍යමානයි. පටිච්ච සමුප්පන්න බව - <u>පච්චයා</u>. අපේ ඒ හේතු ප්‍රත්‍ය යෙදෙන්නේ නැති

හින්දා බල්ලෙක් විද්‍යමාන වෙන්නේ නැහැ. දැඩිව විශ්වාස කරන සතර මහා ධාතු බල්ලෙක් විද්‍යමාන වෙන්නේ නැහැ. අපටත් විද්‍යමාන වෙනවා ඡායාව. අපිට නුවණක් තියෙනවා ඒ ඡායාව පෙර නොතිබීම බලන හින්දම හටගත්ත දෙයක්. ඒක ඉතුරු නැතුවම නිරුද්ධ වෙනවා ඔළුව අහකට ගන්න කොට. ඒ ඡායාව වැටෙන්නේ ගලන ගඟකට නම් අර පෙනෙන ඡායාව එතන තියෙන දෙයක්ද? කලින් වතුර ටිකේ නෙවෙයි ඊළඟට ඡායාව තියෙන්නේ. ගලන වතුරට හඳ එළිය වැටුනහම හඳ එකතැන තියෙනවා කියලා පෙනෙන්නේ. නුවණක් නැහැ වතුර ගලනවා කියලා. හඳේ ඡායාව තියෙන්නේ වේගයෙන් ගලන වතුරක. ඔය ගලන වෙනස් වෙන එකේ අපි පවතින තත්වයක් හදාගෙන. නිරුද්ධ වෙනවා පෙනෙන්නේ නැහැ. අපිට තියෙන්නේ පවතින හඳක්. මීට මොහොතකට කලින් දැක්ක හඳමයි දැන් දකින්නේ. නැවත බැලුවොත් නැවත ඒ හඳමයි පෙනෙන්නේ. ඕක දෘෂ්ටි ගත වීමක් නේද? ඇත්ත ඇති හැටි දැකලා නැහැ නේද? වතුර ටික ගත්තත් ඒ මොහොතේ තියෙන වතුර ටිකේ තියෙන ඡායාව නෙවෙයි තව මොහොතකින් දකින්නේ. අපිට හිතෙන්නේ ඉස්සෙල්ලා එකමයි මේ දකින්නේ කියලා. ඡායාව වැටෙන තිරය තමයි වතුර. තිරය මොහොතක් පාසා වෙනස් වෙනවා. ඕකේ හඳේ ඡායාව වැටිලා තියෙනවා. දැන් අපි නිත්‍ය සංඥාවක් දාගන්නවා පවතින හඳ කියලා. හඳේ තත්වය දකින්න අමාරු නම් තරු එළිය ගන්න. තරු එළිය මෙහාට එන්න අවුරුදු ගණනක් යනවා. අපි දකින කොට ඒක (තරුව) සමහර විට විනාශ වෙලත් ඉවරයි. ඔය ටික නම් අපි වතුරෙන් දකින්නේ, මොන වගේ තත්වයක්ද? දැනට නැති ස්වභාවයක්. තිරයත් වෙනස් වෙනවා, වස්තුවත් වෙනස් වෙනවා.

පහන් දැල්ලක් ගැන හිතන්න. දැල්ලක ඡායාව වතුරේ වැටිලා තියෙන්නේ කියලා හිතන්න. දැල්ල මොහොතක් පාසා වෙනස් වෙනවා නේද? මොහොතකට කලින් තිබුණ දැල්ල නෙවෙයි දැන් තියෙන්නේ. අළුත් තෙල් ටිකක් තමයි දැන් පත්තු වෙන්නේ. ඕක වැටිලා තියෙනවා ගලා යන වතුරේ. දැන් වස්තුවත් වෙනස් වෙනවා, ඒක පතිත වෙන වතුරත් වෙනස් වෙනවා. නමුත් අපිට පහන් දැල්ලක් තියෙනවා. අපි දැල්ලට පැවැත්මක් දෙනවා. අපේ මනසට ඒ රූපය පවතිනවා. ඒක හරියටම අර වතුරට එබෙන බල්ලා එතන බල්ලෙක් හැදුවා වගේ තමයි. නිකං වෙනස් වීමක් තියෙන්නේ. අපි මොකක්දෝ පවතින දෙයක්

හදනවා, ලෝකයක් හදනවා, රූපයක් හදනවා. ඕක වතුරෙන් බැලුවා නම් තේරුම් ගන්න පුළුවන්. තේරුම් ගන්න අපහසු දෙය තමයි අපේ ඇහෙන් මොහොතක් මොහොතක් පාසා කරන්නේ ඔය ටිකමයි. එක පැත්තකින් ඇහේ මේ ආලෝකය නිසා හැදෙන රූප ටික ආලෝක කිරනයක් කිරනයක් ගානේ වෙනස් වෙන දෙයක්. ඊළඟට ඇහේ තියෙන ප්‍රතිබිම්බය හැදෙන තැන ඒ තිරයත් වෙනස් වෙමින් පවතින දෙයක්, අර ගලායන වතුර වගේ. ඕක දකින විඤ්ඤාණයත් අපි දන්නවා වෙනස් වෙනවා කියලා. ක්‍ෂණයක් වත් පවතින්නේ නැති, ඇති වෙලා නිරුද්ධ වෙන විඤ්ඤාණයක්. ඔය තුන හින්දා විද්‍යමාන වෙන දෙයකට තමයි අපි දැන් තියෙනවා කියන දෘෂ්ටියක් ගන්නේ. ඇහෙන් දැකලා මොකක් හරි එළියේ තියෙනවා කියලා කියන්නේ දෘෂ්ටිය. ඇහැ ඇතුලේ හැදුන එකක් දැනගත්තා කියලා කියනවා නෙවෙයි. අපි වතුරට එබිලා වතුරේ හෙවනැල්ලක් ඡායාවක් දැනගත්තා කියනවා නෙවෙයි - අන්න තරුවක් තියෙනවා, හඳ තියෙනවා. ඉතින් ලෝකයට අයිති දේවල් තියෙනවා කියනවා. තියෙනවා කියන අදහස මොකක්ද? අපි බලන්න කලිනුත් මේක තිබුනා, දැනුත් තියෙනවා, අනාගතයේ නැවත ඕනේ නම් අත්දකින්න පුළුවන්. පැවැත්මක් දෙනවා. අනාගතයේ අත්දකිනවා කිව්වේ නැවත ඇහැක් උපද්දලා බැලුවොත් ඒක දකින්න පුළුවන්. අපේ ඕනේ ආයතනයක් ආයේ ඉපැද්දුවොත් ඒකට අදාල අත්දැකීම ගන්න පුළුවන් බාහිර රූපයක් කියන දෘෂ්ටියකයි අපි ඉන්නේ.

ඔය දෘෂ්ටියෙන් තමයි අපි ලෝකය දකින්නේ. බාහිර රූප දකින්නේ. එතකොට ඒ රූපේ පටිච්ච සමුප්පන්න බව දන්නෙත් නැහැ, ඇහේ පටිච්ච සමුප්පන්න බව දන්නෙත් නැහැ, විඤ්ඤාණයේ පටිච්ච සමුප්පන්න බව දන්නෙත් නැහැ. ඔය තුනම වෙනස් වෙන පටිච්ච සමුප්පන්න පෙර නොතිබීම හටගන්න, උපදින සංඛත ධර්‍ම. ඔය තුන එකතු වෙලා දෙන හැඟීමෙන් අපි පැවැත්මක් දෙනවා. ඕක තමයි ඵස්සය කියන්නේ. ඵස්සය අපි විශ්වාස කරනවා. එතකොට ඵස්ස පච්චයා එන දෘෂ්ටි ටිකට අපි වැටෙනවා. ඒවා තමයි මේ 62ක් මිථ්‍යා දෘෂ්ටි කියලා ඒ කාලෙ තිබුනේ, අදත් තියෙන්නේ ඕවා තමයි. පටිච්ච සමුප්පාදය දකින කල් ඵස්ස පච්චයා - ඔය දෘෂ්ටියත් ස්පර්ශය පච්චයෙන් කියන්න පුළුවන් නම්, ස්පර්ශයත් පටිච්ච සමුප්පන්නයි. මේ වෙනස් වෙන ජාති තුනකින් අපි පැවැත්මක් දෙන්න හදන දෙයක්.

ඇහැත් වෙනස් වෙනවා, රූපයත් වෙනස් වෙනවා, විඤ්ඤාණයත් වෙනස් වෙනවා. වෙනස් වෙනවා කියන්නේ තියෙනවා නෙවෙයි. පෙර නොතිබීම හටගන්නවා. ඒ ක්‍ෂණයට හටගත්තා. ඉතුරු නැතුවම නිරුද්ධයි. දැන් කථා කරන්නවත් බැහැ ඒක ගැන. ඒ වුනාට අපි පැවැත්ම දීලා. ඕක තමයි ලෝකයට අයිති දෘෂ්ටිය - පැවැත්ම.

එහෙම බාහිර දෙය තියෙනවා කියපු ගමන් ඒක දකින්න අපේ ඇහැටත් අපි පැවැත්ම දෙනවා. පටිච්ච සමුප්පන්න වුන ඇහැක් නෙවෙයි. කලින් තිබුණ ඇහැ. දැන් ඒ ඇහෙන්ම ආයේ ඕක බලන්න පුළුවන් කියන දෘෂ්ටියට එනවා. එතකොට මතක තියා ගන්න මේ දෘෂ්ටි ගත වෙන්නේ පටිච්ච සමුප්පාද ධර්මය අවබෝධ කරගෙන නැති හින්දා. හේතු ප්‍රත්‍යයෙන් හටගන්න එක හේතු ප්‍රත්‍ය නිරුද්ධ වෙනකොට නිරුද්ධයි කියන ධර්මතාවය දකින්නේ නැති හින්දා. **යං කිංචි සමුදයධම්මං සබ්බං තං නිරොධධම්මං** කියන ධර්මතාවය දකින්නේ නැති හින්දා. ධර්මතාවය දැකීමම තමයි නිත්‍ය සංඥාවෙන් මිදීම. ඔය අවබෝධය එන්න ඕනේ. නැතුව පැවැත්මක් නොදී බලෙන් ඉන්න බැහැ. ඔය අවබෝධයම තමයි සෝවාන් වීම කියන්නේ. පටිච්ච සමුප්පාදය දැකීම තුළින්මයි ඒ අවබෝධය ගන්න පුළුවන්. වෙන විදියක් නැහැ. ඒකයි බුදුරජාණන් වහන්සේ දේශනා කලේ ධර්මය දකින්න ඕනේ නම් පටිච්ච සමුප්පාදය දකින්න. පටිච්ච සමුප්පාදය දැක්කොත් ධර්මය දකිනවා. වෙන විදියක් නැහැ. සක්කාය දිට්ඨිය නැති කරන්න බැහැ පටිච්ච සමුප්පාදය දකින්නේ නැතුව. පටිච්ච සමුප්පාදය දකින කොට ඉබේ වෙන දෙයක් සක්කාය දිට්ඨියෙන් මිදෙන එක. මේවා පෙර නොතිබීම හටගන්න, ඉතුරු නැතුවම නිරුද්ධ වෙන ධර්මතා. ඇහැත් එහෙමයි, ඇහැ නිසා දැනගන්න රූපෙත් එහෙමයි, චක්ඛු විඤ්ඤාණයත් එහෙමයි. ඒ ධර්මතාවය දැක්කොත් ඵස්සයට අහුවෙන්නේ නැහැ. එතකොට දකිනවා මේ ඵස්සය කියන්නේ මේ තුනේ එකතුව, ඵස්ස සමුදය - දැන් සමුදය තමයි ඒ පෙනෙන්නේ. සමුදය ඇත්ත ඇති හැටියට දකින කොට ඵස්ස නිරෝධය. දැන් තියෙන්නේ නිරෝධ කරන මාර්ගය හොයාගන්න එක. හොයාගත්තොත් සම්මාදිට්ඨිය ඇති වෙනවා. ලෝකෝත්තර සම්මාදිට්ඨිය. සම්මාදිට්ඨිය ඇති කර ගත්ත කෙනාට තමයි මාර්ගයයි, ඵලයි තියෙන්නේ. සම්මාදිට්ඨිය ඇති කර ගත්තොත් මාර්ගයට වැටුනා. මාර්ගයට වැටිලා මාර්ගය වැඩෙන කොට ඵල ලැබෙනවා.

දැන් ධර්මය තියෙනවා - ධර්මය කියන්නේ පටිච්ච සමුප්පාදය - පටිච්ච සමුප්පාදය දාන්න රැවටෙන තැන් වලට. පැවැත්ම දෙන දේවල් වලට. ලෝකයට අයිති දෙයක් නම් ඒක සංඛත ධර්මයක්. හේතු ප්‍රත්‍යයන්ගෙන් හටගන්න පටිච්ච සමුප්පාද ධර්මයක්. පටිච්ච සමුප්පාදය කියන කොට තේරුම් ගන්න ඕනේ පෙර නොතිබීම හටගත්තේ. හේතු ප්‍රත්‍යයන් යෙදෙන නිසාමයි හටගත්තේ. ඉතුරු නැතුවමයි නිරුද්ධ වෙන්නේ. ලෝකයට අයිති දෘෂ්ටියේ ඉඳන් මේක දකින්න බැහැ. ලෝකෝත්තර - මේ ඇහැ ඉක්මවා යන දැක්මට එන්න ඕනේ. ඇහැ කියන්නෙත් තියෙන ධර්මතාවයක් නෙවෙයි පටිච්ච සමුප්පන්න දෙයක්. නිරුද්ධ වුන ධර්මය නැවත මතක් කරනවා කියන්නේ පැවැත්ම දුන්නා. මනසෙන් දෙනවා පැවැත්ම. ඒ පැවැත්ම දෙන්නේ ඒක මතක් කර ගන්න නිමිත්තක් ඉතුරු කරගත්ත හින්දා. නිරුද්ධ වුනාට අපි සටහනක් ඉතුරු කර ගන්නවා නැවත මතක් කරගන්න. ඇත්ත තත්වය ඒක ඇති වෙලා නිරුද්ධ වුනා. ඒ වුනාට අපි ඕකේ සටහනක් ඉතුරු කරගන්නවා නැවත මතක් කරගන්න. ඒකමයි වැරැද්ද. සටහන ඉතුරු වෙන්නේ ඇත්ත ඇති සැටියෙන් දන්නේ නැති හින්දා. පටිච්ච සමුප්පන්න බව දකින්නේ නැති හින්දා. නිමිති ගන්නේ නැති දවස ආවොත් තවත් කළ යුත්තක් නැහැ. **චක්ඛුනා රූපං දිස්වා නිමිත්තග්ගාහි හොති** - ඇහෙන් රූප දැකලා නිමිති ඉතුරු කරගන්නවා. නිමිති ඉතුරු කරගන්නවා කියන්නේ පැවැත්ම දුන්නා. නිමිති පිහිටන්නේ ධර්මතාවය දකින්නේ නැති හින්දා. ඒවා පටිච්ච සමුප්පන්න බව දකින්නේ නැහැ. හේතු ඵල හටගැනීම දකින්නේ නැහැ. දැන් දරුවා කියන කොටම නිමිත්ත පහළ වෙලා ඉවරයි. හිතේ තියෙන සටහන පෙනෙනවා. නිරුද්ධ වෙලා නැහැ, හටගත්තා. නිමිති දාගත්තාම අපි ඒ නිමිති අලුත් කරගන්න උත්සාහ කරනවා. බලාපොරොත්තු විදියට නැත්නම් දුකයි. පැවැත්ම දුන්න නිමිත්ත වෙනස් වෙනවාට කැමති නැහැ. නියම හේතුව ඒක පහළ වීමම දුකයි. ඒ වුනාට අපි ඒක පහළ කරගන්නේ සැපයි කියලා හිතලා. දුක් දෙය සැප විදියට පෙනෙන හින්දා තමයි අපි ඒක ඉතුරු කර ගන්නේ.

අපි හැමෝම කැමතියි සැප විඳින්න. දරුවෙක් හින්දා සැප විඳින්න තමයි කැමති. හැබැයි විඳින දුක් ඔක්කෝම විඳින්නේ දරුවා හින්දා. ඔය දරුවා නැති වුනා නම් ඔය දුක් එකක් වත් නැහැ. සැප කියන්නේ තනිකර මුලාව, මෝඩකම. ඇත්ත ඇති හැටියට දකින්නේ

නැති කම. ඕකේ ඇත්ත තත්වය දුකයි. දරුවා කියන එක හදා ගත්තේ නැත්නම් ඒ දුක එහෙමම නිරුද්ධයි. දරුවා නිසා එන දුක් කන්දරාවම නැහැ. අපි හිතන්නේ දරුවා ඉන්න එක තමයි සැප කියලා. ඊට පස්සේ ලෙඩ වෙනකොට අඬනවා, මැරුනා කියලා අඬනවා. අඬන්නේ භාරගත්ත හින්දා. මේ ලෝකයට එනකොට ඔය දරුවා අරන් ආවද? නැහැ, ඊට කලින් කොහේ හිටියද දන්නේ නැහැ. තරහකාරයෙක්ද දන්නේ නැහැ. මෙහේ ආවාට පස්සේ අල්ල ගත්තා. මැරුනාට පස්සේ අරන් යන්නෙත් නැහැ. සමහරු නම් පෙරේත ලෝකෙට අරන් යන්නත් බලන් ඉන්නවා. ගෙනියන්නත් බැහැ. ඉතින් මේ ඉන්න ටිකට අල්ලගෙන පැවැත්මකුත් දීලා ඊට පස්සේ අඬනවා. මේක තමයි සෝක පරිදෙව දුක්ඛ දෝමනස්ස උපායාස. මේ පහළ වීමම - ජාති - ඒකම දුකයි කියලා දැක්ක කෙනා නිමිති ඉතුරු කරගන්නේ නැහැ. ඒ තමයි පටිච්ච සමුප්පාදය දැක්ක කෙනා. ඒක දුකයි කියලත් දකිනවා, දුකට හේතුවත් දකිනවා. හේතුව දකින කෙනා නිරෝධයත් දකිනවා. දුක නැවත ඇති වෙන්නේම නැහැ කියලා දකිනවා. එයා මාර්ගය දකිනවා, ලෝකෝත්තර සම්මා දිට්ඨිය ඇති කර ගන්නවා. ලෝකෙන් මිදෙන සම්මා දිට්ඨිය. නැත්නම් ලෝකෙට අයිති ඒවා තව තවත් එකතු කර ගන්නවා. නිමිති ගොඩගහ ගන්නවා. ලෝකෝත්තර කෙනා දකිනවා මේ සියල්ලම පටිච්ච සමුප්පන්න, වෙනස් වෙන දේවල් කියලා. ඒවායින් හදන දෙයට කොහොමද අපි පැවැත්මක් දෙන්නේ. අර ගලා යන වතුරේ පෙනෙන පහන් දැල්ලට පවතිනවා කිව්වා වගේ දෙයක්. දැල්ලත් වෙනස් වෙලා, වතුරත් වෙනස් වෙලා, අපේ ඇහැට එන කොට ඒ රූපෙත් වෙනස් වෙලා. ඒත් අපි කියනවා ඒක තියෙනවා කියලා. පැවැත්ම දෙනවා. පැවැත්ම දීලා අල්ල ගන්නවා.

ඔය විදියට තමයි මේ ලෝකෙට අයිති හැම දේම අපි පැවැත්මක් දීලා අල්ලගෙන තියෙන්නේ. ඒ ධර්මතාවය ටිකක් නුවණින් විමසමින් හිටියොත් ආයතනයත් පටිච්ච සමුප්පන්නයි කියපු ධර්මතාවය දකින්න පුළුවන් වෙනවා. සලායතනත් පටිච්ච සමුප්පන්නයි. සලායතනය කියන්නේ පටිච්ච සමුප්පාදය නෙවෙයි. පටිච්ච සමුප්පන්න ධර්ම. අවිද්‍යාව, සංඛාර, විඤ්ඤාණය, නාමරූප, සලායතන - මේ සේරම පටිච්ච සමුප්පන්න ධර්ම. පටිච්ච සමුප්පාද බව දැක්කේ නැති නිසාම පැවැත්මක් දීපු ධර්මතා. ඕවායේ පටිච්ච සමුප්පන්න බව දැක්කා නම් ඒ

ධර්මතා ඔක්කෝම හටගන්නේම නැහැ. නිරුද්ධයි. සමුදය දැකලා නිරුද්ධ වෙනවා. එතකොට පටිච්ච සමුප්පාදයෙනුත් මිදෙන්න පුළුවන්. පටිච්ච සමුප්පන්න ධර්මතා ටික නැති වෙනකොට දිට්ඨෙ දිට්ඨමත්තං මට්ටමට එන්න පුළුවන්. ලෝකෙට අහුවෙන්නේ නැහැ. ආයතන වලට අහුවෙන්නේ නැහැ. පැවැත්මක් දෙන්නේ නැහැ. පටිච්ච සමුප්පන්න බව දකිනවා. පටිච්ච සමුප්පාදය කියන එක ටිකක් ගැඹුරු දෙයක් නමුත් දකින්න බැරි දෙයක් නෙවෙයි. මේ පටිච්ච සමුප්පන්න ධර්මතා ටික - අංග 12 - අවිජ්ජා, සංඛාර, විඤ්ඤාණ, නාමරූප, සළායතන, ඵස්ස, වේදනා, තණ්හා, උපාදාන, භව, ජාති, දුක් - ඔය 12 පටිච්ච සමුප්පන්න ධර්මතා, අවිද්‍යාව නිසාම හටගන්නවා, අවිද්‍යාව නැතිවෙන කොට නිරුද්ධ වෙනවා. ඔය 12ම එක මොහොතේ හටගන්නේ. අවිද්‍යාව තියෙන කොට විද්‍යමානයි අවිද්‍යාවේ ඉඳන් දුකට යනකල් සේරම ටික. අවිද්‍යාව පිහිටුවේ නැත්නම් ඔය 12ම නැහැ. ඒ මොහොතේමයි නිරුද්ධ වෙන්නේ. මේක කාල පරතරයකට - අතීත, අනාගත, වර්තමාන කියලා දාන්න ඕනේ නැහැ. එහෙම දාන්නේ මුළාව හින්දා. පටිච්ච සමුප්පාදය දැක්කේ නැති හින්දා. මෙහිදී ටිකක් පරිස්සම් වෙන්න වෙනවා මොකද කාලෙට දාපු පැහැදිලි කිරීම් තමයි දැන් අහන්න ලැබෙන්නේ. තමන් තේරුම් ගන්න ඕනේ දකින්න ඕනේ ධර්මතාවය මොකක්ද කියලා. පටිච්ච සමුප්පාදය එක මොහොතේ හටගෙන එක මොහොතේ නිරුද්ධ වෙන ධර්මතාවයක්. භාගෙට කඩලා ගන්න ගියොත් තමයි පටලවා ගන්නේ. අපි හිතන්නේ තණ්හාවයි උපාදානයයි නැති කරලා ඉතුරු ටික (විඤ්ඤාණ, නාමරූප, සළායතන, ඵස්ස, වේදනා) එහෙමම තියෙනවා කියලා. නුවණින් බලන්න ඒක වෙන දෙයක්ද කියලා.

පටිච්ච සමුප්පාදයේ පැහැදිලිව කිව්වා නම් වේදනා පච්චයා තණ්හා කියලා, වේදනා නිරෝධා තණ්හා නිරොධො කිව්වා නම් වේදනාව තියෙද්දී තණ්හාව විතරක් නැති කරන්න බැහැ. නැතිවෙනවා නම් ඒ දෙකම - පටිච්ච සමුප්පන්න කියන්නේ ඒකයි. දෙපැත්තම තියෙනවා නම් තියෙනවා, නැත්නම් නැහැ. එක පැත්තක් නැති කරන්න බැහැ අනිත් පැත්ත ඉතුරු කරගෙන. ඔය ධර්මතාවය ගැඹුරින් දකින්න ඕනේ දෙයක්. එහෙම නැත්නම් අපි දෘෂ්ටිගත වෙනවා - රහතන් වහන්සේගේ මේ ටික තිබුණා, මේ ටික විතරයි නැති වුනේ. දුකේ කෑල්ලක් ඉතුරු වුනා පිරිනිවන්පාන කල්. රහතන් වහන්සේත් වේදනා

වින්දා, බුදුරජාණන් වහන්සේත් වේදනා වින්දා, වයසට ගියා, ලෙඩ වුනා - එහෙම තමයි ලෝකෙට අයිති දෘෂ්ටියෙන් පෙනෙන්නේ. ඇයි ඒ? අපි අයිති කරලා - රහතන් වහන්සේගේ ශරීරය, බුදුරජාණන් වහන්සේගේ ශරීරය. ඒ ආර්ය උත්තමයෝ ඒවා අතහැරලා ඉවරයි. අපි තමයි අයිති කරලා තියෙන්නේ ශරීරයට වෙන දේවල් රහතන් වහන්සේට වෙනවා කියනවා. ලෝකෝත්තර ස්වභාවය මේ ලෞකික දෘෂ්ටියෙන් දකින්න ගියොත් දකින්න බැහැ. ඒ මට්ටමෙන් හිතන්න ඕනේ. ඒක (ශරීරය) අතහැරියාට පස්සේ ඒකට මොනවා වුනත් නැවත දුකක් නැහැ. ඒක ඉතුරු නැතුවම අතහැරලා ඉවරයි. අතහැරපු දේ වයසට යනවා, ලෙඩ වෙනවා, මැරෙනවා කියලා අයිති කරන්න ගියාට හරි යන්නේ නැහැ. ඒක අල්ලගෙන ඉන්න කල් විතරයි ඒ නිසා දුකක් හටගන්නවා නම් තියෙන්නේ. රහත් වෙනවා කියන්නේ, නිවන කියන්නේ එතන සම්පූර්ණයි - අජර, අමර. ජාතියක්, ජරාවක්, ව්‍යාධියක්, මරණයක් නැති තත්වයක්. ඒක පිරිනිවන් පෑම නෙවෙයි, රහත් වීම. නිවනේ කොටස් දෙකක් නැහැ - වචන දාගෙන මේක තේරුම් කරන්න බැරි හින්දා කියන්න හැදුවාට, නිවන කියන්නේ දුක ඉතුරු නැතුව නිරුද්ධ කිරීම. පොඩ්ඩක් ඉතුරු වෙලා නිරුද්ධ කිරීමක් නෙවෙයි. ඒක අපේ අවබෝධයේ අඩුවක් මිසක් ධර්මයේ ප්‍රශ්නයක් නෙවෙයි. නිරෝධා කියලා යම්කිසි දෙයක් කිව්වා නම් නිරෝධයි. ජීවත් වෙන කාලේ කොටසක් ඉතුරු වෙනවා, මැරුනාට පස්සේ ඉතුරු ටික යනවා - එහෙම කථාවක් නෙවෙයි. ඒක අපේ අවබෝධයේ අඩුවක් හින්දා කියන කථාවක්. පටිච්ච සමුප්පාදය තේරුම් නොගැනීම තුළම කියන කථාවක්. මේ ධර්මය දකින කොට පෙනෙයි මේකේ කිසිම පැටලෙන තැනක් නැහැ. කාලයට, සම්මතයට දාගන්න ගියොත්, ලෝකෙට අයිති දෘෂ්ටි වලට දාගන්න ගියොත් එතකොට පැටලෙනවා. දකින්න ඕනේ ඔය පටිච්ච සමුප්පාද ධර්මයමයි කියන එක පැහැදිලි වෙයි. මේ අහගත්ත ධර්මය තමන් තුළින් හොයන්න. ධර්මයට, විනයට ගැලපෙනවාද කියලා බලන්න. එතකොට අවබෝධයක් තුළින් ඒක ලබාගන්න පුළුවන් වෙයි.

************************

2013 අගෝස්තු 17 වැනි දින සුභද්‍රාරාමයේදී
මහාචාර්ය රවී කොග්ගලගේ මහතා විසින් පැවැත්වූ ධර්ම සාකච්ඡාව

# පටිච්ච සමුප්පාදය සහ සක්කාය දිට්ඨිය

පටිච්ච සමුප්පාදය තමයි ධර්මය කියන්නේ. බුදුරජාණන් වහන්සේගේ වචන වලින් කියනවා නම් යම් කෙනෙක් පටිච්ච සමුප්පාදය දකියි ද ඔහු ධර්මය දකියි. **යො පටිච්ච සමුප්පාදං පස්සති සො ධම්මං පස්සති.** සත්වයා සසරට බැඳල තියෙන දේවල් වලට තමයි සංයෝජන කියන්නේ. සංයෝජන තියෙන කල් නැවත නැවත ඉපදි ඉපදී මැරි මැරී සසරේ යනවා. සංයෝජන - සසරට බැඳලා තියෙන බැමි - ඒවා දහයක් තියෙනවා. ඒවා කැඩෙන්නේ මාර්ගඵල ලැබීමේදී. සෝවාන් වෙනකොට සංයෝජන තුනක් කැඩෙනවා. සක්කාය දිට්ඨිය, විචිකිච්චාව, සීලබ්බතපරාමාසය - බැඳලා තියෙන බැමි දහයෙන් තුනක්. ඊළඟට තියෙනවා කාමරාග (ඇලීම් පැත්ත), පටිඝ (ගැටෙන බව). මේවාට ලෝභ, ද්වේශ කියලත් කියන්න පුළුවන්. සක්කාය දිට්ඨිය, විචිකිච්චාව, සීලබ්බතපරාමාස කඩා ගත්ත පුද්ගලයා (සෝවාන් පුද්ගලයා) ඊළඟට බලන්නේ කාමරාග, පටිඝ සංයෝජන දෙක දුරු කරන්න. ඒක එක පාරට බැහැ, අවස්ථා දෙකකදී දුරු වෙන්නේ. ඊළඟ ඵලයේදී - සකදාගාමී ඵලයේදී කාමරාග, පටිඝ දෙක තුනී වෙනවා. 50%ක් විතර අඩු වෙනවා. ඊළඟ ඵලයේදී - අනාගාමි වෙනකොට කාමරාග, පටිඝ සම්පූර්ණයෙන් දුරු වෙනවා. ලෝභ ද්වේශ සම්පූර්ණයෙන් නැහැ කියන්නේ අනාගාමි වෙනකොට. ඇලීම් ගැටීම් ටිකක් වත් නැහැ කියලා කෙනෙක් ප්‍රකාශ කරනවා නම්, ඒ කියන්නේ ඇත්තක් නම්, එයා අනාගාමි වෙන්න ඕනේ. සෝවාන් කෙනාගේ කාමරාග, පටිඝ (ඇලීම්, ගැටීම්) දුරුවෙලා නැහැ. ඒ නිසා තමයි සෝවාන් පුද්ගලයෙකුට සාමාන්‍ය ජීවිතයේ ඉන්න පුළුවන්. විශාකාව අවුරුදු 7දී සෝවාන් වුනා. එතකොට සක්කාය දිට්ඨිය, විචිකිච්චාව, සීලබ්බතපරාමාසය සම්පූර්ණයෙන් දුරු වුනා. කාමරාග, පටිඝ දුරුවුනේ නැහැ. ඒ නිසා තමයි ගිහි ජීවිතයේ ඉඳලා ළමයි 20ක් හදන්න පුළුවන් වුනේ. මිනිබිරියක් මැරුණු වෙලාවේ ඇඬුවේ ඇලීම නිසා. ඇලුම් කරපු දෙය නැති වුනාම අඬන්න වෙනවා - සෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස. ඇලීම්, ගැටීම් තියෙන කෙනාට අඬන්න, වැලපෙන්න සිද්ධ වෙනවා. සෝවාන් වුනාට කෙනෙක් දුක්වෙන එකෙන්

ගැලවිලා නැහැ. සාමාන්‍ය කෙනාට වඩා දුක අඩු වෙන්න පුළුවන්. නමුත් අටලෝ දහමට අහුවෙනවා - සැප/දුක, නින්දා/ප්‍රශංසා, යස/අයස, ලාභ/අලාභ - ඒවායින් සැලෙනවා. දුක් වෙනවා කියන්නේ ඒකයි.

සක්කාය දිට්ඨිය තියෙන නිසා තමයි මම පෙර භවයේ හෝ අතීතයේ වූයෙම්ද, නොවූයෙම්ද, කවරෙක් වූයෙම්ද, කෙසේ වූයෙම්ද, කවරෙක්ව සිට කවරෙක් වූයෙම්ද - මෙහෙම හිතෙනවා නම් ඒ සක්කාය දිට්ඨිය. මම අනාගතයේ වෙම්ද, නොවෙම්ද, කවරෙක් වෙම්ද, කෙසේ වෙම්ද, කවරෙක්ව සිට කවරෙක් වෙම්ද - ඔය වගේ හිතෙනකොටත් ඒකත් සක්කාය දිට්ඨිය. දැන් වර්තමානයේ මම වෙම්ද, නොවෙම්ද, කවරෙක් වෙම්ද, කෙසේ වෙම්ද, කොහේ සිට ආවේද, කොහේ යන්නේද - එහෙම හිතෙනවා නම් ඒකත් සක්කාය දිට්ඨිය. ඔහොම කියන කොට හිතෙනවා නේද මොනවටද පින් කරන්නේ - අනාගතයේ දිව්‍ය ලෝකයේ යන්න, නැත්නම් මනුෂ්‍ය ලෝකයේම ඉන්න. මේ කියන්නේ විවේචනය කරන්න නෙවෙයි, ධර්මයට අනුව තමන්ට තමන්ව මැන ගන්න. මෙහෙම හිතෙනවා නම් ඒක සක්කාය දිට්ඨිය. ඒක ධර්මයේ පැහැදිලිව තියෙනවා. සක්කාය දිට්ඨිය නැති කරන ප්‍රතිපදාවේ හිටියත් සතර අපායෙන් ගැලවිලා. එහෙම වුනොත් සතුටු වෙන්න පුළුවන් බුදු දහමෙන් ප්‍රයෝජනයක් ගත්ත කියලා. එහෙම නැතුව බෞද්ධ කිව්වාට ප්‍රයෝජනයක් ගත්තේ නැහැ. ඒ කියන්නේ සතර අපායෙන් නිදහස් වෙලා නැහැ. තිස් එක් තලයෙන් ඕනෑම තැනක ඉපදෙන්න පුළුවන්. සක්කාය දිට්ඨිය ඇති වෙන්නේ කොහොමද කියලා හොයා ගන්න ඕනේ. සක්කාය දිට්ඨිය කියන්නේ මොන වගේ දෙයක්ද කියලා තේරුම් ගන්න ඕනේ. මේ මොහොතෙත් පස් ආකාරයකට සක්කාය දිට්ඨිය ඇතිවෙන්න පුළුවන් කියලා දේශනාවේ තියෙනවා. අතීතයේ, අනාගතයේ සහ වර්තමානයේ මෙහෙම වෙන්න පුළුවන්. මේ ධර්ම කරුණු ඉතාම සියුම්.

විසි ආකාර සක්කාය දිට්ඨියක් ගැනත් සඳහන් වෙනවා. පංච උපාදානස්කන්ධයේ එක අංගයක් තුළින් හතර ආකාරයකට සක්කාය දිට්ඨිය ඇති වෙන්න පුළුවන්. රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ නිසා හතර ආකාරයකට සක්කාය දිට්ඨිය ඇති වෙන්න හැකියාව තියෙනවා. හතරම තියෙනවා නෙවෙයි, එකකින් ඇති වුනොත් ඇති. රූපය මමයි කියලා හිතුනා නම් ඒ ඇති සක්කාය දිට්ඨිය ඇතිවෙන්න.

මම රූපවන්තයි, මම තමයි මේ ශරීරය, මේ ශරීරය තුළ මම ඉන්නවා, නැත්නම් මා තුළ ශරීරය තියෙනවා - එහෙම එක විදියකට හිතුනොත් ඇති සක්කාය දිට්ඨිය ඇතිවෙන්න. සංයෝජන තුනෙන් ප්‍රබලම එක තමයි සක්කාය දිට්ඨිය. සක්කාය දිට්ඨිය නැති වෙනකොට අනිත් දෙකත් නැති වෙනවා. විචිකිච්ඡාව - සැකය නැති වෙනවා. සීලබ්බතපරාමාස වලට වැටෙන්නෙත් නැහැ. මේ ජීවිතයේ කරපු හැම දෙයක්ම කරලා තියෙන්නේ තමන්ව සතුටු කරන්න. ඉදිරියට කරන්නෙත් ඕක තමයි. තමන් අල්ල ගත්ත අයව සතුටු කරනවා කියන්නේ තමන්ව සතුටු කරනවා. මේ අනුන්ට කරනවා කියන එක ගැඹුරින් බලන කොට තමන්ව රවටා ගැනීමක් විතරයි. වංචනික ධර්ම වලින් අපව රවට්ටනවා. මේවා නුවණින් හිතන්න ඕනේ. බුදු දහම තියෙන්නේ ප්‍රඥාවන්තයින්ට. මගේ කියන එකෙන් මිදෙන්න අපි හිතන තරම් ලේසි නැහැ. ප්‍රඥාවෙන් දකින්න ඕනේ. බුදු කෙනෙක් සසරේ යන සත්වයා ගැන අනුකම්පාවෙන්මයි ඇත්ත ඇති හැටියෙන් දැකලා මේවා පෙන්නලා දෙන්නේ. බුදුහාමුදුරුවෝ පෙන්නලා දෙනවා කොච්චර පින් කළත් විඳින්න වෙන්නේ දුකමයි කියලා. සසරේ කොහේ ඉපදුනත් දුකෙන් ගැලවිලා නැහැ. සාපේක්ෂව දුකේ අඩුවක් තියෙයි. අද හොඳට ඉන්නවා හෙට මහා භයානක ලෙඩක් නොහැදී තියෙන්නේ නැහැ. මේ තමයි අපි ලබාගත්ත ශරීරයේ හැටි.

දිට්ඨිය කියන්නේ දෘෂ්ටියක් - වැරදි මතයක්. සක්කාය (ස්ව කාය) ගැන තියෙන වැරදි දෘෂ්ටියක්. වැරදි දෘෂ්ටියෙන් හරි දෘෂ්ටියකට එන එක තමයි සක්කාය දිට්ඨිය නැතිවෙනවා කියන්නේ. මෙතන මම කියලා කෙනෙක් ඉන්නවා කියලා වැරදි දෘෂ්ටියක ඉන්නවා. එයාට තමයි අයිති කරගන්නේ මගේ කියලා. මාව සතුටු කරන්න තමයි මේ හැම දෙයම කරන්නේ. පිනක් කළත් කරන්නේ මාව සතුටු කරන්න. ඒකත් තේරුම් ගන්න. අපි කර්මඵල විශ්වාස කරනවා. ඒ නිසා පව් කළොත් දුක් විඳින්න වෙනවා, පින් කළොත් සතුටෙන් ඉන්න පුළුවන් කියලා දන්නවා. අපි හොඳ විපාක ලබන්න කැමතියි. ඒ නිසා තමයි සාමාන්‍යයෙන් ආගමක් දහමක් අදහන අය පව් කරන්න බය. පින් කරන්න අමාරු වුනාට කරන්න කැමතියි ඒවාට හොඳ ප්‍රතිඵල ලැබෙන නිසා. මේක සාමාන්‍යයෙන් හැම ආගමකම (මහා මිථ්‍යා දෘෂ්ටික ආගම් හැර) විස්තර කරනවා . මේ දෘෂ්ටිය නැති පිරිසකුත් ඉන්නවා, මේ ජීවිතය විතරයි,

මරණින් පස්සේ මොනවත් නැහැ කියන අය. නියත මිථ්‍යා දෘෂ්ටිය කියන්නේ කෙලින්ම අපාගත වීමක්. කර්මඵල විශ්වාස කරන සම්මාදිට්ඨිියවත් ඒ අයට නැහැ. මනුෂ්‍ය ජීවිතයක් ලබන්න පින් කරලා තිබිලත්, කුසල ශක්තිය, නුවණ තිබිලත් බොහොම භයානක තත්ත්වයක්. ඒ අය ගැන අනුකම්පා කරන්න ඕනේ. කර්මඵල ගැන විශ්වාසයක් නැති වුනොත් ඒක නියත මිථ්‍යාදෘෂ්ටියක්.

කර්මඵල ගැන විශ්වාස කිරීමත් එක්තරා සම්මාදිට්ඨියක්. ඉපදෙමින් මැරෙමින් යන සංසාරය සැපවත් කරගන්න පුළුවන් සම්මාදිට්ඨිය තියෙන කෙනාට. නරක තැනක ඉපදුනත් පින් බලවත් නිසා එතන වැඩිකලක් ඉන්නේ නැහැ. ඒකට කියනවා කම්මස්සකතා සම්මාදිට්ඨිය කියලා. කම්මස්සකතා සම්මාදිට්ඨිය තියෙන අයට පුළුවන් ඊළඟට සසරින් ගැලවෙන නිවන් මාර්ගයට, එහෙම නැත්නම් ලෝකෝත්තර මාර්ගයට වැටෙන දැක්මක් ඇති කරගන්න. ඒකට කියනවා ලෝකෝත්තර සම්මාදිට්ඨිය. ඉස්සෙල්ලා කිව්වේ ලෞකික - මේ ලෝකයට අයිති සම්මාදිට්ඨිය. ලෝකෝත්තර සම්මාදිට්ඨියට කියනවා චතුසච්ච සම්මාදිට්ඨිය. චතුරාර්ය සත්‍ය ගැන අවබෝධයෙන් එන සම්මාදිට්ඨිය. දුක, දුකට හේතුව, දුක්ඛ නිරෝධය, මාර්ගය ගැන යම්කිසි අවබෝධයකින් එන සම්මාදිට්ඨියකුත් තියෙනවා. කර්මඵල විශ්වාසයේදී දුක මොකක්ද කියන එක ගැන ගැඹුරු අවබෝධයක් නැහැ. එයාට දිව්‍ය ලෝකයට ගියොත් ඇති. නමුත් දුක පිරිසිඳ දැක්ක කෙනාට දිව්‍ය ලෝකයට ගියත් සංසාරයේම ඉන්නේ කියන නුවණ එනවා. පින් විතරක් නෙවෙයි කරපු පව් වලටත් විපාක දෙනවා. මේ ජීවිතයේ විතරක් නෙවෙයි සංසාරයේ කරපු පව් තියෙනවා. අනිවාර්යයෙන් හොඳ විපාක විතරක් නෙවෙයි අපව දුකට පත් කරන විපාකත් විඳින්න වෙනවා සංසාරයේ යනවා නම්. සංසාරය දුකයි කියලා බුදු කෙනෙක් සර්වඥතා ඥාණයෙන් දැකලාම දේශනා කරන්නේ ඒකයි. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා මම කිසිවෙකු භය කරන්න කියන දෙයක් නෙවෙයි. භය කරලා බුදු දහමට පිරිස එකතු කරගන්න අවශ්‍යතාවයක් නැහැ. ඇත්ත ඇති සැටියෙන් දැකලා, මේ දුක් විඳින සත්වයා කෙරෙහි අනුකම්පාවෙන් කවුරු හරි මේ දුකෙන් මිදෙයි කියන අදහසින් දේශනා කරන දෙයක් මිසක් වර්ණනා කරලා මිනිස්සු මුළා කරලා බුදු දහමට ගන්න අදහසකින් කියන දේවල් නෙවෙයි. දේවදූත සූත්‍රයේ අපාය ගැන විස්තර කරන්නේ ඇත්ත ඇති

සැටියෙන් දකලාමයි.

ඒවා පෙන්වන්නේ මෙකෙන් මිදෙන්නත් විදියක් තියෙනවා කියලා පෙන්වන්න. උත්සාහයක් ගන්න, නුවණ තියෙන කෙනාට මිදෙන්නත් විදියක් තියෙනවා. කර්මඵල විශ්වාස කරන කෙනාට ලේසියි ඒකෙනුත් මිදෙන්න. පින් පව් කළාට සසරින් ගැලවෙන මාර්ගයට වැටිලා නැහැ. ලෞකික ජීවිතය සැපවත් කරන මාර්ගයේ ඉන්නවා. ඒක විතරක් කළාට මදි. මේ මනුෂ්‍ය ජීවිතයේදී බුදු දහමින් ප්‍රයෝජනයක් ගන්න නම් එතනින් එහාට කරන්න දෙයක් තියෙනවා. ඒ තමයි ලෝකෝත්තර සම්මාදිට්ඨිය ඇති කරගෙන ලෝකෝත්තර මාර්ගයට වැටෙන එක. මේක තමයි සෝවාන් වෙන මාර්ගයටවත් අඩු තරමින් වැටෙනවා කියන්නේ. ඒක නැතුව වෙන මොනවා කළත් බුදු දහමින් ප්‍රයෝජනයක් ගත්තා වෙන්නේ නැහැ. කර්මඵල විශ්වාස කර්ම නියාමයට අයිතියි. ඒවා ඒ මොහොතේම විපාක නොදුන්නත්, අවස්ථාව පැමිණුනාම විපාක දෙනවා. දානයක් දීපු ගමන්ම අනිත් පැත්තට විපාක ලැබෙන්නේ නැහැ වගේ.

අපි නුවණින් සක්කාය දිට්ඨිය නැති කරන මාර්ගය, නැත්නම් ලෝකෝත්තර සම්මාදිට්ඨිය කියන්නේ මොකක්ද කියන දෙය හොයන්න ඕනේ. මේක ධර්මයේ සඳහන් වෙනවා. විශේෂයෙන් සම්මාදිට්ඨි සූත්‍රය කියලා වෙනම සූත්‍රයක් සැරියුත් හාමුදුරුවෝ දේශනා කරලා තියෙනවා. ඒ සූත්‍රයේ පටිච්ච සමුප්පාදයේ එක එක අංග අරගෙන මේ හැම අංගයක්ම හතර ආකාරයකට දානවා. අවිද්‍යාව ගත්තොත් - අවිද්‍යාව කියන්නේ මොකක්ද, අවිද්‍යා සමුදය (අවිද්‍යාවට හේතුව) මොකක්ද, අවිද්‍යා නිරෝධය කියන්නේ මොකක්ද, නිරෝධ කරන මාර්ගය මොකක්ද. චතුරාර්ය සත්‍යයට ගැලපුවා. මේ ගැන අවබෝධයෙන් කෙනෙක් සම්මාදිට්ඨිය ඇති කරගන්නවා. මේ විදියට පටිච්ච සමුප්පාදයේ අංග වලට යෙදෙනවා. කෙනෙක් දුක පිරිසිඳ දැකීමෙනුත් සම්මාදිට්ඨිය ඇති කරගන්නවා. තවත් අංග ටිකක් තියෙනවා - කුසලය, කුසල මූලය, අකුසලය, අකුසල මූලය අවබෝධ කිරීමෙනුත් සම්මාදිට්ඨිය ඇති කරගන්න පුළුවන්. ආහාරය, ආහාර සමුදය, ආහාර නිරෝධය, නිරෝධ කරන මාර්ගය ගැන අවබෝධ ඇති කරගැනීමෙනුත් සම්මාදිට්ඨිය ඇති කරගන්න පුළුවන්. මෙතනට සතර ආහාරයම අයිතියි - කබලිංකාරාහාර, ඵස්සාහාර, මනෝසංචේතනාහාර, විඤ්ඤාණාහාර.

මේ දැනීමෙනුත් ලෝකෝත්තර සම්මාදිට්ඨිය ඇති කර ගැනීමේ හැකියාව තියෙනවා.

රෝහිතස්ස සූත්‍රයේ කෙනෙක් යනවා ලෝකයේ කෙළවර හොයාගෙන ඍධියෙන්. හොයාගන්න කලින් ඔහු මැරෙනවා. ලෝකය ඉවර වෙන්නේ නැහැ, ජීවිත කාලය ඉවර වෙනවා. බුදුහාමුදුරුවෝ එතනදී දේශනා කරනවා ලෝකය, ලෝක සමුදය, ලෝක නිරෝධය, මාර්ගය පිළිබඳව. මේක දැකලත් ලෝකෝත්තර සම්මාදිට්ඨිය ඇති කරගන්න පුළුවන්. තව දේශනා වල තියෙනවා, රූපය, රූප සමුදය, රූප නිරෝධය, නිරෝධ කරන මාර්ගය - මෙයිනුත් කෙනෙකුට ලෝකෝත්තර සම්මාදිට්ඨිය ඇති කරගන්න පුළුවන්. සම්මාදිට්ඨිය ආවා කිව්වොත් මේ සියල්ලටම ගැලපෙන්න ඕනේ. එක තැනකින් සම්මාදිට්ඨිය ඇවිල්ලා වෙන තැනකට ගැලපෙන්නේ නැත්නම් එතන අඩුවක් තියෙනවා. නිතරම ධර්ම විනයට ගලපලා බලන්න ඕනේ. සක්කාය දිට්ඨිය කඩා ගන්න එක තමයි වැදගත්. ඒක කඩා ගත්තොත් ඉතුරු ටික ඊට පස්සේ කරන්න පුළුවන්. මෙතන දැනගත්තේ නැත්නම් එකක් වත් කරන්න ලැබෙන්නේ නැහැ. නුවණ තියෙන කෙනා බලනවා ඒක අනිත් ඒවාට ගැලපෙනවාද? ලෝකය, ලෝක සමුදය, නිරෝධය, මාර්ගය - ඒකට ගැලපෙනවාද? නැත්නම් සළායතන, සළායතන සමුදය, නිරෝධය, මාර්ගය - ඒකට ගැලපෙනවාද? නුවණ තියෙන කෙනා බලනවා මම අවබෝධ කරගෙනද ඒ කථාව කියලා තියෙන්නේ කියන එක. ධර්මයේ ඕනෑම තැනකට ගැලපෙන්න ඕනේ. ඒක ඒ ආකාරයෙන්ම අවබෝධ නොකළා වෙන්න පුළුවන් නමුත් ගැලපෙන්නේ නැත්නම් අවබෝධයේ අඩුවක් තියෙනවා. ගැඹුරින්ම කියන්න බැරි වුනත් ඒක සම්පූර්ණයෙන්ම නොගැලපෙනවා නම් වෙන්න බැහැ. සම්මාදිට්ඨිය ඇති වුනා නම් ඔය හැම විදියටම ගැලපෙන විදියේ අවබෝධයක් වෙන්න ඕනේ.

පටිච්ච සමුප්පාදය පටන් ගන්න තැනත් මේ අවිද්‍යාව නිසා තමයි මේ සේරම. **අවිජ්ජා පච්චයා සංඛාරා, සංඛාර පච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණ පච්චයා නාමරූපං, නාමරූප පච්චයා සළායතනං, සළායතන පච්චයා ඵස්සො, ඵස්ස පච්චයා වෙදනා, වෙදනා පච්චයා තණ්හා තණ්හා පච්චයා උපාදාන, උපාදාන පච්චයා භවො, භව පච්චයා ජාති, ජාති පච්චයා ජරා මරණං සොක පරිදෙව දුක්ඛ දොමනස්සුපායාසා සම්භවන්ති.**

**සමභවන්ති** කියන්නේ ඇතිවෙනවා, හටගන්නවා. **එවමෙතස්ස කෙවලස්ස දුක්ඛන්ධස්ස සමුදයො හොති. එවමෙතස්ස** - මෙන්න මේ විදියට තමයි. **කෙවලස්ස** කියන්නේ එකම ආකාරය - මේ දුක් කන්දරාව හටගන්න. කෙවල කියන්නේ එක විදියයි. මේ දුක් කන්දරාව හටගන්න විදිය මේකමයි. මේ පටිච්ච සමුප්පාදයමයි. වෙන විදියක් නැහැ. ඊළඟට නිරෝධ පැත්තකුත් පෙන්නනවා. **අවිජ්ජායත්වෙව අසෙස විරාග නිරොධා සංඛාර නිරොධො, සංඛාර නිරොධා විඤ්ඤාණ නිරොධො, විඤ්ඤාණ නිරොධා නාමරූප නිරොධො, නාමරූප නිරොධා සළායතන නිරොධො, සළායතන නිරොධා ඵස්ස නිරොධො, ඵස්ස නිරොධා වෙදනා නිරොධො, වෙදනා නිරොධා තණ්හා නිරොධො, තණ්හා නිරොධා උපාදාන නිරොධො, උපාදාන නිරොධා භව නිරොධො, භව නිරොධා ජාති නිරොධො, ජාති නිරොධා ජරාමරණංසොකපරිදෙවදුක්ඛ දොමනස්සුපායාසා නිරුජ්ඣන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛඛන්ධස්ස නිරොධො හොති.** මේ විදියට තමයි දුක් කන්දරාවේ නිරෝධය තියෙන්නේ.

**සළායතන පච්චයා ඵස්සො** කිව්වත් **තිණ්ණං සංඝති ඵස්සො** කිව්වත් **ඵස්සය** කියන එක තේරුම් කරනවා. තුනක එකතුවකට තමයි **ඵස්සය** කියන්නේ. ඇහැයි, රූපයයි, චක්ඛු විඤ්ඤාණයේ එකතුවට කියනවා ඇහැ නිසා ඇති වන **ඵස්සය - චක්ඛු සම්ඵස්සය.** අනිත් ආයතනත් ඒ වගේමයි.

පටිච්ච සමුප්පාදයේ අවිද්‍යාවේ සිට දුකට එනකල් අංග 12ක් තියෙනවා. මේ අංග 12 ගැන පච්චයා සහ නිරෝධා කියලා කථා කරනවා. සසරෙ යන කෙනාට පච්චයා - ඔය 12 තියෙනවා. රහතන් වහන්සේට නිරෝධා - ඒ කියන්නේ ඉතුරු නැතුවම නිරුද්ධයි. **අවිජ්ජායත්වෙව** කියන්නේ අවිද්‍යාව කියලා කියන නමුදු - **අසෙස** ශේෂයක් නැතුවම - **විරාග** රාගයක් නැතුවම - **නිරොධා** - නිරුද්ධයි. අවිද්‍යාව කියන එක ශේෂයක් නැතුව, රාගයක් නැතුව නිරුද්ධ කළොත් සංඛාර නිරෝධයි. මේ කියන්නේ රහතන් වහන්සේ ගැන. සංඛාර නිරෝධ නම් විඤ්ඤාණ නිරෝධයි. විඤ්ඤාණ නිරෝධ නම් නාමරූප ගැන කථා කරන්න බැහැ. නාමරූප නිරෝධා සළායතන නිරෝධො. එතකොට සළායතනයක් නැවත ඉතුරු වුනා කියලා කථා කරන්න බැහැ.

නුවණින් හිතන්න ඕනේ. සළායතන නිරෝධ නම් **ඵස්සයක්** තියෙන්න බැහැ. ඒක ටිකක් පැහැදිළියි. ආයතන හයම නිරෝධ නම් **ඵස්සයක්** තියෙන්න බැහැ. මොකද ඵස්සය කිව්වේ ඔය ජාති තුනක එකතුවක්. එතකොට අනිවාර්යෙන් ආයතනයක් තියෙන්න ඕනේ. ඵස්සය නිරෝධ නම් වේදනාව කියලා දෙයක් ඉතුරු වෙන්න බැහැ. ස්පර්ශයක් නොවී වේදනාවක් තියෙන්න බැහැ. වේදනාව නිරෝධ නම්, හටගන්නේ නැත්නම්, තණ්හාවක් නැහැ. ඉතුරු ටිකත් ඒ විදියටම නිරෝධයි.

අපිට තේරුම් ගන්න අමාරු සළායතන, ඵස්ස, වේදනා නිරෝධ වෙනවා කියන එක. ඒක අපේ අවබෝධයේ අඩුවක් මිසක් ධර්මයේ අඩුවක් නෙවෙයි. ඒ නිසාමයි සම්මාදිට්ඨිය නොයෙක් විදියට පෙන්නලා තියෙන්නේ. අපි රහතන් වහන්සේට සළායතන තියෙනවා කිව්වොත් සළායතන නිරෝධයක් දකින්නේ කොහොමද? පටිච්ච සමුප්පාදයේ පැහැදිළිව තියන දේ අපි තේරුම් ගන්නේ නැහැ. ඒ ගැන හොයන්නේ නැහැ. ඒ නිසා තමයි බුදු හාමුදුරුවෝ ආනන්ද හාමුදුරුවන්ට දේශනා කළේ මේක ගැඹුරුයි කියලා. සම්මාදිට්ඨිය තියෙනවා නම් පටිච්ච සමුප්පාදයේ හැම අංගයකටම ගැලපෙනවා. නිවන කියන කොට දුක ඉතුරු නැතුවම නිරුද්ධ වෙන්න ඕනේ. ඒ විදියට ධර්මය හොයන්න. නිවන කියන්නේ අජර, අමර. නමුත් අපි හිතන නිවනේ ජරාව, මරණය තියෙනවා. ඇයි? රහතන් වහන්සේ, බුදුරජාණන් වහන්සේ වයසට ගියා, ලෙඩ උනානෙ. මෙතන අඩුවක් තියෙනවා කියල පෙනෙන්න ඕනේ. ඒ නිසා නුවණින් හොයන්න. වචන ටික විතරක් පාඩම් කරගෙන දන්නවා කියන කෙනාට ධර්මය දකින්න බැහැ. උදාන වාක්‍යයේ තියෙන්නේ කළ යුතු සියල්ල නිම කරන ලදී, නැවත කළ යුත්තක් නැහැ කියලා. හැම රහතන් වහන්සේගේම උදාන වාක්‍ය මෙයයි. රහතන් වහන්සේට පංච ස්කන්ධය විතරයි තියෙන්නේ උපාදාන නැහැ කියන එක අහලා අහලා තමයි අපි මුලා වෙලා ඉන්නේ. අපි ඒක නුවණින් විමසන්න ඕනේ. ක්‍රියා සිත කියන්නේ විපාක ලැබෙන කර්මයක් නෙවෙයි. ක්‍රියාවක් විතරයි.

ලෝකෝත්තර මට්ටම තේරුම් ගන්න අපහසු නිසා තමයි බුදු හාමුදුරුවෝ උපමා දක්වන්නේ. වතුරට එබෙන බල්ලාගේ උපමාව බලන්න. වතුරට එබෙන බල්ලා රැවටෙනවා වතුරේ සතර මහා ධාතුවෙන් හැදුනු, පන තියෙන බල්ලෙක් ඉන්නවා කියලා. අපේ ලෝකයට එහෙම

බල්ලෙක් නැහැ. අපිට ඒක වතුරේ හැදුනු ඡායාවක් විතරයි. නමුත් බල්ලාගේ දෘෂ්ටියෙන් ඉන්නවා නම් වතුරේ ඇත්ත කියලා හිතන තව බල්ලෙක් ඉන්නවා. බල්ලාගේ දෘෂ්ටියෙන් ඒ බල්ලා ලෝකයට අයිතියි. සතර මහා ධාතු රූපයක්. ඒ බල්ලාව අත්දකින්න සළායතන ඕනේ. බාහිරෙන් බැලුවොත් එතන ලෝකයත් තියෙනවා, රූපයත් තියෙනවා. අභ්‍යන්තරයෙන්, ගොඩ ඉන්න බල්ලාගේ පැත්තෙන් බැලුවොත් ඒ බල්ලාව අත්දකින්න සළායතන උපද්දවන්න පුළුවන්. මේ බල්ලාට හිතෙන්නේ අර බල්ලාව ඇල්ලුවොත් අහුවෙනවා, කාය විඤ්ඤාණයෙන් අත්දකින්න පුළුවන් කියලා. ඇහෙන් බැලුවොත් අරමුණු වෙනවා. ගඳසුවඳ බැලුවොත් අරමුණු වෙනවා. බල්ලෙක් ඉන්නවා කියන කොට ආයතන වලට ගෝචර වෙන විදිය තියෙනවා. මෙතන ආයතන ටික තියෙනවා. පහළ නොවුනත් පහළ කරන්න පුළුවන් කියන අදහස දැන් තියෙනවා ඒ බල්ලාව අත්දකින්න. බල්ලා කියන රූපයත් තියෙනවා, ලෝකයට අයිති බල්ලෙක් ඉන්නවා, ලෝකයක් තියෙනවා. ඔතන බල්ලාගේ මට්ටමින් අවිද්‍යාව තියෙනවා. අපේ මට්ටමින් නැහැ. සංඛාරත් තියෙනවා. අවිද්‍යාවෙන් හදපු සංඛාරයක් තමයි හදපු බල්ලා. අවිද්‍යාව නිසාම සංස්කරණයක්. සංස්කරණය කියන්නේ චේතනා ගොඩක්. චේතනා තමයි සංඛාර කියන්නේ. අවිද්‍යාවෙන් කරපු චේතනා ටිකෙන් තමයි බල්ලෙක් හදාගෙන ඉන්නේ. මේ ඔක්කොම තියෙන්නේ බල්ලාගේ මනසේ. ඇත්තටම එළියේ බල්ලෙක් නැහැ. හිතේ හදපු චේතනා ටිකෙන් තමයි බල්ලෙක් හදලා තියෙන්නේ. ඒක සංඛාරයක්. දැන් අවිද්‍යාවත් තියෙනවා, සංඛාරයත් තියෙනවා. විඤ්ඤාණයත් තියෙනවා - බල්ලෙක් ඉන්නවා කියලා දැනගෙන තියෙනවා. ඒ දැනුවත් වන ස්වභාවය විඤ්ඤාණය. හිත දැනගෙන තියෙනවා බල්ලෙක් ඉන්නවා කියලා. විඤ්ඤාණය පහළ වෙලා. නාමරූපය - බල්ලා රූපය, බල්ලා අඳුනගන්න වේදනා, සංඥා, චේතනා නාම ධර්ම. ඒ ටික තමයි විඤ්ඤාණයට අහුවුනේ. දැන් බල්ලාව විඤ්ඤාණයට අහුවෙලා. සළායතන - ඇහැට පේනවා, අනිත් ආයතන ඉපැද්දුවොත් ඒවත් අත්දකින්න පුළුවන්. සළායතන ටිකත් තියෙනවා. වේදනාව - බල්ලා නිසා වින්දනයක් තියෙනවා. ඒ වේදනාව නිසා තණ්හාවක් ඇතිවෙනවා. තණ්හාව කිව්වහම ඇලීම හෝ ගැටීම. ඔය දෙකෙන් එකක් ඇතිවෙනවා බල්ලෙක් පෙනෙන කොට. උපාදානය - අතන බල්ලෙක් ඉන්නවාමයි කියලා දැඩිව විශ්වාස කරනවා. රූපයේ බැසගෙන, රූපය භාරගෙන ඉවරයි. භව - භව

කියන්නේ පවතිනවා කියන ස්වභාවය. පවතිනවා කියන කොට ජාති කීපයක් තියෙනවා. දෙයක් පවතිනවා කියන්න නම් එනකොටත් තියෙනවා, බලනකොටත් පෙනෙනවා, යනකොටත් තියෙනවා. ඒ කියන්නේ අතීතයෙත් තිබුණා, දැනුත් තියෙනවා, අනාගතයෙත් තියෙනවා. තත්පරයකදී හරි තියෙනවා කිව්වොත් තියෙන බවක්, භව පැවැත්මක් අපි දීලා තියෙනවා. අතීත රූප, වර්තමාන රූප, අනාගත රූප. භව කියන කොට ඔය තුනට වැටිලා ඉවරයි. භවයක් දීපු එකක් අතීතයක්, වර්තමානයක්, අනාගතයක් ගැන කථා කරන්නත් පුළුවන්. **අතීත අනාගත පච්චුප්පන්න** - රූපයක් තියෙනවා කියලා බැස ගත්තාට පස්සෙ, විශ්වාස කළාට පස්සේ, එතන තියෙනවා වතුරේ ඉන්න බල්ලා මම බලන්න කලිනුත් හිටියා, දැනුත් ඉන්නවා, ආයෙ බැලුවොත් ආයේ ඉන්නවා කියන විශ්වාසය, දෘෂ්ටිය. දැන් බල්ලාට පැවැත්මක් දීලා. කාල තුනට දාලා පැවැත්මක් දීලා. භව පැවැත්මක් දීලා ඉවරයි. අපි රූපයක් උපාදාන කළා නම් ඒකට භව පැවැත්මක් දීලා ඉවරයි.

ඒ රූපය අපිට ක්‍ෂණිකව ඇතිවෙලා නැතිවෙන එකක් නෙවෙයි. වතුරේ ඉන්න බල්ලා ගැන ගොඩ ඉන්න බල්ලා ඔය පැවැත්ම දීලා. දැන් බල්ලෙක් ඉපදිලා, හටගෙන - ජාති. ඒ බල්ලාට ජාති ජරා ව්‍යාධි මරණ සොක පරිදෙව දුක්ඛ දොමනස්ස උපායාස සේරම තියෙනවා. බාහිර රූපය මගේ කියලා අල්ලා ගත්තා නම් දුක් වෙන්න වෙයි. දැන් අපි අල්ලගෙන තියෙන රූප වලට ඔය උදාහරණය දාලා බලන්න. බල්ලා දෘෂ්ටියෙන් අල්ලා ගත්තා වගේ තමයි දරුවන් අල්ලගෙන ඉන්නේ. දැන් ඒ අය ලෙඩ වුනොත්, මැරුණොත් දුකයි. දැන් දුක් කන්දරාව හටගෙන. දැන් බල්ලාගේ අවිද්‍යාව නිසා ඔය කරුණු 12ම හටගෙන තියෙනවා. බල්ලා ඉන්නේ ලෝකයට අයිති දැක්මක. බල්ලාගේ දෘෂ්ටියේම තමයි අපිත් ඉන්නේ. වතුරට එබෙන උපමාව බැලුවහම අපට පොඩි අවබෝධයක් තියෙනවා ඇත්ත බල්ලෙක් නැහැ කියලා. අපිට ඒ දෘෂ්ටිය නැත්නම් අපට උත්සාහ කරන්න පුළුවන් බල්ලාට ඕක තේරුම් කරලා දෙන්න. තේරුම් ගන්නවාද නැත්ද කියන එක බල්ලාට අයිති වැඩක්. අපි ගැන අනුකම්පාවෙන් බුදුහාමුදුරුවොත් ඔහොම උත්සාහයක් අරන් තියෙනවා (අපට බල්ලා ගැන අනුකම්පාවක් එනවා වගේ). අපි බල්ලාගෙන් ඇහුවොත් ඇයි තරහා අරන් ඉන්නේ කියලා, ඌ කියයි බල්ලෙක් ඉන්න නිසා කියලා. ඊළඟට අහන්න වෙන්නේ ඇයි බල්ලෙක්

ඉන්නවා කියන්නේ? බල්ලාගෙන්ම උත්තර ටික ගන්න වෙනවා. ඉන්නවා වගේ පෙනෙන නිසා උං බල්ලෙක් ඉන්නවා කියලා කියනවා. පෙනුනේ නැත්නම් උං බල්ලෙක් ඉන්නවා කියලා හිතන්නේ නැහැ. ඇහෙන් දැකලා දකින දෙය විශ්වාස කරනවා. පෙනෙන දෙය එහෙමම එළියේ තියෙනවා කියලා විශ්වාස කරනවා. ඉන්න හින්දා තමයි පෙනෙන්නේ කියන දෘෂ්ටියකට වැටිලා. ඒ දෘෂ්ටියට ආවේ උං ඊට කලිනුත් ඇහැ පාවිච්චි කරලා තියෙන්නේ පෙනෙන දෙය තියෙනවාමයි කියන දෘෂ්ටියෙන්. පෙනෙන දෙය තියෙනවාමයි, නැත්නම් තියෙන හින්දාමයි පෙනෙන්නේ කියන දෙකම වැරදි දෘෂ්ටි. දෙකේම ප්‍රතිඵලය තමයි ලෝකයට අයිති බල්ලෙක් ඉන්නවා කියලා දැඩිව ගැනීම. දැඩිව ගන්න එකට තමයි උපාදාන කරනවා කියන්නේ. ඒ රූපයේ බැස ගන්නවා, භාර ගන්නවා. **අභිනන්දති, අභිවදති, අජ්ඣොසාය තිට්ඨති.**

අපි මේ ලෝකය දැනගෙන තියෙන්නේ දෘෂ්ටි ගොඩකින්. යමක් (උදාඃ පීරිසියක්) තියෙනවා කිව්වේ චක්ඛායතනයි, ඊළඟට මනසයි උදව් කරගෙන. ඇහෙන් පෙනෙන දෙය මනසින් හිතුවා. ඇහෙන් වර්ණ සටහනක් හදලා දුන්නා විතරයි. ඇහැට කරන්න පුළුවන් එච්චරයි. ඊළඟට මනසින් තමයි දැන් මේ පෙනෙන සටහනත් බලලා, කලින් අත්දැකපු දේවලුත් එකතු කරලා තමයි පීරිසිය කිව්වේ. බල්ලා කළෙත් ඒ දෙයමයි - ඇහෙන් ඡායාව - වර්ණ සටහන ගත්තා. ඡායාව තමයි මේ මොහොතේ ගන්න දෙය. ඒකට හිතෙන් එකතු කළා පෙර අත්දැකීම්. මේ දෙක එකතු කරලා සංස්කරණයක් කළා - චේතනා ටිකක් හැදුවා. චේතනා වලින් හදපු ලෝකයේ තමයි දැන් බල්ලා ජීවත් වෙන්නේ. බාහිර රූපයට පැවැත්මකුත් දීලා - අතීතයෙත් තිබුණා, දැනුත් තියෙනවා, අනාගතයෙත් නැවත බලන්න පුළුවන්. මේක ලෝකයට අයිති දෙයක්. අතීත, අනාගත, වර්තමාන, දුර, ළඟ, ඕලාරික (රළු), සුකුම (සියුම්), ප්‍රනීත (කැමති), හීන (අකමැති), මේ රූපය 11ක් ආකාරයකට දාගන්න පුළුවන්. බල්ලාටත් පුළුවන් වතුරේ ඉන්න බල්ලාව 11ක් ආකාරයකට දකින්න. රූපයේ බැසගත්තා. බල්ලා ටිකක් තේරුම් ගත්තොත් රූපය, රූප සමුදය, කියන්නේ මොකක්ද කියලා - මේක බල්ලාගේ අවිද්‍යාවෙන් දකින්න බැහැ. බල්ලාගේ අවිද්‍යාව නොයෙදුනානම් - අපි දකින විදියට බැලුවා නම් වතුරේ රූපයක් හටගන්නේ, පිහිටන්නේ නැහැ. අවිද්‍යාව යෙදෙන තුරු තමයි රූපය තියෙන්නේ. අපට එතන සතර මහා ධාතු බල්ලෙක්

පිහිටන්නේ නැහැ අවිද්‍යාව යෙදිලා නැති නිසා. අවිද්‍යාවත් එක්ක ඇහෙන් දැකීම භාර අරගෙන ඒක කළොත් තමයි බල්ලෙක්ව හටගන්නේ. එහෙම නොකළා නම් වතුරේ බල්ලෙක්ව හටගන්නේ නැහැ. අපි බලන විදියට බැලුවා නම් වතුරේ බල්ලෙක්ව හටගන්නේ නැහැ. රූපය, රූප සමුදය - රූපය හටගන්න සමුදයක් තියෙනවා, හේතු තියෙනවා. ඒ හේතු ප්‍රත්‍ය නොයෙදුනා නම් එතන බල්ලෙක් නැහැ - රූපයේ නිරෝධය. ප්‍රත්‍ය වල මූලික වෙනවා අවිද්‍යාව. අවිද්‍යාව එක්ක ඇහෙන් අරන් දෙන ඡායාවයි, අවිද්‍යාවයි, ඒකට උදව් වෙන ටිකයි එකතු වෙලා තමයි ලෝකයට අයිති බල්ලෙක්ව සකස් කරන්නේ. ඒ සකස් කිරීම නොවුනා නම් එතන බල්ලෙක් නැහැ - නිරෝධය. මේ සමුදය නොයෙදුනා නම් බාහිර බල්ලාව හටගන්නේ නැහැ. නිරෝධ කරන්න මාර්ගය මොකක්ද - බල්ලාට කියා දෙනවා කියන්නේ ඒකයි. දෘෂ්ටියෙන් මිදෙන්න නම් මොකක්ද මාර්ගය? මිදුන දවසට නැවත රැවටෙන්නේ නැහැ.

දැන් රූපයත් තියෙනවා, රූපය හටගත්ත සමුදයත් තියෙනවා. සමුදය නොයෙදුනා නම් නිරෝධයි. ඒ අවබෝධය ගන්න මාර්ගයකුත් තියෙනවා. ලෝකෝත්තර වෙන්න සම්මාදිට්ඨියක් එතන යෙදෙනවා. සමුදය හරියට දැක්කොත්, සමුදය යෙදුනේ නැත්නම් තියෙනවා කියලා දැඩිව භාර ගන්නේ  නැහැ. ලෝකයට අහුවෙන්නේ නැහැ. මුලාවෙන් බලන නිසාමයි බල්ලෙක්ව මැවෙන්නේ. එහෙම මුලා නොවී දැක්ම කළා නම්, ඒත් පෙනෙයි - රූප ඡායාව ඇහේ වදිනවා - නමුත් එළියේ ඉන්න බල්ලෙක්ව මැවෙන්නේ නැහැ. විදර්ශනාව කියන්නේ දැනගත්තේ කොහොමද කියලා හොයන්න ඕනේ.  සතර මහා ධාතු කියලා දැනගත්තේ කොහොමද? පෙර ඇසුරක් නිසා. මේ ඇසුරු කළේ ආයතනයකින්. ඒ ආයතන භාවිතා කළේ අවිද්‍යාවෙන්. අවිද්‍යාවෙන් ආයතන භාවිතා කරලා එකතු කර ගත්ත දැනුම තමයි මෙතැනට දමන්නේ. පෙර අවිද්‍යාවෙන් ආයතන භාවිතා කරලා නොතිබුණා නම් මේ මොහොතේ රැවටෙන්න ඒ ටික ඉතුරු කර ගන්නේ නැහැ. මේ මොහොතේ අවිද්‍යාවෙන් ආයතන භාවිතා කළොත් ඒක අනාගතයට ඉතුරු කර ගන්නවා. දැන් ඒ ගැන තව කෙනෙකුට කියන්න පුළුවන්. හිතන්න පුළුවන්. ක්‍රියා කරන්න පුළුවන්.

ලෝකය පිලිගෙන කරන භාවනා තියෙනවා. යමක් දෙයක්

තියෙනවා, ඒ තියෙන දෘෂ්ටියෙන් මිදෙන්න කරන භාවනා තියෙනවා. සතර මහා ධාතු, දෙතිස් කුනප, කැඩිලා බිඳිලා යනවා, අනිත්‍යයි ආදී වශයෙන් කිව්වාට මේ වගේ භාවනා වලින් යමක් තියෙනවා කියන දෘෂ්ටියෙන් මිදෙන්නේ නැහැ. මුළාවෙන් මිදෙන්නේ නැහැ. ආයතන නිරෝධයක් දකින්නේ නැහැ. ඇහැ මොකක්ද කියලා දන්නෙත් නැහැ, ඇහෙන් ඇයි මෙහෙම පෙන්නුවේ (සමුදය) දන්නෙත් නැහැ, ඒ දෙක දන්නේ නැත්නම් කවදාවත් නිරෝධයක් ලැබෙන්නෙත් නැහැ. එතන තියෙන්නේ ඉපදුන දවසේ හම්බවෙලා මැරෙන කොට නැතිවෙන ඇහැක් මිසක් ඇත්ත දැකලා, ඇහැ මොකක්ද, ඇහේ සමුදය මොකක්ද, ඇහේ නිරෝධය මොකක්ද, මාර්ගය මොකක්ද - මෙහෙම දැක්මක් ගන්න කවදාවත් බැහැ. තියෙනවා කියන දෘෂ්ටියක ඉඳන් නැහැ කියලා පෙනෙන තුරු භාවනා කරනවා. ඒක ලෝකෝත්තර නෙවෙයි. ඒක මේ ලෝකයට අයිති දෘෂ්ටි දෙකක්. කෙනෙක් කියයි තියෙනවා කියලා, තව කෙනෙක් කියයි නැහැ කියලා. ඇත, නැත කියන දෙකම දෘෂ්ටි. කච්චායනගොත්ත සූත්‍රයේ මේක හොඳට පෙන්නනවා.

**උත්තරය:** බුදු හාමුදුරුවෝ සංඥාව මිරිඟුවකට උපමා කරනවා. මේ අවස්ථාවේ උදව් වුනේ රූප සංඥාව. ඇහෙන් ගත්තේ රූප සංඥාව. අපි සංඥාව මිරිඟුවක් කියලා දැක්කේ නැහැ. ලෝකයට අයිති දැක්මේදී, මෙහෙම පෙනෙනවා, පෙනෙන්නේ තියෙන නිසාමයි කියලා ගන්නේ. මිරිඟුවේදී වතුර වගේ පෙනෙනවා, ඒ වුනාට වතුර පවතින්නේ නැහැ. මිරිඟුව කියන්නේ පෙන්නුම් කිරීමක් විතරයි. පවතින ස්වභාවය නෙවෙයි. උපමාවේදී බල්ලා ගත්තෙත් ඇහැ නිසා රූප සංඥාවක්. ඌටත් ලැබිලා තියෙන්නේ සංඥා මිරිඟුවක්. ඌට මිරිඟුව මිරිඟුව විදියට දකින්න අවබෝධයක් නැහැ. ඇහැ නිසා අරන් දුන්නේ මිරිඟු සංඥාවක් කියලා දන්නේ නැහැ. ඒකට අදාළ රූපය තියෙනවාමයි කියලා දෘෂ්ටිගත වුනා. දැන් කථා කරන්නේ බාහිර රූපය ගැන, රූප සංඥාවක් ගැන නෙවෙයි. අඩු තරමින් සංඥාව මිරිඟුවක් කියන අවබෝධය වත් ගත්තා නම් ඌට ටිකක් හරි ඇත්ත දකින්න පුළුවන්. එතකොට පවතින දෙයක් ගැන හිතන්න යන්නේ නැහැ. සංඥාව මිරිඟුවක් කියන මට්ටමින් බැලුවත් දෘෂ්ටි වලින් මිදෙන්න පුළුවන්. බාහිර රූපය කියන්නේ මිරිඟුව මිරිඟුව විදියට දන්නේ නැහැ. සංඥාව මිරිඟුව කියලා දකින කොට බාහිර දෙයින් වැඩක් නැහැ. ධාතුව වුනත් එකයි නැතත් එකයි. එතන

තියෙන්නේ වතුරයි කියලා අවබෝධ කරනවා කියන්නේ සතර මහා ධාතු ස්වභාවය දැක්කා වගේ වැඩක්. මෙතන තියෙන්නේ සතර මහා ධාතුයි කියලා දැක්කා කියන්නේ යම්කිසි අවබෝධයක් නමුත් තවම සංඥා මිරිඟුව කියන එක අවබෝධ කරලා නැහැ. ගැඹුරට දැකලා නැහැ. බාහිරයේ තියෙන්නේ ඔය වගේ පෙන්නුම් කරනවා විතරයි, තියෙන්නේ ධාතු ස්වභාවය කියන දැක්මකට ගිහිල්ලා. නමුත් තවම ලෝකය පිලි අරගෙන. තියෙන දෘෂ්ටියෙන් මිදෙන්න අපි තව දැක්මකට ගිහිල්ලා.

**උත්තරය:** ප්‍රසාද රූපය කියන්නේ ඇහේ හැදෙන ඡායාව. ඒක තමයි විඤ්ඤාණය දකින්නේ. එළියේ තියෙන රූපය විඤ්ඤාණයට දකින්න හැකියාවක් නැහැ. මේ ආයතනයෙන් හදලා දෙන ප්‍රසාද රූපයමයි විඤ්ඤාණයට අහුවෙන්නේ. එතකොට චක්ඛු විඤ්ඤාණය දැනගෙන තියෙන්නේ ඇහේ චක්ඛු ප්‍රසාදයේ හැදුන ප්‍රසාද රූපයමයි. ඒ ප්‍රසාද රූපය නිකං ඡායාවක් විතරයි. හරියට සිනමා ශාලාවක චිත්‍රපටියක් බලන්න ගියාම තිරයේ වැටෙන රූප ටිකක් වගේ දෙයක් තමයි මේ ප්‍රසාද රූපය කියන්නේ. ඒ තිරයේ හැදෙන ගස්වැල්, දියඇලි ඡායා. ඒවා තමයි ප්‍රසාද රූපය කියන්නේ. එතකොට විඤ්ඤාණය අපි වගේ. අපි ඕක දැකලා එළියේ තියෙන දියඇල්ලක් ගැන හිතනවා. ඕක තමයි විඤ්ඤාණයෙන් කරන වැඩේ. දකින්නේ තිරයේ වැටෙන දේවල් ටික. දකිනවා කියලා හිතන්නේ බාහිරයේ තියෙන ලෝකයට අයිති සතර මහා ධාතු වලින් හැදුනු දේවල්. ඕක තමයි විඤ්ඤාණය කරන මායාව. අපි චිත්‍රපටියක් බලනවා වගේ තමයි. චිත්‍රපටි හෝල් එකේ වතුරෙන් හැදුනු දියඇලි නැහැ. රූප සංඥාව විතරයි දෙන්නේ. අපිට සංඥාව මිරිඟුවක් කියන අවබෝධය නැහැ. අපි ඒක ඇත්ත කියලා ඒකේ ජීවත් වෙනවා. ඕක තමයි චක්ඛු විඤ්ඤාණයෙන් කරන්නේ. හිතෙන් හදන ලෝකය ඇත්ත කරනවා. චිත්‍රපටියේ කථාව අපි හදන්නේ හිතෙන්. වර්ණ ඡායාව කථාව හදන්න උදව් වෙනවා. ඔය වගේ අපේ විඤ්ඤාණයෙන් හදන කථාව හදන්න උදව් වෙනවා ඇහැ හදලා දෙන වර්ණ ඡායාව. ඒක තමයි ප්‍රසාද රූපය කියන්නේ. අපි මේ කරන්නේ ඇහැ ඇතුලේ චිත්‍රපටිය බලමින් ඉන්න එක තමයි වටපිට බල බලා. ඇහේ තිරයට ඒ එක එක වර්ණ රූප අරගෙන හිතෙන් කථාව හදනවා. ඊටපස්සේ ලෝකය නරඹනවා. ලෝකය හදලා දෙන්නේ විඤ්ඤාණය. දවල් හීන තමයි. ඇහැ ඇරගෙන ඉඳන් දකින හීන. පියවි ලෝකය. මුලා කරලා

දකින ලෝකය. ජීවත් වෙන්නේ දවල් හීනයේ. මේකට තමයි සංසාරයේ යනවා කියන්නේ.

ඔය හීනෙන් නැගිටින්න පුළුවන් නම් ලෝකෝත්තර දැක්ම වෙනවා. මේ ඉන්නේ හීනෙක කියලා මොහොතකට හරි අවබෝධ කරන්න පුළුවන් නම් ඒක ලෝකෝත්තර සම්මාදිට්ඨිය වෙනවා. හරියට චිත්‍රපටි ශාලාවෙන් එළියට ආවහම වගේ. ආයතන හයෙන් චිත්‍රපටි හයක් පෙන්නනවා. එක එක වෙලාවට ඒවා බලනවා. එකක් ඇති වුනාම අනිත් එක දිහා බලනවා. ඒක එපා වුනාම තව එකක් දිහා බලනවා. චිත්‍රපටි හයක් නොමිලේ දීලා තියෙනවා. අපි කරන්නේ ඔය හය බල බලා මේ ඇත්ත තමයි කියලා ජීවත් වෙනවා. ඊටපස්සේ මනසෙන් හදන ලෝකයට තණ්හා කරනවා. ඇලෙනවා ගැටෙනවා, රණ්ඩුවෙනවා. කලහවිවාද ඇති කරගන්නවා. කලහවිවාද සූත්‍රයේ පෙන්නනවා කලහවිවාද ඇති වෙන හේතුව - මේ හදා ගන්න හීනය, රූපය ඇත්ත කියලා අරගෙන, රූපයේ බැසගෙන ඊටපස්සේ රණ්ඩු වෙනවා. රෑ හීන බලන කොට දන්නේ නැහැ මේ හීනයක් කියලා. ඇහැරෙන කල් දන්නේ නැහැ. එතකල් හීනේ ඇත්ත වෙලා. දැන් අපි ඉන්නේ ඇහැ ඇරලා දකින හීනෙක. පියවි ලෝකයෙන් නැගිටින්න ප්‍රඥාව ඕනේ.

ප්‍රඥාව පටන් ගන්නේ ලෝකෝත්තර සම්මාදිට්ඨියෙන්. එතකොට සළායතනයෙන් කරන මුලාව තේරුම් ගන්න ඕනේ. ආයතන හයෙන් අරන් දෙන්නේ සංඥා හයක්. සංඥා හයම මිරිඟු කියලා තමයි බුදුරජාණන් වහන්සේ දේශනා කරලා තියෙන්නේ. අපි ඒවා මිරිඟු කියලා දකින්නේ නැහැ, බල්ලා වතුරේ බල්ලෝ හදනවා වගේ හීනේ අපි ඇත්ත කරනවා. සංඥාව දැකලා ඇත්තට එළියේ තියෙනවා කියලා හිතනවා. ඕකම තමයි චිත්‍රපටියක් බලනකොටත් කරන්නේ. ඒකේ ජීවත් වෙන කාලය තුළ ඒවා ඇත්ත. ඒකෙන් මිදුනොත්, මේ කථාවක් විතරයි, හිතෙන් හදපු දෙයක් විතරයි කියලා දැක්කොත්, ඇලෙන්නේ ගැටෙන්නේ නැහැ. ඒක නුවණින් බැලුවොත් විතරයි දකින්න පුළුවන්. අපි හැම තිස්සේම ආයතන 6න් නොමිලේ බලන චිත්‍රපටි 6ක් තියෙනවා. ඒ 6 චිත්‍රපටි 6ක් කියලා තේරුම් ගත්තොත් සම්මාදිට්ඨිය ඇති කරගන්න පුළුවන්. මොහොතකට හරි මිදෙන්න පුළුවන්. මේ ඇහැ කරන මුලාව තේරුම් අරන් ලෝකෝත්තර වෙන්න පුළුවන්. ඇහේ සිනමා ශාලාවෙන්

එළියට ගිහින් බලන්න ඇහැ කරන මුලාව. එදාට ඇහැක් ඕනේ නැති වෙයි - ඇහේ නිරෝධය දකියි. බාහිර රූප දකින්නේ නැහැ කියලා දැනගත්ත දවසට ඇහෙන් වැඩක් නැහැ. බල්ලාට ඇහැක් ඕනේ එළියේ බල්ලා දකින්න. ඕක මුළාවක් කියලා දැනගත්ත දවසට ඌට ඇහැක් වැඩක් නැහැ. ඇහේ නිරෝධය පෙනෙනවා. මේ අවිද්‍යාව නොයෙදුනා නම් ඔය ඇහෙන් වැඩක් නැහැ. ඇහැ මුළාවකට පත් කරනවා කියලා දකිනවා. ඇහැ මොකක්ද, ඇහේ සමුදය මොකක්ද, ඇහේ නිරෝධය මොකක්ද, නිරෝධ මාර්ගය මොකක්ද කියලා අවබෝධයක් එයි. එහෙම නැත්නම් ඇහෙන් දකින රූපය මොකක්ද, රූප සමුදය මොකක්ද, නිරෝධය මොකක්ද, මාර්ගය මොකක්ද කියලා අවබෝධයක් එයි. ලෝකය, ලෝක සමුදය, නිරෝධය, මාර්ගය. සියල්ලම අවබෝධ වෙයි සිද්ධ වෙන දෙය දැක්කා නම් - ආයතනයෙන් කරන මුළාව දැක්කා නම්.

පංච උපාදානස්කන්ධයත් මුළාවක් කියලා තේරෙයි. මේ හිතෙන්ම හදන දෙයක්. මුළු පටිච්ච සමුප්පාදයම හිතෙන් හදන දෙයක් කියලත් තේරෙයි. අවිද්‍යාව තියෙන කල් විතරයි ඔය ලෝකය තියෙන්නේ. අවිද්‍යාව තියෙන කල් විතරයි පටිච්ච සමුප්පාදයෙන් හදන දුක තියෙන්නේ. පටිච්ච සමුප්පාදයේ අංග සියල්ලම තියෙන්නේ අවිද්‍යාව තියෙන කල් විතරයි. අවිද්‍යාව නැති වුන දවසට ඔය අංග 12ම යෙදෙන්නේ නැහැ. නිරෝධයි කියලා අවබෝධයක් එනවා. අපි කලින් කිව්වේ ඕකෙන් භාගයක් නිරෝධය කියලා නේ. දැන් ඒවා පෙන්වන විඤ්ඤාණයත් නිරෝධ වෙයි. ඒ පෙන්නන නාමරූප (වතුරේ ඉන්න බල්ලත්) නිරෝධ වෙයි. විඤ්ඤාණයයි නාමරූපයයි. ඕක දකින්නම තමයි ආයතනය හට අරන් තියෙන්නේ. ඒවා පෙන්නන ආයතනයත් නිරෝධ වෙයි. ඔය තුන නිරෝධ වෙනකොට ඵස්සයත් නිරෝධ වෙයි. එදාට වේදනා නිරෝධ වෙයි. වේදනා නිරෝධ වුන දවසක තණ්හාව නිරෝධ වෙයි. බුදු දහම අනුව වේදනා ඉතුරු කරලා තණ්හා නිරෝධ කරන්න බැහැ. වේදනා පච්චයා තණ්හා. වේදනා නිරෝධ වුන දවසට තණ්හාව නිරෝධ වෙයි. තේරුම් ගන්න කොටසක් ඉතුරු කරගෙන ඉතුරු ටික නිරෝධ කරන පටිච්ච සමුප්පාදයක් නෙවෙයි බුදු හාමුදුරුවෝ දේශනා කළේ.

බුද්ධ දේශනාව තේරුම් ගන්න, ගැඹුරක් තියෙනවා ඒක දකින්න

බැරි ගැඹුරක් නෙවෙයි. අපි ලෝකයට අයිති දෘෂ්ටි වල ඉන්න නිසා උපමා එක්කම බලන්න ඕනේ. නැත්නම් පෙනෙන්නේ නැහැ. මේක තියෙනවාමයි කියන දෘෂ්ටියේ ඉන්නේ. දෘෂ්ටියේ ඉඳන් බැලුවාට පෙනෙන්නේ නැහැ. බල්ලා ඇහැ පාවිච්චි කරනවා වගේ නේද මමත් ඇහැ පාවිච්චි කළේ කියන දැක්මෙන් දකින්න ඕනේ. රූප සංඥාවක්නේ ඔය අරන් දුන්නේ - සංඥාව මිරිඟුවක් කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කළා නේ. එහෙනම් ඇයි මම මිරිඟුවට රූපයක් දමන්නේ, සංඥා මිරිඟුවෙන් නවත්වන්න බැරිද ඔය පේන්නේ මිරිඟුවක් කියලා. ඇහෙන් අරන් දෙන්නේම මිරිඟුවක්. ආයතන පිරිසිඳ දකින්න ඕනේ. ආයතනයක් ආයතනයක් ගානේ බලන්න ඕනේ. සංඥාව තිබුණට අවිද්‍යාවක් නැහැ. ඇහැට පෙනෙනවා. පෙනීම කියන්නේ රූප සංඥාව. ඒක බාහිරයේ රූප කරන්න ගියාම අවිද්‍යාව යෙදෙනවා. බල්ලාට බල්ලෙක් වගේ පෙනුනාට කිසිම වැරැද්දක් නැහැ. පෙනෙන්නේ නැත්නම් තමයි වැරැද්ද. එහෙනම් උගේ ඇහැ පෙනෙන්නේ නැහැ. වතුරට එබෙන කොට පෙනීමේ කිසිම වරදක් නැහැ. ඒ පෙනීම වැරදියට භාරගැනීම මයි වැරැද්ද. සංඥාව මිරිඟුවක් විදියට දන්නේ නැතුව - නැහැ එළියේ තියෙන දේමයි මේ පෙනෙන්නේ කියන එක තමයි වැරැද්ද. පෙනීමට අමතරව දෙයක් පනවනවා. එතනයි වැරැද්ද තියෙන්නේ. පෙනීම පෙනීමෙන් නවත්වන්නේ නැහැ, පෙනෙන දෙයක් පනවනවා. දෙයක් පනවපු ගමන්ම ලෝකයට අහුවුනා, මාරයාට අහුවුනා. ආයතනයෙන් මොකක් හරි දකින කොට එළියේ තියෙන දෙයක් පැනෙව්වොත් මාරයාට අහුවුනා, ලෝකයට අහුවුනා. පෙනීම තිබුණට ප්‍රශ්නයක් නැහැ නමුත් තේරුම් ගන්න ඕනේ පෙනීම කියන්නේ චිත්‍රපටියක් බලනවා වගේ කියලා මතක් කරගන්න ඕනේ. ඒක සංඥාවක් විතරයි. සංඥාවට සතර මහා ධාතු රූප හදන්න යන්න එපා.

අවිද්‍යාව නැති කරන්නේ ප්‍රඥාවෙන්මයි. වෙන ක්‍රමයක් නැහැ. මේ හීනෙන් නැගිටින්න ප්‍රඥා ඇස උපදවා ගන්න ඕනේ. සංඥා මිරිඟුවෙන් මිදෙන්න ඕනේ. ඒ කියන්නේ මිරිඟුව මිරිඟුව විදියට තේරුම් ගන්න ඕනේ. සංස්කාර වලට යන්නේ අවිද්‍යාව නිසා, ඇත්ත ඇති හැටියෙන් දන්නේ නැති නිසා. ඇත්ත ඇති හැටියෙන් දැක්කොත් සංස්කාර කරන්නේ නැහැ - අවිජ්ජා පච්චයා සංඛාරා යෙදෙන්නේ නැහැ. එතකොට ඒ සංඛාරය දැනගන්න විඤ්ඤාණයක් යෙදෙන්නෙත්

නැහැ. විඤ්ඤාණය නැත්නම් විඤ්ඤාණයට පෙන්වන්න නාමරූපයකුත් නැහැ. නාමරූප නැත්නම් සළායතන නැහැ. සළායතන නැත්නම් ඵස්සය නැහැ. ඵස්සය කියන්නේ ඇහැයි, රූපයයි, විඤ්ඤාණයයි. දැන් රූප පිහිටන්නෙත් නැහැ. රූප නිරෝධයත් දක්කා, ආයතන නිරෝධයත් දකින්න ඕනේ. ඇහැ මොකක්ද, ඇහැ හටගන්නේ කොහොමද, ඇහේ නිරෝධය මොකක්ද, මාර්ගය මොකක්ද කියලා අපි කලින් දීර්ඝව කථා කරලා තියෙනවා. ඇහැ කියන්නේ දැකීම නිසාම හටගන්න ස්වභාවයක්. දකින්නේ නැති වෙලාවක ඇහැක් නැහැ. අවිද්‍යාව තියෙන කල් තමයි ඔය කියන අංග 12 තියෙන්නේ. අවිද්‍යාව නැත්නම් අංග 12ම නැහැ. පටිච්ච සමුප්පාදයේ අවිද්‍යාව තියෙනවා නම් අංග 12ම තියෙනවා, අවිද්‍යාව දුරු කලාම අංග 12ම නැහැ. ඔය විදියට දකින්න පුරුදු වෙන්න. මුළාවෙන් හදන විඤ්ඤාණය යෙදෙන්නේ නැහැ මුළාව නැත්නම්. ලෝකෝත්තර දැක්ම කියන්නේ ආයතන ඉක්මවා ගිහිල්ලා දකින්න ඕනේ. ඇහැ පෙන්වන එක විශ්වාස කරලා හරි යන්නේ නැහැ. ඇහැ කරන මුළාව දැකලා ඒකෙන් මිදෙන්න ඕනේ. කණ කරන මුළාව දැකලා ඒකෙන් මිදෙන්න ඕනේ. එතකොට ආයතනයෙන් මිදෙනවා. ආයතනය විශ්වාස කරන කල් ආයතනය තියෙනවා. ආයතනය කරන බොරුව දැක්ක දවසට ආයතනය වැඩක් නැහැ, ඕක මුළාවක් කියලා ආයතන නිරෝධයක් දකින්න පුළුවන්. රහතන් වහන්සේට මේ කොටස් 12ම යෙදෙන්න බැහැ නේද කියලා ධර්මයට අනුව දකින්න. නිරෝධා කියලා බොහොම පැහැදිළිව කියලා තියෙනවා. අපි ඕකේ භාගයක් ඉතුරු කරන්න යන්න ඕනේ නැහැනේ.

පටිච්ච සමුප්පාදය දකින්නේ නැතුව වෙන වෙන ධර්ම දකින්න යාමෙන් තමයි අපි මේවා අවුල් කර ගන්නේ. රහතන් වහන්සේගේ විඤ්ඤාණයට කියන්නේ අනිදස්සන විඤ්ඤාණය කියලා. අපි දර්ශනය කරන ඒවා රහතන් වහන්සේ දර්ශනය කරන්නේ නැහැ. ඒකට ලස්සණ උපමා දෙනවා. එකක් තමයි චිත්‍ර ශිල්පියෙක් සායම් අරගෙන අහසේ රූප අඳිනවා නමුත් රූපය පිහිටන්නේ නැහැ. ඒ වගේ තමයි රහතන් වහන්සේගේ විඤ්ඤාණය. නැත්නම් කුරුල්ලෙක් පියාඹගෙන ගියාම පාර තියෙන්නේ නැහැ වගේ. රහතන් වහන්සේගේ විඤ්ඤාණය අනිදස්සනයි. අපි සටහන් ඉතුරු කරගන්නවා. අර අඳින චිත්‍රයට බෝඩ් එකක් දාලා ඉතුරු කර ගන්නවා. ඔතන තමයි වැරැද්ද තියෙන්නේ.

ඇහෙන් රූප දකලා නිමිති ඉතුරු කරගන්නවා. උපමාවේ බල්ලා වතුරට එබිලා බල්ලෙක් ඉතුරු කරගත්තා කියන්නේ ඌට ආයේ මතක් කරන්න නිමිත්තක් ඉතුරු කර ගත්තා. නැවත මතක් කළොත් ඒ බල්ලාවම පෙනෙනවා ඒ විදියටම. එතෙන්ට යන්න ඕනේ නැහැ හිතෙන් දකින්න පුළුවන්. ඒක තමයි නිමිති ඉතුරු කර ගත්තා කියන්නේ. ඇහෙන් කරන සංඥා මිරිඟු ගැන දන්නේ නැහැ, පෙනෙන්නේ තියෙන නිසාමයි කියලා දෘෂ්ටි ගත වෙලා ඒ නිමිත්ත ඉතුරු කර ගත්තා. **චක්ඛුණා රූපං දිස්වා නිමිත්තගාහි හොති** - ඕක තමයි සංසාරයේ යන්න හේතුව. ඒවා ඊළඟට මනාප අමනාප කියලා දාලා ඇලීම් ගැටීම් ඇති කරගෙන සසරේ යනවා.

රූපය ගැන සම්මාදිට්ඨිය ආවොත් - රූපය, රූප සමුදය, නිරෝධය, මාර්ගය - ඒක ගන්න තමයි **භද්දෙකරත්ත** සූත්‍රය එහෙම කියලා තියෙන්නේත් මේ අවබෝධය ගන්න. අපි කරන්නේ පටිච්ච සමුප්පාදයේ අංග ටික අරන් ලෝකයක් හදනවා. ඒකෙන් මිදෙන්න නෙවෙයි පටිච්ච සමුප්පාදය හොයන්නේ, තව දෘෂ්ටි ටිකක් හදන්න. බුදු හාමුදුරුවෝ පච්චයා කියලා සමුදය පෙන්නුවා, නිරෝධා කියලා කඩාවැටීම පෙන්නුවා. අවිද්‍යාව තියෙන කල් ඔය ටික හදනවා, අවිද්‍යාව නැත්නම් ඔක්කොම ඉවරයි. **යං කිංචි සමුදයධම්මං සබ්බං තං නිරොධධම්මං.** ධම්ම කියන්නේ හිතෙන්ම හදපු දෙයක්. බල්ලාට ධම්ම වුනේ මනසින්ම හදපු බල්ලෙක්. ධම්ම හැදුවේ මනස. ධම්ම කියන්නේ එළියේ තියෙන දේ විදියට මනසින් හදපු දේ කියලා හිතන්න. **මනො පුබ්බංගමා ධම්මා** - මනස තමයි ධම්ම වලට කලින් හැදිලා තියෙන්නේ. එළියේ ලෝකය නෙවෙයි ඉස්සෙල්ලා හැදුනේ. වතුරේ ඉන්න බල්ලාව හැදුවේ බල්ලාගේ මනසින්. මනසයි පෙරටුව ඉන්නේ. මනස තමයි ධම්ම හැදුවේ. ඒ මනසින්ම හදපු ධම්ම තමයි මනසට අරමුණු වෙන්නේ. අරමුණ තමයි දෙය කරන්නේ, ධම්ම කරන්නේ. අරමුණ කියන්නේ ආයතනය නිසා මනසින්ම හදපු දෙයක්. අර උපමාව එක්කම හිතන්න. වතුරේ ඉන්න බල්ලා හැදුවේ මනස. එතකොට මනස තමයි ඕක නැවත සිහි කරන්නේ. මනසින්ම හදපු දෙය ඊළඟට මනසින්ම මෙනෙහි කරනවා එළියේ තියෙන දෙයක් විදියට. බල්ලා වතුරට එබෙද්දී පෙනෙන කොට බල්ලෙක් හැදුවා. ඊළඟට ගහක් යටට ගිහින් 'අර ළිඳේ මෙහෙම බල්ලෙක් ඉන්නවා නේ' කියලා මෙනෙහි කරනවා. එතකොට මනසට ධම්ම. මනසින්ම හදා ගත්ත දෙය ඊළඟට මනසින්ම නැවත නැවත මෙනෙහි කරන්න

ධම්මාරම්මණ වෙනවා. දෙයක් වෙලා. ධම්ම කියන්නේ දෙයක්. ඒක සිතුවිල්ලක් කියන දැක්ම නැහැ. හීනේ ජීවත් වෙනවා. ඒක ඇත්ත කරගෙන ජීවත් වෙනවා. ධම්ම ටික දෙයක් කරගෙන, බාහිර ලෝකයක් කරගෙන ජීවත් වෙනවා. ගෙයක් ගැන හිතන කොට එහෙ තියෙන ගෙයක් ගැන මතක් කරනවා. ධම්ම වුනාට ඒක ලෝකයට අයිති දෙයක් කරගෙන. දකින්නේ මනසින්, හිතාගෙන ඉන්නේ අරෙහෙ තියෙන සතර මහා ධාතු ගෙදර ගැන. ධම්ම කියන්නේ මනසින් අරමුණු වෙන්නේ ඒ වුනාට අපට ඒ නුවණ නැහැ. අපි හිතන්නේ එළියේ තියෙන දෙයක් කියලා. ඒ දෙයක් පනවන එකමයි මෙතන තියෙන වැරැද්ද. මනසට ධම්ම කියලා දැක්කත් එතනත් ධර්මතාවය දකින්න පුළුවන්.

විඤ්ඤාණයෙන් මුළාවට අහුවුනාට පස්සේ මනසට ධම්ම තියෙනවා. දෙයක් හදාගෙන තියෙනවා මෙනෙහි කරන්න. සම්මාදිට්ඨිය ඇතිව දැක්කොත් මුළු බුදු දහමේම තියෙන්නේ පටිච්ච සමුප්පාදයමයි. හේතූන් නිසා හටගන්න දෙය හේතු නිරුද්ධ වෙනකොට නිරුද්ධ වෙනවා. **යං කිංචි සමුදයධම්මං සබ්බං තං නිරොධධම්මං. හෙතුංපටිච්ච සම්භූතං හෙතුභංගා නිරුජ්ජති.** හේතු ටික නිරුද්ධ වෙනකොට ඵලය නිරුද්ධයි. අපි ඵලය ඉතුරු කරගෙන - අර වතුරේ ඉන්න බල්ලා දෙයක් කරගෙන ඕක ගැන හිතනවා. ඒක හටගන්න හේතු ටික දකින්නේ නැහැ.

සම්මාදිට්ඨිය ඇතිවෙන කොට සක්කායදිට්ඨිය පහ වෙනවා. මේ ලෝකය හැදෙන හැටියි, ලෝකයේ නිරෝධයයි ගැන අවබෝධය එනකොට දුරු වෙන්නේ සක්කායදිට්ඨිය. එතකොට 'මම' මේ මුළාවෙන්ම හදපු කෙනෙක් කියලා පෙනෙනවා. එළියේ ඉන්න බල්ලා දකින්න බල්ලෙක් ඉතුරු වුනේ එළියේ ඉන්න බල්ලා හදපු හින්දා. ඒක මනසේ ක්‍රියාවලියක් කියලා දැක්කා නම්, බාහිරයි අභ්‍යන්තරයෙයි වෙන් කිරීමක් නැහැ. එතකොට සක්කායදිට්ඨිය හිටින්නේ නැහැ. මේ අවබෝධය තුළින්මයි සක්කායදිට්ඨිය අයින් වෙන්නේ. **යං කිංචි සමුදයධම්මං** කියන එක දකිනකොටම හරි. **යෙ ධම්මා හෙතුප්පභවා** - සැරියුත් හාමුදුරුවන්ට (උපතිස්ස පරිබ්‍රාජකයාට) මේ ධම්ම වල හේතු ටික දේශනා කළා. මේ ධම්ම හැදෙන්නේ හේතූන්ගෙන් කියලා පෙන්වනවා. ඕක දැක්ක ගමන් සෝවාන් වෙනවා. සක්කායදිට්ඨියෙන් මිදෙන්න පුළුවන්. හේතූන් යෙදුන නිසා තමයි එහෙම දෙයක්

තියෙන්නේ. හේතු දකින්නේ නැතුව අනිත්‍ය බල බලා හිටියට වැඩක් නැහැ. හිතෙන්ම හදන දෙය හේතු නිසා හැදෙනවා, බාහිරයේ තියෙනවා නෙවෙයි කියලා දකින්න ඕනේ. මේ ලෝකය හිතෙන්ම අවිද්‍යාව නිසා හදනවා. අවිද්‍යාවෙන් හදන, මුළා කරන හේතු ටික දකින්න. මේ හේතුන් යෙදුන නිසයි ලෝකය මැවුනේ කියන එක. සංඥාව මිරිඟු ස්වභාවයෙන් ඔබ්බට අපි අරන් යන්නේ ඕක දකින්නේ නැති හින්දා. ඇත්තටම තියෙනවා කියලා හිතනවා. ඔය ස්වභාවයෙන් මිදුන දවසට සක්කාය දිට්ඨියෙන් මිදෙන්න පුළුවන් වෙයි. මේක හොඳට මෙනෙහි කරන්න. ආයතනයක් ගානේ ඔය ටික තියෙනවා. හැම ආයතනයක්ම ඕනේ නැහැ, එක ආයතනයක් බලන්න. ඇහැ තේරුම් ගත්තොත් අනිත් ආයතනත් තේරුම් ගත්තා වෙනවා. එතකොට දකින්න පුළුවන් මෙතන තියෙන්නේ හේතුන් නිසා හටගන්න ඵලයක් කියලා - ධම්ම - **යෙ ධම්මා හෙතුප්පභවා.**

දැකීම වගේම ඇසීමත් ගත්තොත් - ලේනෙක් කෑගහනකොට ලේනාගේ සටහන හිතේ මැවුනා. එතකොට හිතුනේ ගහේ ලේනෙක් ඉන්නවා කියලා. ඒකෙයි වතුරට එබුන බල්ලාගෙයි කිසිම වෙනසක් නැහැ. බල්ලා බල්ලෙක් ඉන්නවා කියලා හිතුවා වගේ තමයි අපිත් සතර මහා ධාතු ලේනෙක් ඉන්නවා කියන්නේ. ඔතන මනසට අරමුණු වෙන ධම්ම අඳුන ගන්න. දැන් අපිට ලේනාව මෙනෙහි කර කර ඉන්න පුළුවන් - උගේ සතර මහා ධාතු රූපය. ඕක මනසින් හදන එකක් විදියට අපට පෙනෙන්නේ නැහැ. අපට පෙනෙන්නේම එළියේ ඉන්න ලේනා. ඔතන තමයි වැරැද්ද. දෙයක් පනවනවා. ශබ්ද සංඥා මිරිඟුවක් ඔතන තියෙන්නේ. සිනමා පටලයේ දැන් තියෙන්නේ ශබ්ද සංඥා ටිකක්. දැන් අනිත් ශාලාවෙන් බලන්නේ. එකක් එපා වෙලා අනිත් එකෙන් බලනවා. ශබ්ද තිරයේ ලෝකය හදනවා. ඒක මනසට ධම්ම වුනා. දැන් මනසට එළියේ තියෙන දෙයක්. චතුරාර්‍ය්‍ය සත්‍ය, පටිච්ච සමුප්පාදය සේරම ඔතන තියෙනවා. අවිද්‍යාව තියෙන කල් දුක හදනවා. හේතු ටික දකින කොට නිරෝධය පෙනෙනවා. මේක මනසින් හදපු ලේනෙක් කියලා දැක්කහම බාහිර ලේනෙක්ට රැවටෙන්නේ නැහැ. දෘෂ්ටි වලින් ආපු අපේ පුරුද්ද කඩාගන්න ඕනේ. සම්මා දිට්ඨිය ආවාට, සක්කාය දිට්ඨිය නැති වුනාට පුරුද්ද නැවතිලා නැහැ. ඒකයි ඇලීම් ගැටීම් තවම තියෙන්නේ. ආශ්‍රව මුල් බැහැගෙන තියෙනවා. අනුශය ධර්ම. ඒ නිසා තමයි සක්කාය

දිට්ඨිය නැති වුනාට ඇලීම් ගැටීම් එකපාරට නැති වෙන්නේ නැහැ. තව කරන්න දේවල් ටිකක් තියෙනවා. මේ රැවටෙන බව දැක දැක ඉන්න ඕනේ. හේතුඵල ස්වභාවය දැක්කහම ඔය දෘෂ්ටියෙන් මිදෙනවා. දෘෂ්ටියෙන් මිදුනට තවම රැවටෙන ගතියෙන් මිදෙන්නේ නැහැ. එකක අපි ඇත්ත දැක්කාට අනිත් එකට රැවටෙනවා පුරුද්ද බලවත් නිසා. අපි සංසාරයේ ආවේ රැවටී රැවටීමයි. අවබෝධයෙන් රැවටෙන්නේ නැති ගණනට එන්න පුළුවන් නම් නිවන් අවබෝධ කරන්න පුළුවන් වෙයි.

තේරුම් ගන්න ඕනේ අවබෝධ කරන මාර්ගයටවත් වැටුනාද කියන එක. ඒකයි වැදගත් වෙන්නේ. සක්කාය දිට්ඨිය නැති කරන මාර්ගයට වැටෙන්නේ කොහොමද කියලා නේ ඇහුවේ. දැන් අවබෝධයක් එන්න ඕනේ. සම්මා දිට්ඨිය තුළින් තමයි මාර්ගය පටන් ගන්නේ. ලෝකය දකින්න කිව්වේ තමන් තුළින්. එළියට ගිහින් බලන්න ඕනේ නැහැ. ශබ්දය එළියට දාන්න එපා. හිතෙන් තමයි ශබ්දය පෙන්නුවේ. කණ නිසා හිතෙන් පෙන්නපු දෙයක්. සෝත විඤ්ඤාණය තමයි මුළාව කරන්නේ එළියේ තියෙනවා කියලා. ඊළඟට මනෝ විඤ්ඤාණය ඕක අරගෙන තව ටිකක් මුලා කරනවා. එළියේ තියෙන දෙය හඳුනගන්න යනවා. ඊළඟට ඒකට ඇලෙනවා හෝ ගැටෙනවා. සුවඳ නිසා කෑමක් මැවිලා පෙනෙනවා හිතට. ඒකේ රස දෙනවා දිවට කෙළත් උනලා. මේ ඔක්කෝම හිතෙන් කරන වැඩ කියලා දකින්න ඕනේ. මේක ගැඹුරුයි. ආයතනයම අල්ල ගන්න ඕනේ එතනම මුළාවයි තියෙන්නේ කියන එක දැක්කොත් එතන පෙනෙයි දැන් හරි දැක්මක් තියෙනවා කියලා. සම්මත ලෝකය ඉක්මවා යන දැක්මකට යනවා. හිතෙන්ම මවන දෙයක් මේක. විඤ්ඤාණයමයි මායා කාරයා. විඤ්ඤාණයම එළියේ ලෝකය මවනවා. **මායූපමංච විඤ්ඤාණං** - සංඥාව මිරිඟුවට උපමා කළා වගේ විඤ්ඤාණය මායා කාරයාට උපමා කරනවා. ඔය උපමා හැම එකේම හරි ගැඹුරක් තියෙනවා. එළියේ දැක්ක පමණටම තියෙනවා කියන දෘෂ්ටියට යන්න එපා. දැකීම එකක් පවතින දෙය තව එකක්. ඔහොම වෙන් කරන්න. පවතින ස්වභාවය වෙන එකක්. අපි දන්නේ නැහැ පවතින ස්වභාවය. අපි දන්නේ පෙනෙන ස්වභාවය විතරයි. පෙනෙන ස්වභාවයයි පවතින ස්වභාවයයි වෙන් කරන්න. පවතින ස්වභාවය ගැන හොයන්න යන්න එපා මොකද හොයන්න බැහැ. ඒක සතර මහා ධාතු කියනවා නම් ඒකත් කියන්නේ අපේ

හිතෙන්මයි. නැතුව අත්දැකලා නෙවෙයි. අත්දකින්නේ ආයතන වලින්. මේ ආයතන හයට අමතර දෙයක් නැහැ අපට අත්දකින්න, එළියේ තියෙන ස්වභාවය හොයන්න. විඳීම කියන එක ප්‍රශ්නයක් නැහැ. ඒක විඳීමක් විතරයි. එතනින් එහාට නිමිති රහතන් වහන්සේ ඉතුරු කරගන්නේ නැහැ. ඒක දෙයක් කර ගන්නේ නැහැ. දිවේ ක්‍රියාකාරිත්වය. එතනින් එහාට වෙන දේවල් අවිද්‍යාවෙන් කරන සංස්කාර.

අවිද්‍යාව තියෙන කල් තමයි ඕවා ඔක්කෝම. අවිද්‍යාව තියෙන කල් තමයි හේතු ටික තියෙන්නේ. බල්ලාගේ අවිද්‍යාවක් යෙදුනේ නැත්නම් වතුරට එබෙනකොට කවදාවත් මෙනෙහි කරන්න බල්ලෙක්ව ඉතුරු වෙන්නේ නැහැ. ධම්ම හදන්නේ නැහැ. ධම්ම කියන්නේ ලෝකයට අයිති දේවල්. එහෙම දෙයක් ඉතුරු වෙන්නේ නැහැ නැවත නැවත සිහි කර කර ඉන්න. ඒක තමයි සටහන් ඉතුරු කර ගන්නේ නැහැ කියන්නේ. ඇහෙන් රූප දැකලා නිමිති ඉතුරු කරගන්නේ නැහැ. **චක්ඛුණා රූපං දිස්වා නනිමිත්තගාහි හොති** - රහතන් වහන්සේ. ඇත්ත ඇති හැටියට දැක්කාට පස්සේ නැවත මෙනෙහි කරන්න දෙයක් නැහැ. අපට මහන්සියෙන් නවත්වන්න වෙනවා, ඒක අවබෝධ කළාට පස්සේ මහන්සියක් නැහැ. ඇත්ත ඇති හැටියට දකිනවා - එච්චරයි. හරි දැක්ම තුළම ඒ රැවටීමෙන් මිදෙනවා. රැවටීම නැතිවුන දවසට ඒක ගැන නැවත කථා කරන්නේ නැහැ. ප්‍රඥාවෙන් යන්නේ ලෝකෝත්තර මාර්ගයට. මුළාවේ අනිත් පැත්ත තමයි ප්‍රඥාව කියන්නේ. මූලික ප්‍රතිපදාවේදි සති සමාධි ඕනේ. නමුත් අවබෝධය ආවාට පස්සේ තවත් කළ යුතු දෙයක් නැහැ. දකින කල් උත්සාහය අරන් පෙන්නන්න ඕනේ - ඔහොම පෙනුනාට මෙහෙම නේ මේකේ ඇත්ත තත්වය, මුළාව හින්දා මෙහෙම පෙනුනාට, දෘෂ්ටි හින්දා මෙහෙම පෙනුනාට, ඇත්ත ස්වභාවය මේකයි කියලා සම්මා දිට්ඨියෙන් ගත්ත අවබෝධය දෙන්න ඕනේ. ඒක තමයි මාර්ගය වඩනවා කියන්නේ. මාර්ග අංග පටන් ගන්නේ සම්මා දිට්ඨියෙන්. ඊළඟ අංග ටික තියෙන්නේ ඕක දැන් මෙනෙහි කරනවා. වඩනවා. මතක් කර කර දෙනවා. ඒක තමයි මාර්ගය වඩනවා කියන්නේ.

මූලික සති සමාධි කියන දෙකේදී සම්මා දිට්ඨිය යෙදෙන්නේ නැහැ. එතකොට හිත සකස් කරනවා. දැඩි කෙළෙස් වලින් හිත නිදහස් කරනවා - පූර්ව ප්‍රතිපදාව. සම්මා දිට්ඨිය යෙදිලා පිහිටන සතියකුත්

තියෙනවා. එතකොට අපි සිහියෙන් බලනකොටම අපට ධර්මතාවය පෙනෙනවා - පටිච්ච සමුප්පන්න නේ මෙහෙම පෙනුනේ කියලා. එතකොට සම්මා සතිය. සම්මා දිට්ඨිය ඇතිව පිහිටන්නේ සම්මා සතිය. මේ අවබෝධය නැතුව බලන කෙනාගේ, ඒ කියන්නේ ධර්මයක් අහලා නැතුව, සම්මා දිට්ඨියක් නැතුව, චතුසච්ච සම්මා දිට්ඨිය නැති කෙනාගේ සම්මා සතියක් පිහිටන්න විදියක් නැහැ. සතිය පිහිටන්න පුළුවන්. සමාධිය පිහිටන්න පුළුවන්. සම්මා සමාධිය පිහිටන්න බැහැ. ඒ කියන්නේ ලෝකෝත්තර මට්ටමින්. ලෞකික මට්ටමින් පිහිටන්න පුළුවන්. ලෝකෝත්තර මට්ටමින් වෙන්න නම් ලෝකෝත්තර සම්මා දිට්ඨියම එන්න ඕනේ. ලෝකය ඉක්මවා යන දැක්මෙන් යුතු දැක්මක් එන්නම ඕනේ. නෙක්ඛම්ම කියන්නේ මනසින්ම හදන ලෝකයෙන් නික්මීම. අවිහිංසා කියන්නේ හිංසාවක් කරන සංකප්පයක් එන්නේම නැහැ. පුද්ගල හැඟීම යෙදෙන්නේ නැති වෙනකොට හිංසා කථාවක් යෙදෙන්නේ නැහැ. ඒක ගොඩක් ගැඹුරුයි. ගැඹුරින්ම කිව්වොත් රහතන් වහන්සේට සතෙක් මරන්න බැහැ. සම්මතයේ මරනවා කියන එක වෙන්න පුළුවන්. මිනියක් වුනත් මරන්න පුළුවන්. හැබැයි ලෝකෝත්තර මට්ටමින් බලන කොට එහෙම දෙයක් වෙලා නැහැ. සතෙක් මරන්න බැහැ කිව්වාට - චක්ඛුපාල හාමුදුරුවන්ගේ කකුලට පෑගිලා සත්තු මැරුණා සක්මන් කරද්දී. ඒකට ලෝකේ දෘෂ්ටියේ ඉන්න අය කියනවා රහතන් වහන්සේ සත්තු මරනවා කියලා. නමුත් රහතන් වහන්සේ මරපු සතෙක් නැහැ. ඒක ලෝකෝත්තර පැත්තෙන් බැලුවොත්. එතකොට ඒ සත්තු පිහිටලා නැහැ. අපට සම්මතයට රහතන් වහන්සේ සතෙක් මරයි. හැබැයි එහෙම මරන්න කෙනෙක් ඉඳලා නැහැ එතන. පුද්ගල දෘෂ්ටිය. ඕවා හරි අමාරුයි මොකද ලෞකික විදියට කියන්න ගිය ගමන්ම වරද්දලා තේරුම් ගන්නවා. තව විදියකට කිව්වොත් රහතන් වහන්සේට රකින්න අමුතුවෙන් සීලයක් නැහැ. අවබෝධය එනකල් තමයි ඔක්කොම සීල, සමාධි, ප්‍රඥා සියල්ලම යෙදෙන්නේ. මාර්ගය හිටන් යෙදෙන්නේ. රහතන් වහන්සේට අමුතුවෙන් පටිච්ච සමුප්පාදයකුත් නැහැ. ධර්මය කිසිම දෙයක් අවශ්‍යයත් නැහැ. ඒවා යෙදෙන්නෙත් නැහැ. ඒවා ටිකක් නුවණින් හිතන්න ඕනේ දේවල්. අපි අවිද්‍යාවෙන් හිතන ටික රහතන් වහන්සේට යෙදෙන්නේ නැහැ.

අතීතයේ කරපු දේවල් වලට කරන්න දෙයක් නැහැ. අපට මේ

මොහොතේ සිහි කරන එකේ ඇත්ත දකින්න පුළුවන්. මේ හිතට අරමුණු වුනේ ධම්ම. ධම්ම කියන්නේ අතීතයේ අවිද්‍යාවෙන් ආයතනයක් පාවිච්චි කරලා ඉතුරු කරගත්ත නිමිති. එහෙම දකින කොට ඒක තමයි චිත්තානුපස්සනාවෙයි, ධම්මානුපස්සනාවෙයි එන්නේ. හිත දිහා බලන් ඉන්න. මතක් වෙන මතක් වෙන එක ධම්ම. ධම්ම කියන කොට තේරුම් ගන්න ඕනේ ඔය කියපු කරුණු ටික. ඒවායේත් හේතුඵල දකින්න ඕනේ. මේ අවබෝධය එක්ක ඕක බලන කොට ඕවා ඉබේම වෙනවා, නැවත අමුතුවෙන් හිත හිතා කරන්න දෙයක් නැහැ.

***************************

## 2013 අගෝස්තු 24 වැනි දින සුභද්‍රාරාමයේදී
## මහාචාර්ය රවී කොග්ගලගේ මහතා විසින් පැවැත්වූ ධර්ම සාකච්ඡාව
# පටිච්ච සමුප්පාදය සහ සක්කාය දිට්ඨිය

සක්කාය දිට්ඨිය විසි ආකාරයි කියලා ධර්මයේ සඳහන් වෙනවා. විසි ආකාරයක් සඳහන් වෙන්නේ පංච උපාදානස්කන්ධයේ. පංච උපාදානස්කන්ධය කියන්නේ රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ කියන පහට තියෙන උපාදානය. උපාදානය කියන්නේ දැඩිව බැස ගන්නවා, දැඩිව පිළිගන්නවා. දෘෂ්ටිගත වෙනවා. දැඩිව ගන්නවා කියන්නේ මොනවා හරි අතින් අර ගන්නවා නෙවෙයි. දෘෂ්ටියක්, මතයක්, ඒ දෙය මෙසේමයි කියලා දැඩිව විශ්වාස කරන, භාර ගන්න, බැස ගන්න, පිළිගන්න ගතියක් තියෙනවා. ඒක හුඟාක් දැඩිව ගැනීම තමයි උපාදානය. පංච උපාදානස්කන්ධය එහෙමමයි කියලා දැඩිව විශ්වාස කරන ගතියක් තියෙනවා. අපට නොදැනුවත්වම ඒක ඇවිල්ලා ඉවරයි. සසරේ යන පුද්ගලයාගේ ඔය පහ එහෙමම භාරගන්න ගතිය, ඒ කියන්නේ අපට දැනුවත් වෙන ස්වභාවයක් තියෙනවා - මේවා මෙහෙමයි කියලා - ඒ ස්වභාවය දැඩිව භාරගන්න ගතියක් තියෙනවා. ඒ දැඩිව උපාදාන කිරීම තුළින් රූපය, වේදනාව, සංඥාව, සංඛාරය, විඤ්ඤාණය උපාදාන කරනවා.

ශරීරය කියන්නේ රූපයක්. ශරීරයක් තියෙනවා කියලා අපි දැඩිව විශ්වාස කරනවා. ඒකේ බැසගෙන ඉවරයි. රූපය පිළිඅරගෙන ඉවරයි. තමන්ට විතරක් නෙවෙයි අනුන්ටත් ශරීර තියෙනවා කියලා කියනවා. ඒ ගැන කිසිම සැකයක් නැහැ. එතකොට ඒකට අයිතිකාරයෙකුත් අපි දෙනවා. අයිතිකාරයෝ දෙන්න නම් ශරීරයක් තියෙන්න ඕනේ. සතෙක්ගේ ශරීරයක් දැක්කත් ඒක සතාට අයිති කරලා ඉවරයි. තමන්ගේ කියලා අයිති කරගන්න ශරීරයකුත් තියෙනවා. එතකොට මේ ශරීරය කියන රූපය මුල් කරගෙන මම ඉන්නවා කියලා හිතෙනවා. එතකොට ශරීරය මුල් කරගෙන පුද්ගල හැඟීමක් ඇවිල්ලා තියෙනවා. කවුදෝ ඉන්නවා - එයාගේ තමයි ඒ ශරීරය. අයිතිකාරයෙක් දානවා කියන්නේ අයිති කරන්න කෙනෙකුත් ඉන්නවා. ශරීරය කියන රූපය හින්දා ඒක මගේ කියලා හිතිලා තියෙනවා. මගේ කියලා හිතෙන්න නම් මම කියලා

කෙනෙකුත් ඉන්න ඕනේ. ඔය ශරීරය ඇතුලේ මම ඉන්නවා කියලා හිතෙන්න පුළුවන්. නැත්නම් කෙනෙකුට හිතෙන්න පුළුවන් මා තුළ තමයි මේ ශරීරය තියෙන්නේ කියලා. අයිති කරන කෙනා කොහේ හරි ඉන්න ඕනේ නේ. එයා කොහේද ඉන්නේ? ශරීරය තුළ කියලා කියනවා. ඕක එක දෘෂ්ටියක් - ශරීරය තුළ මම හෝ කවුරු හරි ඉන්නවා කියන එක. එහෙම නැත්නම් මා තුළ තමයි ශරීරය තියෙන්නේ. ඒ තව විදියක්.

එහෙම නැත්නම් ශරීරයමයි මම. ශරීරයටම තමයි මම කියන්නේ. එහෙමත් හිතෙන්න පුළුවන්. දැන් තුන් විදියක් කිව්වා - මේවා පිළිවෙලට නෙවෙයි කිව්වේ - නමුත් මේ තුන් විදිය තමයි ශරීරය තුළ මම ඉන්නවා, එයාගේ තමයි ඔය ශරීරය. එහෙම නැත්නම් මා තුළ ශරීරය තියෙනවා. ඊළඟට ශරීරයමයි මම කියලා හිතෙන්න පුළුවන්. එහෙම නැත්නම් මම රූපවන්තව පෙනෙනවා. මම රූපයක් විදියට පෙනෙනවා කියලාත් හිතෙන්න පුළුවන්. ඔය හතර ආකාරයෙන් ඕනෙ විදියකට හිතෙන්න පුළුවන් මම කියන දෘෂ්ටිය. එතකොට සක්කාය දිට්ඨිය රූපය මුල් කරගෙන හතර ආකාරයකට එන්න පුළුවන්. ඒ හතරෙන්ම එනවා නෙවෙයි. හතරෙන් එක විදියකට එන්න පුළුවන් සක්කාය දිට්ඨිය. ස්වකීය කය කියලා දෘෂ්ටියක් එනවා. මම, මගේ කියලා දෘෂ්ටියක් එනවා ඒක ඔය හතර ආකාරයෙන් ඕනේ විදියකට එන්න පුළුවන්. ඔය ඉන්නවා කියලා හිතන කෙනා ඉන්නේ ශරීරය තුළ. අයිතිකාරයා මම වෙන්නත් පුළුවන් වෙන කෙනෙක් වෙන්නත් පුළුවන්. එයා ඉන්නේ ශරීරය තුළ කියලා හිතෙන්න පුළුවන් නැත්නම් එයා තුළ තමයි මේ ශරීරය තියෙන්නේ කියලා හිතන්න පුළුවන්, නැත්නම් ශරීරයමයි එයා කියලා හිතෙන්න පුළුවන්, එහෙම නැත්නම් එයා තමයි ඔය රූපවන්තව පෙනෙන්නේ කියලා හිතෙන්න පුළුවන්. මේ වගේ සක්කාය දිට්ඨිය හතර ආකාරයකට එන්න පුළුවන් රූපය මුල් කරගෙන.

ඔය වගේම වේදනාව මුල් කරගෙනත් හතර ආකාරයකට හිතෙන්න පුළුවන්. ඒකෙන් කියන්නේ නැහැ හතර ආකාරයකටම හිතෙනවා කියලා. ඒ හතර ආකාරයෙන් එක විදියකට හිතෙන්න පුළුවන්. තමන්ගේ දෘෂ්ටිය අනුව තමයි එහෙම හිතෙන්නේ. වේදනාව ඇතුලේ මම ඉන්නවා කියලා හිතෙන්න පුළුවන්, නැත්නම් මා තුළ වේදනාව තියෙනවා, එහෙම නැත්නම් වේදනාවමයි මම කියලා හිතෙන්න පුළුවන්,

එහෙම නැත්නම් මම වේදනාව විදියට පෙනෙනවා. මම තමයි මේ වේදනාව විදියට නිරූපනය වෙන්නේ කියලා හිතෙන්න පුළුවන්. එතකොට එතනත් තියෙනවා හතර ආකාරයක්. සංඥාවටත් ඔය විදියටම එන්න පුළුවන්. සංඥාව තුළ තමයි මම ඉන්නේ, නැත්නම් මා තුළ තමයි සංඥාව. මා කියලා කියන්නේ අර පුද්ගලයා කියන එකට - සක්කාය දිට්ඨිය. මම කියන එක දෘෂ්ටියක්. එයාට තමයි අපි රූපය හරි, වේදනාව හරි, අයිති කරන්නේ. වේදනාව දැනුනේ මෙයාට. සක්කාය දිට්ඨියෙන් හදපු කෙනාට. එයාට අයිතියි වේදනාව. නැත්නම් වේදනාව දැනගත්තේ කවුද? එයා. එයා කියන්නේ කවුද? සක්කාය දිට්ඨිය. එයා ඒකේ ඇතුලේ ඉන්න පුළුවන්, නැත්නම් එයාව ඒ විදියට පෙනෙන්න පුළුවන්, ඒ ජාතියමයි එයා කියලා හිතෙන්න පුළුවන්, නැත්නම් එයා ඒ විදියට පෙන්නුම් කරනවා කියලා හිතෙනවා. එතකොට රූපයට ඔය වගේ හතරක් එන්න පුළුවන්, වේදනාවට, සංඥාවට, සංඛාරයට, විඥ්ඥාණයට ඔය වගේ හතරක් එන්න පුළුවන්. ඕකට තමයි කියන්නේ විසි ආකාර සක්කාය දිට්ඨිය කියලා. එක්කෙනෙකුට ඔය විස්සම තියෙනවා කියන එක නෙවෙයි ඔය කියන්නේ. ඔය විස්සෙන් එකක් තිබුණොත් ඇති. විස්සෙන් එකකට හරි අහුවෙලා නම් තේරුම් ගන්න ඕනේ සක්කාය දිට්ඨියේ ඉන්නේ.

ඔය හින්දා තමයි ගැඹුරින් හොයන්න ඕනේ මේ පහ ගැන (රූපය, වේදනාව, සංඥාව, සංඛාරය, විඥ්ඥාණය). බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා ඔය පංච උපාදාන ස්කන්ධයමයි දුක. **සංඛිත්තෙන පංචඋපාදානඛන්ධා දුක්ඛා** කියලා කියන්නේ කෙටියෙන් කියනවා නම් පංච උපාදාන ස්කන්ධයමයි දුක. වෙන මොකවත් නෙවෙයි. යම් තැනක පංච උපාදාන ස්කන්ධය තියෙනවාද, ඒ දුක. එතනත් පෙනෙනවා නේද ඕක දෘෂ්ටියකින් හදන දෙයක් කියලා? පංච උපාදාන ස්කන්ධය කියන්නේ දැඩිව ගත්ත මතයක්, විශ්වාස කිරීමක්, පිළිගැනීමක්. ඒක හිතෙන් ගත්ත දෘෂ්ටියක් නිසා තමයි ඒක නැති කරන්නත් පුළුවන්. නැති කරන්න පුළුවන් වෙන්නෙත් හිත ඇතුලෙන්මයි. බාහිරයෙන් නෙවෙයි. කාටද ඒ පුළුවන්කම තියෙන්නේ? තමන්ටමයි. වෙන කෙනෙකුට නෙවෙයි. බුදුහාමුදුරුවන්ටවත්, රහතන් වහන්සේලාටවත් නෙවෙයි. ඒක හදාගත් කෙනාටමයි ඒකෙන් මිදෙන්න පුළුවන් වෙන්නේ. පංච උපාදාන ස්කන්ධයමයි කෙටියෙන් දුක කියලා කියන්නේ. ඔය පංච

උපාදාන ස්කන්ධයටමයි සක්කාය කියලා කියන්නේ. චූල වේදල්ල සූත්‍රයේ මෙය පැහැදිලිව තියෙනවා - සක්කාය සක්කාය කියන්නේ මොකක්ද? සක්කාය කියන්නේ පංච උපාදාන ස්කන්ධයට. සක්කාය දිට්ඨිය කියන්නේ පංච උපාදාන ස්කන්ධය කියලා නෙවෙයි එතන සඳහන් වෙන්නේ. ධර්මයේ සඳහන් වෙන්නේ සක්කාය කියන්නේ පංච උපාදාන ස්කන්ධයට. තේරුම් ගන්න දුක කියන්නෙත් පංච උපාදාන ස්කන්ධය. සක්කාය කියන්නෙත් පංච උපාදාන ස්කන්ධය. එතකොට සක්කාය දිට්ඨිය කියන්නේ පංච උපාදාන ස්කන්ධය ගැන එන වැරදි දැක්මකට, වැරදි මතයකට, වැරදි විශ්වාසයකට.

දැන් ඔතන ගොඩක් දේවල් තියෙනවා. පංච උපාදාන ස්කන්ධය කියන්නේ සක්කාය. අපට නැති කරන්න ඕනේ සක්කාය දිට්ඨිය. එහෙනම් පංච උපාදාන ස්කන්ධය ගැන තියෙන දිට්ඨිය - වැරදි මතය, වැරදි දෙයක් හරි කියලා දැඩිව විශ්වාස කිරීමක් තියෙනවා. පංච උපාදාන ස්කන්ධය ගැන තියෙන දිට්ඨිය වැරදි කියලා දන්නේ නැහැ, ඒක හරි කියලා දැඩිව පිළිගෙන තියෙනවා. රූපය මුල් කරගෙන සක්කාය දිට්ඨියක් තියෙනවා කිව්වහම ඒක පිළිගන්නේ නැහැ. එතකොට රූප උපාදානය, වේදනා උපාදානය, සංඥා උපාදානය, සංඛාර උපාදානය, විඤ්ඤාණ උපාදානය කියන පහට තමයි කියන්නේ පංච උපාදාන ස්කන්ධය, එහෙම නැත්නම් සක්කාය කියලා. ඔය පිළිබඳව තියෙන වැරදි මතයක් තමයි සක්කාය දිට්ඨිය. ඔය ටික තේරුම් ගත්තොත්, එවිට තේරුම් යයි සක්කාය දිට්ඨිය නැති කිරීම දුක නැති කිරීමම ද කියල. වැරදි වැටහීමක් නැතිවුනා විතරයි. සක්කාය දිට්ඨිය නැති වුනා කියන්නේ සක්කාය නැති වුනා නෙවෙයි. සක්කාය පිළිබඳව තියෙන වැරදි අදහසක් නැතිවුනා. සක්කාය කියන්නේ දුක නම් දුක නැතිවුනා නෙවෙයි. සක්කාය දිට්ඨිය නැති වුනා කියන්නේ ආර්ය මාර්ගයට වැටුනා විතරයි. සෝවාන් වුනා කියන්නේ ආර්ය මාර්ගයේ දුක නැතිකරන මාර්ගය, ප්‍රවාහයට - සෝත කියන්නේ දුක නැතිකරන ප්‍රවාහය - නිවන කරා යක ප්‍රවාහය - එයට වැටුනා, ආර්ය පුද්ගලයෙක් වුනා. සෝතා-ආපන්න - සෝතයට පැමිණුනා. ගලායන මාර්ගයට වැටුනා. හරියට අධිවේගී මාර්ගයට පිවිසුනා වගේ. මාර්ගයට වැටුනා පමණයි, තවම දුක නිරෝධ කරලා නැහැ. මේක තමයි සෝවාන් වෙනවා කියන්නේ. එතකොට සෝවාන් වෙන්න නම් වැරදි දෘෂ්ටි වලින් මිදිලා හරි මාර්ගයටම වැටෙන්න ඕනේ.

දැන් පාර හරි කියලා දැඩි විශ්වාසයක් එනවා. ඒ වගේ වැඩක් තමයි සක්කාය දිට්ඨිය නැති කර ගැනීම. මතක තියා ගන්න තවම දුක නැති කළේ නැහැ. නමුත් දුක නැති කරන මාර්ගයට වැටුනා. මාර්ගයට වැටුනාම පැයකින් ගියත්, සතියකින් ගියත්, මාසයකින් ගියත් යන්නේ කෙළවරට. එතකොට දුක මේ ජීවිතයේම නැති කරගන්නත් පුළුවන්, ජීවිත 7කින් වුනත් වැටෙන්නේ නිවනට. නැවත වෙන පැත්තකට හැරීමක් නැහැ. මේක තමයි මේ සක්කාය දිට්ඨිය නැතිකර ගැනීම. ඒ කියන්නේ සක්කාය පිළිබඳ තියෙන වැරදි දෘෂ්ටිය නැතිකර ගැනීම.

මේ වැරදි දෘෂ්ටිය විසි ආකාරයකින් එන්න පුළුවන්. මේ 20න්ම බේරෙන්න ඕනේ හරි මාර්ගයට වැටෙන්න. මාර්ගයට වැටුනාට පස්සේ කලින් කොහේද හිටියේ, ගියේ කියන දේවල් වැඩක් නැහැ. පෙර මම කොහොම, කවුරු වෙලා හිටියාද, කොහේ ඉපදුනාද ඕවා අදාළ නැහැ. සක්කාය දිට්ඨිය නැතිකර ගත්තාට පස්සේ පැහැදිලියි, මේක තමයි දුක නැතිකිරීමේ මාර්ගය. නැවත වෙනත් මාර්ග නැහැ. එතකොට සීලබ්බත පරාමාස වලට වැටෙන්නේ නැහැ. වෙන මාර්ග වලට හැරෙන්නේ නැහැ. සක්කාය දිට්ඨිය නැති වීමත් එක්කම සීලබ්බත පරාමාස වලින් අයින් වෙනවා. වැරදි මත සියල්ලම කැඩෙනවා. එතකොට වර්තමානයේ, අතීතයේ හෝ අනාගතයේ මම කවුරු වෙලා හිටියාද ආදි මම ගැන ප්‍රශ්න කිසිවක් ඇතිවෙන්නේ නැහැ. විසි ආකාර සක්කාය දිට්ඨියෙන් එකක් හරි තියෙන නිසා තමයි ඔය ප්‍රශ්න අහන්නේ. ඇයි ඒ? මම කියන දෘෂ්ටිය තියෙන නිසා.

ඒ දෘෂ්ටිය රූපය පිළිබඳව එන්න පුළුවන්, වේදනාව, සංඥාව, සංඛාරය, විඤ්ඤාණය පිළිබඳව එන්න පුළුවන්. ඒ එක එකක් ගණනේ එන්න පුළුවන් සතර ආකාරයක් තියෙනවා. ශරීරය තුළ මම ඉන්නවා, නැත්නම් මා තුළ ශරීරය තියෙනවා, නැතිනම් මේ ශරීරයමයි මම, මමමයි මේ ශරීරය විදියට පෙන්වන්නේ (මම රූපවන්තයි). මේ කොහොම හිටියත් මම කියන දෘෂ්ටිය තියෙනවා. සක්කාය දිට්ඨිය තියෙනවා. මේ සක්කාය දිට්ඨිය නැති වුන දවසට මම ගැන ප්‍රශ්ණ අහයිද? මේ රූපය ඇතුලේ හිටිය මම කලින් කොහේද හිටියේ කියලා අහයිද? එහෙම අහනවා නම් අහන්නේ සක්කාය දිට්ඨියෙන්මයි. අතීතයේ මම කවුරු වෙලා හිටියාද? දිව්‍ය ලෝකයේ හිටියාද, අපායේ හිටියාද?

ප්‍රේතයෙක් වෙලා හිටියාද, සත්වයෙක් වෙලා හිටියාද? මේවා අහන්නේ මම කියන දෘෂ්ටිය තියෙන තුරු විතරයි. එහෙම දෘෂ්ටිය නැති කෙනාට ඒ ප්‍රශ්න කිසිවක් නැහැ. සක්කාය දිට්ඨිය නැතිවෙන කොට ඒ ප්‍රශ්න යෙදෙන්නේ නැහැ. ඒවා තේරුමක් නැති ප්‍රශ්න කියලා තේරෙනවා. සක්කාය දිට්ඨියෙන් ඉන්න කෙනාට තමයි ඒ ප්‍රශ්න තියෙන්නේ. එතකොට තේරුම් ගන්න සක්කාය දිට්ඨිය නැති වුන දවසට ඔය ප්‍රශ්න කිසිවක් නැහැ කියලා. එතනින්ම ලොකු කරදර ගොඩක් ඉවරයි.

පළමුවෙන් තේරුම් ගන්න සක්කාය දිට්ඨිය කියන්නේ මොකක්ද කියලා. ඊට පසුව තමයි අපි වැරදි දෘෂ්ටියක ඉන්නවා, ඒ දෘෂ්ටිය ඇතිවෙලා තියෙන්නේ ඇයි කියලා හොයන්න ඕනේ. ඇයි මම මේ දෘෂ්ටියට වැටුනේ? ඇයි මට මේ රූපය මුල් කරගෙන කෙනෙක් ඉන්නවා කියලා හිතෙන්නේ? හතර ආකාරයකට හිතෙන්න පුළුවන්. රූපය මුල් කරගෙන හතර ආකාරයකට කෙනෙක් ඉන්නවා කියන එක දෘෂ්ටියක් නම්, වැරදි මතයක් නම්, ඒ දෘෂ්ටිය එන්නත් හේතු තියෙන්න ඕනේ. අපි හොයන්න ඕනේ ඇයි මේ මම ඉන්නවා කියලා හිතෙන්නේ? ඒ හේතු යෙදෙන නිසා. උදාහරණයේ වතුරට එබෙන බල්ලාට බල්ලෙක් ඉන්නවා කියලා හිතෙන්නේ ඉබේද? නැහැ, එහෙම හිතෙන්න හේතු යෙදුන නිසා. එහෙම දැඩිව විශ්වාස කරන්න යම්කිසි හේතූන් සමූහයක් යෙදිලා තියෙනවා. අපි මුලින් දන්නේ නැහැ මොනවාද හේතු කියලා. නමුත් මොනවා හරි හේතු ටිකක් හින්දා එහෙම හිතෙනවා. ඇහැට පෙනෙනවා බල්ලෙක් ඉන්නවා වගේ. එහෙම පෙනෙන කොට බල්ලෙක් ඉන්නවාමයි කියලා ඌ දැඩිව විශ්වාස කරනවා. ඔය හේතු යෙදුන නිසා තමයි වතුරට එබෙන බල්ලා දැඩිව විශ්වාස කරන්නේ වතුරේ තව බල්ලෙක් ඉන්නවා කියලා. ඉන්න නිසා තමයි මෙහෙම පෙනෙන්නේ කියලා. එහෙම නැත්නම් මෙහෙම පෙනෙන නිසා එතන ඉන්නවාමයි කියලා. මේ තමයි දෘෂ්ටිගත වීම. එතකොට දෘෂ්ටිගත වෙන්නේ ඉබේ නෙවෙයි, දෘෂ්ටිගත වෙන්න හේතු යෙදෙන නිසා. එතකොට අපට සක්කාය දිට්ඨියක් ඇති වෙනවා නම් ඇති වෙන්නේ ඉබේ නෙවෙයි, ඒක ඇති වෙන්න හේතු යෙදෙන නිසා.

කොහොමද ඔය හේතු ටික හොයාගන්නේ? ඒ හේතු ටික හොයාගන්න තමයි අපට බුදුදහම අවශ්‍ය වෙන්නේ. බුදු කෙනෙකුගේ

සහාය අවශ්‍ය වෙන්නේ. ඒක සාමාන්‍ය කෙනෙකුට තනියෙන් දකින්න, අවබෝධ කරන්න පුළුවන් දෙයක් නෙවෙයි. බුදු කෙනෙක්මයි මේක තේරුම් අරන් සක්කාය දිට්ඨියෙන් මේ සසරේ යන මෝඩ සත්වයාට අනුකම්පා පිණිස පෙන්වා දුන්නේ. අන්ධබාල පෘතග්ජන කියන්නේ අවිද්‍යාවෙන් වැහුණු, ඇත්ත ඇති හැටියට නොදන්න, මෝහයෙන් මුලා වුනු සත්වයාට. එවැනි සත්වයාට බුදුන් වහන්සේ දේශනා කරනවා ධර්මය. බුදු හාමුදුරුවෝම කියනවා ධර්මය කියන්නේ පටිච්ච සමුප්පාදය කියලා. කෙනෙකුට ධර්මය දකින්න ඕනේ නම් පටිච්ච සමුප්පාදය දකින්න කියනවා. **යො ධම්මං පස්සති සො පටිච්ච සමුප්පාදං පස්සති, යො පටිච්ච සමුප්පාදං පස්සති සො ධම්මං පස්සති** - යමෙක් ධර්මය දකීද හේ පටිච්ච සමුප්පාදය දකී. යමෙක් පටිච්ච සමුප්පාදය දකීද හේ ධර්මය දකී. ධර්මය කියලා කියන්නේ වෙන මොනවත් නෙවෙයි පටිච්ච සමුප්පාදය. බුදු කෙනෙක් පැහැදිළි කරන්නේ පටිච්ච සමුප්පාදය.

බුදු හාමුදුරුවෝ පටිච්ච සමුප්පාදය විතරද දේශනා කළේ? චතුරාර්ය සත්‍ය, පංච උපාදාන ස්කන්ධය, සතර සතිපට්ඨානය, සත්තිස් බෝධිපාක්ෂික ධර්ම, ආර්යාෂ්ඨාංගික මාර්ගය දේශනා කළා. එහෙනම් ඇයි ධර්මය කියන්නේ පටිච්ච සමුප්පාදය විතරයි කියලා කිව්වේ? පටිච්ච සමුප්පන්න කියන්නේ ඒ හේතු ප්‍රත්‍යයන්ගෙන්ම හටගන්න - සමුප්පන්න වන ස්වභාවය. පටිච්ච සමුප්පන්න ධර්ම ඒ හේතු ප්‍රත්‍යයන්ගෙන්ම උපදිනවා. හේතු ප්‍රත්‍ය සමූහය තමයි ආධාර වෙන, උපකාර වෙන දේවල්. ඵල ඒවායින් සමුප්පන්න වෙනවා. ඒ හේතු ප්‍රත්‍ය ඔක්කෝම උදව් වෙලා පෙන්නුම් කරනවා, උපදිනවා. ඒ හේතු ප්‍රත්‍ය අඩුවුනොත් එහෙම බැහැ. ආධාර වෙන දේවල් ටික ඔක්කෝම තියෙන කොට ඵලය පෙන්නුම් කරනවා. පටිච්ච සමුප්පාදය ධර්මය කියල කිව්වේ පටිච්ච සමුප්පාදයේ අර සියල්ලම අඩංගු නිසා. චතුරාර්ය සත්‍ය, පංච උපාදාන ස්කන්ධය, සතර සතිපට්ඨානය, සත්තිස් බෝධිපාක්ෂික ධර්ම, ආර්යාෂ්ඨාංගික මාර්ගය මේ ඕනෑම එකක් ගත්තොත් එතන පටිච්ච සමුප්පාදය තියෙන්නේ. ඒවායේත් දකින්න ඕනේ පටිච්ච සමුප්පන්න බව. මේ හැම එකක්ම පටිච්ච සමුප්පාදය එක එක විදියට තේරුම් කරන්න විස්තර කරපු ඒවා. ධර්මය, නැත්නම් පටිච්ච සමුප්පාදය හරි ගැඹුරුයි. ඒක දකින්න එක එක පැති වලින් විස්තර කළා. ඔක්කෝම අසූහාරදාහක් ධර්මස්කන්ධයේම පටිච්ච සමුප්පාදය විස්තර කරන්නේ.

පටිච්ච සමුප්පාදය දකින්න බැහැ කියන්නේ ධර්මය දකින්න බැහැ. ධර්මය දකින්න බැරි නම් මාර්ගයට වැටෙන්නත් බැහැ. ඒක නිසා තමයි බුදු දහම අහන්න ඕනේ. සුතමය ඥාණය. **ජානතො** - දැනගන්න. බුදු කෙනෙක් දේශනා කළ ධර්මය කොහොම හරි අහලා දැනගන්න ඕනේ. දැනගත්තාට පස්සේ දකින්නත් ඕනේ. ජානතො **පස්සතො** - දැනගැනීම පිටින් ගත්තාට දැකීම තමන් කරන්න ඕනේ. නමුත් දැනගත්තේ නැත්නම් දකින්නත් බැහැ. දැන ගත්ත කෙනා තමයි ටිකින් ටික එතැනට යනකොට එය අත්දකින්නේ. වෙන කෙනෙක් ගියාට තමන්ට අත්දකින්න බැහැ.

**ප්‍රශ්නයකට පිළිතුරක්:** සෝවාන් වුනාම සඳහන් වෙනවා නැවත අපාගතවීමක් නැහැ. ඒකට ප්‍රධාන හේතුව වෙන්නේ සක්කාය දිට්ඨිය නැති බව. සක්කාය දිට්ඨිය නිසා කරන බලවත් අපාගත වෙන අකුසල් කෙරෙන්නේ නැහැ. දර්ශනයෙන් පහ කරනවා. ධර්මය අවබෝධ කර ගැනීම තුලින්ම පහවෙන කෙලෙස් තියෙනවා. ඉන්පසු බොහෝවිට බලවත් කුසල් තමයි කෙරෙන්නේ. එතකොට මරණාසන්න මොහොතේදී කුසල් අරමුණක් අරමුණු වෙනවා මිසක් අකුසල් එච්චර බලවත් නැහැ අරමුණු වෙන්න තරම්. සක්කාය දිට්ඨිය කියන්නේ වැරදි මතයක්. අවිද්‍යාවෙන් මේක මෙහෙමයි කියලා හිතා ගත්තා අර වතුරට එබෙන බල්ලා අන්න බල්ලෙක් ඉන්නවා කියලා හිතාගත්තා වගේ වැඩක්. නොදන්න කම නිසා ආපු වැරදි දෘෂ්ටියක්.

**ප්‍රශ්නයකට පිළිතුරක්:** රූපයක් දකිනවා කියන තැන පංච උපාදාන ස්කන්ධය ගොඩනැගිලාද? හොඳ ප්‍රශ්නයක්. රූපයක් දකින කොටම, රූපයක් තියෙනවා කියලා හිතෙන කොටම, එහෙම නැත්නම් රූපයක් භාරගන්න කොටම, රූපයේ බැසගන්නවා. **යං රූපෙ අභිනන්දති, අභිවදති, අජ්ඣොසාය තිට්ඨති** - සතුටු වෙනවා, කැමති වෙනවා, හොඳයි කියන ගතියක් එනවා. ඒක ගැන කථා කරන්න පුළුවන්. රූපය තියෙනවා කියලා පිලිගත්තාට පස්සේ ඒක ගැන කථා කරන්න පුළුවන්. ඒකම පිළිගත්තා, බැස ගත්තා, දැඩිව විශ්වාස කළා රූපය තියෙනවාමයි කියලා.

**ප්‍රශ්නයකට පිළිතුරක්:** නුවණින් හිතන්න ඕනේ. දැන් රූපයක් දකින කොට මුලින්ම හිතන්න පංච උපාදාන ස්කන්ධය හටගත්තාද කියලා. රූපය විතරද හටගත්තේ, නැත්නම් පහම හටගත්තාද කියන එක විසඳ ගන්න ඕනේ. බල්ලාගේ උපමාව නැවත ගන්න. රූපයක් තියෙනවා

කියලා හිතන කොට - බල්ලා බල්ලෙක්ගේ රූපයක්, නැත්නම් තව බල්ලෙක් ඉන්නවා කියලා දැඩිව විශ්වාස කලා. ඕක තමයි **අජ්ඣෝසාය තිට්ඨති** - ඒ රූපයේ බැසගත්තා. දැන් ඒ රූපය ගැන උෟට සතුටු වෙන්න පුළුවන්, කථා කරන්න පුළුවන්. **අභිනන්දති, අභිවදති, අජ්ඣෝසාය තිට්ඨති** - තවත් බාහිර බල්ලෙක් ඉන්නවා කියලා පිලිගත්තා. රූපයක් තියෙනවා කියලා දැනගත්තා විතරයි. එතැනින් එහාට ගියේ නැහැ කියලා හිතන්න. රූපයක් තියෙනවා කියලා දැනගන්න කොටම ප්‍රශ්නය තමයි අතන ජාති පහම හටගත්තා. රූපය, වේදනාව, සංඥාව, සංඛාරය, විඤ්ඤාණය කියන පහම හටගත්තා. බල්ලාගේ දෘෂ්ටියට රූපයක් හටගෙන තියෙනවා. සතර මහා ධාතු රූපයක් කියලා බල්ලා හිතනවා. සතර මහා ධාතු තමයි පඨවි, ආපො, තෙජෝ, වායො. උපාදාය රූප තමයි වර්ණ, ගන්ධ, රස, ඕජා. මේකට ශුද්ධාෂ්ටකය කියලත් කියනවා. ඔය ශුද්ධාෂ්ටකය පිහිටන රූපයක් තියෙනවා කියන දෘෂ්ටියක් ආවා. මෙතැන අපට පෙනෙනවා දෘෂ්ටියක් කියලා, නමුත් බල්ලාට පෙනෙන්නේ නැහැ දෘෂ්ටියක් කියලා. බල්ලාට පෙනෙන්නේ තවත් බල්ලෙක් - රූපයක් - රූපය සතර මහා ධාතු, නැත්නම් ශුද්ධාෂ්ටකයෙන් හැදුනු රූපයක්. එහෙම නැත්නම් ලේ, මස්, ඇට, නහර වලින් හැදුනු බල්ලෙක් තමයි අතන ඉන්නේ කියන දැක්ම. ඒ මතයේ ඉන්නේ. දැන් බල්ලාට රූපය තියෙනවා.

ඒ දෙයට කැමතිද, අකමැතිද, මැදහත්ද කියන ගතියකුත් තියෙනවා - වේදනාව. යම් දෙයක් තියෙන කොට ඒ පිළිබඳව වින්දනයකුත් තියෙනවා. සංඥාව - එතන සංඥා කිහිපයක් තියෙනවා, අපි ගනිමු රූප සංඥාවක් තියෙනවා. සතර මහා ධාතු රූපයක් තියෙනවා කියලා සංඥාවක් තියෙනවා. සංඛාරය - ඒ ගැන චේතනාත් ඇතිවෙලා තියෙනවා. චේතනා වලින් තමයි කියන්නේ ඔය බල්ලෙක් කියලා. වේදනාවෙන්, සංඥාවෙන් මොනවදෝ දෙයක් තියෙනවා කියලා දුන්නා. ඒ ගැන හිතලා ඒ හිතපු ටික ඔක්කෝම සංඛාර, චේතනා. අදහස් ටික සේරම සංඛාර. එතකොට එතන සංඛාරත් ඇතිවෙලා තියෙනවා. විඤ්ඤාණය - මේවා ගැන දැනුවත් වුනේ විඤ්ඤාණයෙන්. රූප, වේදනා, සංඥා, සංඛාර ගැන දැනුවත් වුනේ විඤ්ඤාණයෙන්. තව විදියකට කිව්වොත් එලියේ මොකක්දෝ තියෙනවා, නැත්නම් බල්ලෙක් ඉන්නවා කියලා දැනුවත් වුනේ විඤ්ඤාණයෙන්.

දැන් බලන්න ස්කන්ධ පහම හටගෙන. ඊළඟ ප්‍රශ්නය තමයි අපට හිතෙනවා ඔතන පංච ස්කන්ධය විතරයි නේ හටගත්තේ, පංච උපාදාන ස්කන්ධය නැහැනේ කියලා අදහසක් එනවා. ඒ කියන්නේ දුක හටගත්තේ නැහැ. රූපයක් තියෙනවා කියලා දැනගත්තා විතරයි කියලා හිතෙනවා, එහෙම පැහැදිලිත් කරනවා. අපි නුවණින් හොයන්න ඕනේ ධර්මයට එකඟව, එහෙම දෙයක්ද වුනේ කියන එක. ඔතන කිසිම උපාදානයක් යෙදිලා නැත්ද කියන එක නුවණින් හොයන්න ඕනේ. ගොඩ ඉන්න බල්ලා තමයි හිතුවේ අතන රූපයක් තියෙනවා කියලා (බල්ලාගේ දෘෂ්ටියේ ඉන්න නිසා 'මම' කියන බල්ලා). ඕක 'මම' කියලා හිතාගෙනම හිතන්න, එතකොට තමයි අවබෝධ වෙන්නේ. මට පෙනෙනවා බල්ලෙක් ඉන්නවා කියලා. නමුත් මම දන්නේ නැහැ ඔය දෘෂ්ටියකින් හඳපු බල්ලෙක් කියලා. රූපයට නමකුත් දුන්නා තව බල්ලෙක් කියලා. දැන් ඕක දැනගත්තේ 'මම'. 'මම' කියන කෙනා. මෙතන ඉන්න 'මම' තමයි අතන ඉන්න රූපය ගැන දැනුවත් වුනේ. මෙතන ඉන්න මට සාපේක්ෂව තමයි අතනක් තියෙන්නේ. ඒ කියන්නේ අභ්‍යන්තරයට සාපේක්ෂව බාහිරයක් පෙන්නනවා. බාහිරව ඉන්න බල්ලෙක් කියලා කියන රූපයක් පෙන්නුම් කරන්නේ 'මට' සාපේක්ෂව. අභ්‍යන්තරයි බාහිරයි කියලා දෙපැත්තක් බෙදුවා. දෙකොනක්. අභ්‍යන්තරය එක කොනක්, බාහිරය තව කොනක්. ද්වයතාවයක් ආවා. අභ්‍යන්තරයක් නැතුව බාහිරයක් ගැන කථා කරන්න බැහැ. මේ අභ්‍යන්තරයට තමයි අපි 'මම' කියලා කියන්නේ. මට සාපේක්ෂව බාහිරයක් හැදුවා.

දැන් ඔතන සක්කාය දිට්ඨියක් ඇවිල්ලා. සක්කාය දිට්ඨියක් එනකොට උපාදානයක් අනිවාර්යෙන්ම තියෙනවා. උපාදානය ගැනත් එන වැරදි දෘෂ්ටිය තමයි සක්කාය දිට්ඨිය. අපි මුලින් කිව්වේ පංච උපාදාන ස්කන්ධය තමයි සක්කාය කිව්වේ. ඒක ගැනත් එන වැරදි දෘෂ්ටියකට තමයි සක්කාය දිට්ඨිය කිව්වේ. දැන් අපට හොඳට පෙනෙනවා සක්කාය දිට්ඨියම ඇතිවෙලා. එහෙනම් උපාදානය නැහැ කියන්න බැහැ. උපාදානය අනිවාර්යෙන්ම ඇති වෙනවා. ඒකෙන් තේරුම් ගන්න රූප උපාදානය, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ උපාදානය කියන ස්කන්ධ පහම, ජාති පහම හටගෙන ඉවරයි. පංච උපාදාන ස්කන්ධයම හටගෙන ඉවරයි. ඕක කවුරුවත් කිව්වාට නෙවෙයි, නුවණින් බලන්න. බල්ලෙක් ඉන්නවා කියලා විශ්වාස කරන කොටම අවිද්‍යාව අනිවාර්යෙන් යෙදිලා.

අවිද්‍යාව නැති වුනොත් උපාදානය නැති වෙනවා. ඇත්ත ඇති සැටියෙන් දැන ගත්තා නම් කවදාවත් බල්ලෙක් පිහිටන්නේ නැහැ. ඒ දෘෂ්ටියකට වැටෙන්න විදියක් නැහැ. රූපය නිසා වෙන්න පුළුවන් 'මම' කියලා හිතෙන්නේ. වේදනාව, සංඥාව, සංඛාරය, විඤ්ඤාණය නිසා වෙන්න පුළුවන් 'මම' කියලා හිතෙන්නේ. බල්ලෙක් ඉන්නවා කියලා දැනගත්තා කියන්නේම දෘෂ්ටිගත වුනා.

තව උදාහරණයක් තමයි - අපේ අවධානය යොමු වුනා යමකට. කෝච්චියේ යන ගමන් පොල් ගහක් දැක්කා, ගෙඩි පිරිලා. දැක්කා කියන්නේ විඤ්ඤාණයට අහුවුනා. ඕක ගැන දැන් නැවත කථා කරනවා. දැන් හිතේ සටහනක් ඉතුරු වුනා. ඒක පිළිගත්තා. රූපයේ බැස ගත්තා. ගෙඩි තිබුණු පොල් ගසක් කියලා භාර ගත්තා. ඔය භාර ගැනීමමයි රූපයේ බැස ගැනීම. රූපය පිලිගැනීම. ඔය භාර ගැනීමමයි රූපය ගැන අපට කථා කරන්න පුළුවන්කම. අභිනන්දති. අභිවදති. ඕකමයි කැමති වීම, නන්දනය කිරීම. අපි ඒක දැන් හිතේ ඉතුරු කරගත්තා. අපි දන්නෙත් නැහැ ඕක හිතේ ඉතුරු වුනා කියලා සමහර විට. දිට්ඨිගත වෙලාමයි ඕක කරන්නේ. පොල් ගහ තිබුනේ 'මට' සාපේක්ෂව. පොල්ගහ දැක්කේ 'මම'. දැන් 'මම' ඇවිල්ලා. සක්කාය දිට්ඨිය රිංගලා අපට නොදැනුවත්වම. සක්කාය දිට්ඨිය හරි සියුම්. **යං රූපෙ අභිනන්දතො, අභිවදතො, අජ්ඣොසාය තිට්ඨතො උප්පජ්ජති නන්දි**- නන්දිය උපදිනවා. **යං රූපෙ නන්දි තදුපාදානං** - ඒ නන්දියමයි උපාදානය වෙන්නේ.

ධර්මයට අනුව බලන කොට අපට පෙනෙනවා මෙතන ජාති පහක් හටගෙන. රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ. ඔය පහ නැතුව පොල් ගහක් පෙනෙන්න බැහැ. ඊළඟට ඔතන උපාදානය තිබුනද නැත්ද? අපි තර්ක කරන්නේ පංච ස්කන්ධය තිබුනා, උපාදානය නැහැ කියලා. ඒ වුනාට ඔතන උපාදානයත් තිබුණා. ඒ නිසා තමයි 'මම' ඕක දැක්කා කියලා හිතෙන්නේ. 'මම' ඒක භාර ගත්තේ. නැත්නම් නිමිත්තක් විදියට ඉතුරු කරගත්තේ. ඇහෙන් දැකලා නිමිත්තක් ඉතුරු කරගෙන. නැවත මතක් කරලා බලන්න පුළුවන්, නැත්නම් තව කෙනෙකුට කියන්න පුළුවන්. **චක්ඛු නා රූපං දිස්වා නිමිත්තගාහි හොති** - ඇහෙන් රූප දැකලා නිමිති ඉතුරු කරගෙන. එහෙම වෙනකොට රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ හටගෙන. ඒ වගේම එතන 'මම' මේක

අත්දැක්කා කියන දෘෂ්ටියකුත් යෙදිලා.

එතකොට අනිවාර්යෙන් රූපය භාර අරගෙන උපාදාන කරලා. පංච උපාදානයක් හටගෙන. දැන් ප්‍රශ්න කරන්න ඕනේ ඒ වුනාට අපට දුකක් ඇතිවුනාද නැත්ද කියලා. බුදුහාමුදුරුවෝ පෙන්නනවා **සංඛිත්තෙන පංචඋපාදානඛන්ධා දුක්ඛා** - අපට නම් දුකක් නෙවෙයි සමහර විට සතුටක් තියෙන්නේ. අපට දුක පෙනෙන්නේ නැති නිසා තමයි ඉතුරු කරගන්නේ. උදා: අහක යන නයි ඔඩොක්කුවේ දාගෙන යනවද දුකනම්. නිමිති ඉතුරු කර ගන්න එක දුකයි කියල දැක්කා නම් එහෙම තියාගනියිද? නැහැ. **දුක්ඛෙ අඥාණං** නිසා තමයි මතක තියාගෙන එකතු කරගන්නේ. **අභිනන්දති අභිවදති.** බුදුහාමුදුරුවන්ට තමයි **දුක්ඛෙ ඥාණං.** මේ පෙර නොඇසූ විරූ ධර්මතාවය දැකලා අවබෝධ කරලා දුක කරගහගෙන යන සත්වයා ගැන අනුකම්පාවෙන් දේශනා කරන්නේ දුක ගැන. අපි හිතන්නේ නැහැ දුක කියලා. හිතන්නෙම මේක තමයි සැප කියලා. දැල්ලට පනින පළගැටියෝ වගේ. කොච්චර කිව්වත් පනින්න එපා කියලා අහන්නේ නැහැ මෝඩකම නිසා. දුක සැපයි කියලා දුක් තව තවත් ගොඩ ගහගන්නේ දුක පිළිබඳව ඥාණය නැති නිසා. අවිද්‍යාව තමයි නොදන්නා කම. අවිද්‍යාව මුල් වෙලා එක එක ජාතියේ මුලාවන් ඇති කර ගන්නවා. ඇත්ත ඇති හැටියට නොදන්නවා වුනහම එක එක විදියට මුලා වෙනවා. ප්‍රධාන වෙන්නේ අවිද්‍යාව. ඒ අවිද්‍යාව නිසා එක එක්කෙනා වැටෙන මුලාවන් වෙනස්. ඇත්ත ඇති හැටියට නොදන්නකම මයි හේතුව. මේ බිත්තියෙන් එහා පැත්තේ තියෙන්නෙ මොනවාද කියලා දන්නේ නැත්නම් එක එක්කෙනා හිතන්නේ වෙනස් දේවල්. මුල් වෙන්නේ නොදන්න කම - අවිද්‍යාව. මුලාව එක එක්කෙනාගේ ප්‍රඥා මට්ටම අනුව වෙනස් වෙන්න පුළුවන්.

**ප්‍රශ්ණයකට පිළිතුරක්:** විඥ්ඥාණය මායාකාරයෙක් කියලා වටහා ගන්න නිකන් බැහැ. **ජානතො පස්සතො** - විඥ්ඥාණය කියපු දෙය පිළිගෙන නම් මායාවට අහුවෙලා. අපි ලෝකය පිළිඅරගෙන ලෝකයට බනිනවා මේ විඥ්ඥාණය මායාකාරයෙක් කියලා. එකතු කරන්නේ දුක කියලා අවබෝධ කරගත්ත දවසට තමයි එකතු කරන්නේ නැත්තේ. මේ එකතු කරන්නේ අපට සතුට ගෙනදෙන දේවල් කියලා හිතන තරමට එකතු කරනවා. තව අයට ඒ ගැන කියන්න දේවල් තියෙනවා. කියන එක

තව කෙනෙකුට ඇහෙන්න කියන්නත් පුළුවන් තනියෙන්ම කථා කර කර ඉන්නත් පුළුවන් හිත ඇතුලේ. ඒ කරන ඒවාට විපාක ලැබෙනවා. සසරෙ යනවා. එක පැත්තකින් දුක දුක විදියට දැකලා නැහැ. අපි රූපයක් තියෙනවා කියලා දැනගන්න කොටම පංච උපාදාන ස්කන්ධය හටගෙන කියලා පිලිගත්ත විට එතන අපට නොපෙනෙන දෙයක් තියෙනවා. දුක හටගත්තා කියලා පෙනෙන්නේ නැහැ. **දුක්ඛ අඥාණං.** බුදු කෙනෙක් තමයි පෙර නොඇසූ විරූ ධර්‍මතාවයක් පැහැදිලි කරන්නේ. **පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු.** කලින් නොඇසූ විරූ ධර්‍මතාවයක්. බ්‍රහ්මයෙක්, මාරයෙක්, දෙවි කෙනෙක්, මේ ලෝකයට අයිති කිසියම් කෙනෙක් මීට කලින් නොඇසූ නොදුටු ධර්‍මතාවයක් අවබෝධ වුනේ. ඒක තමයි මේ දුක්ඛ ආර්ය සත්‍යය. දුක කියන එක මොකක්ද? පංච උපාදාන ස්කන්ධය.

ඒ බුදුහාමුදුරුවෝ කෙටියෙන් කියන එක. අපි මේක ශ්‍රද්ධාවෙන් පිලිගන්න ඕනේ. යම් තැනක පංච උපාදාන ස්කන්ධය තිබේද ඒක දුක වෙන්න ඕනේ අපි පිලිගත්තත් නැතත්. තවම අපට වැටහෙන්නේ නැහැ එතන දුක කියලා. අපට වැටහෙන්නේ එතන සැප කියලා. ඒ නිසා තමයි අපි ඕකේ සතුටු වෙන්නේ, කථා කරන්නේ, දැඩිව භාර ගන්නේ. භාර ගත්තා නම් අභිනන්දනය නොකර ඉන්නේ නැහැ. අභිනන්දනය නොකර ඉන්න පුළුවන් විදියක් තියෙනවා. එකම විදියයි තියෙන්නේ පටිච්ච සමුප්පන්න බව දකින්න ඕනේ. පටිච්ච සමුප්පාදය නැත්නම් ධර්‍මය දැක්කොත් විතරයි ගැලවෙන්න පුළුවන්. ලෝකය දකින දෙවිදියක් තියෙනවා. වතුරට එබෙන බල්ලා දිහා බලාගෙන ඉන්න අපි රැවටිලා නැහැ. අපි දන්නවා බල්ලා මොන විදියටද රැවටුනේ කියලා. බල්ලාගේ මානසිකත්වයෙන් බලන කොට මේ හේතු යෙදුනා නම් මෙහෙම පෙනෙනවා කියන අවබෝධයක් තියෙන්න ඕනේ. ලෝකය හටගන්නේ මේ හේතු නිසා කියන අවබෝධයක් තියෙනවා. ඒ එක්කම අපි නිරෝධයත් දන්නවා. ඒ හේතු නොයෙදෙන කොට අපට එහෙම ලෝකයක් හටගන්නේ නැහැ. එහෙම නිරෝධයකුත් දන්නවා. අන්න ඒ විදියට ලෝකයක් දකින්නත් පුළුවන්. ලෝක නිරෝධයත් දකින්න පුළුවන්. එතනදී අපට මාර්ගයක් වැඩක් නැහැ, රැවටීම නැති නිසා. රැවටෙන කෙනාට මාර්ගයක් අවශ්‍යයි. රැවටෙන්නේ නැත්නම් තවත් කළ යුතු දෙයක් නැහැ. අවිද්‍යාව ටිකක්වත් නැත්නම් කළ යුතු සියල්ල නිම කරන ලදී. නමුත් අපි ඇහෙන් දකින විට බාහිර දෙයක් පනවනවා නම්

තවම අපි ඉන්නේ බල්ලාගේ දෘෂ්ටියේ.

**ප්‍රශ්ණයකට පිළිතුරක්:** ආයතනයන්ගේ පටිලාභයයි, ස්කන්ධයන්ගේ පහළවීමයි සිද්ධ වුනාද බල්ලා බල්ලෙක් ඉන්නවා කියන කොට? පහළ වුනා. පංච ස්කන්ධයම පහළ වෙලා. රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ. ආයතන පටිලාභයකුත් වෙලා. ඇහෙන් දැකලා, ඇහැක් ඉපදිලා. ඒ වගේම අනිත් ආයතන උපද්දලා ඔය බල්ලාව අත්දකින්න පුළුවන් කියන දැක්මකටත් ඇවිල්ලා. බාහිර ලෝකයට අයිති බල්ලෙක් ඉන්නවා, ඒ බල්ලාව මේ මේ ආයතන වලින් අත්දකින්න පුළුවන් කියන නුවණකටත් ඇවිල්ලා. ඒ නුවණ අවිද්‍යාවෙන් හටගත්ත එකක්. ලෝකයට අයිති නුවණ. ලෝකෝත්තර දැක්ම නෙවෙයි. ඕක තමයි ඉපදීම. ජාතිය.

**ප්‍රශ්ණයකට පිළිතුරක්:** චක්ඛු සම්ඵස්සයක් ඇති නොවුනා නම් - බල්ලාගේ චක්ඛු විඤ්ඤාණයෙන් දැනගත්තේ නැත්නම් එහෙම වෙයිද? - ඇහැකුත් තියෙනවා, ඇහැට අරමුණු වෙන රූපයකුත් තියෙනවා කියලා දැනගත්ත නිසාම නේද ඔය දෘෂ්ටියට ආවේ? වතුරේ බල්ලෙක් ඉන්නවා කියන දෘෂ්ටියට ආවේ. ඇසයි, රූපයයි, චක්ඛු විඤ්ඤාණයයි පහලවීම නිසා හටගත්ත චක්ඛු ඵස්සය නිසාමයි ඔය දෘෂ්ටිගත වීම වුනේ. ඒකට අදාළ ඉතුරු වේදනා, සංඥා, චේතනා, සංඛාර පහළ වුනේ චක්ඛු සම්ඵස්සය හේතුවෙන්මයි. ඵස්සය නොවුනා නම් ඒක වෙන්නේ නැහැ. එහෙම දැක්මක් එන්නේ නැහැ. චක්ඛු සම්ඵස්සය අනිවාර්යෙන් හේතුවෙලා තියෙනවා ඒ දැක්මට එන්න. අපි රූපයක් තියෙනවා කියලා හිතන්නේ අනිවාර්යෙන් චක්ඛු සම්ඵස්සය නිසාමයි. ඇහැයි, රූපයයි, විඤ්ඤාණයයි යෙදුනේ නැත්නම් රූපයක් තියෙනවා කියලා දැනගැන්මකට එන්නේ නැහැ. ඉස්සෙල්ලා බැස ගන්න රූපයක් හටගන්න ඕනේ. ඒ රූපය ඵස්සය නිසා හටගත්ත එකක්. ඔය දෘෂ්ටිය ඵස්සය නිසා හටගත්ත දෘෂ්ටියක්. ඒකෙන් තේරුම් ගන්න ලෝකයට අයිති හැම දෘෂ්ටියක්ම ඵස්සය නිසාම හටගත්ත දෘෂ්ටියක්. ඵස්සය කියන්නේ අභ්‍යන්තර ආයතනයයි, බාහිර ආයතනයයි - ඇහැට නම් රූප, කනට නම් ශබ්ද. අභ්‍යන්තර කියන්නේ ඇහැ, කන, නාසය, දිව, කය, මනස. බාහිර ආයතනය කියන්නේ රූප, ශබ්ද, ගන්ධ, රස, පොට්ටබ්බ, ධම්ම. එතකොට අභ්‍යන්තර ආයතනයි, බාහිර ආයතනයි ඒවාට අදාළ විඤ්ඤාණයි පහළ වුනා කියන එක තමයි ඵස්සය

කියන්නේ. එතකොට ඵස්ස පච්චයා එන දෘෂ්ටි තමයි ලෝකයට අයිති දැකීම් ඔක්කොම. එකක්වත් ඔයින් තොර දෘෂ්ටි නැහැ. යම්කිසි මතයකට ආවා නම් ඒක ඵස්සය ප්‍රත්‍යයෙන්මයි - ඵස්ස පච්චයා මයි. එහෙම ආපු දෘෂ්ටි තමයි ඔය 62ක් මිථ්‍යා දෘෂ්ටි තිබුනේ. අද කාලයේ අපි ඉන්නෙත් ඔය දෘෂ්ටි වල. ඒවා තිබුනේ ඒ කාලයේ විතරක් නෙවෙයි. ආර්ය මාර්ගයට වැටෙන කල් ඉන්නේ ඔය දෘෂ්ටි වල - ඵස්ස පච්චයෙන් ආපු දෘෂ්ටි. ඵස්සය නිසා ආපු වේදනාවක්, ඵස්සය නිසා ආපු සංඥාවක්, ඵස්සය නිසා ආපු සංඛාර. ඵස්සය එක අන්තයක්, ඵස්ස සමුදය තව අන්තයක්, ඵස්ස නිරෝධයමයි මැද. මධ්‍යම ප්‍රතිපදාව, ආර්ය අෂ්ඨාංගික මාර්ගය (මජ්ජෙ සූත්‍රය).

**ප්‍රශ්ණයකට පිළිතුරක්:** දැනට ඕක දෘෂ්ටි කියලා දාගන්න. ඕක මිච්ඡා දෘෂ්ටිම වෙන්නේ නැහැ මේ ගැන ටිකක් අවබෝධය තියෙනවා නම්. මිච්ඡා දෘෂ්ටි කියන්නේ මේවා ගැන කිසිම අවබෝධයක් නැහැ. මම කියලා ගත්තොත් තමයි සක්කාය දිට්ඨිය. මිච්ඡා දෘෂ්ටිය නම් අනිවාර්යෙන් සක්කාය දිට්ඨිය එතන තියෙනවා. නමුත් මිච්ඡා දෘෂ්ටි නැතිවෙලත් සක්කාය දිට්ඨිය තියෙන්න පුළුවන්. බොහෝ දෙනා ඉන්නේ එතන, මිථ්‍යා දෘෂ්ටියේම නෙවෙයි, නමුත් සක්කාය දිට්ඨිය ඇතිවෙන්න පුළුවන්. මිථ්‍යා දිට්ඨිය තියෙනවා නම් අනිවාර්යෙන් අපාගත වෙනවා. මිථ්‍යා දෘෂ්ටිය තියෙන කොට අපාගත වෙන්නේ සක්කාය දිට්ඨියෙන් හදපු මම. කෙනෙකුට මිථ්‍යා දෘෂ්ටියෙන් මිදෙන්න පුළුවන්. සුගතියට යන මාර්ගය ඕනේ නම් දැනගන්න පුළුවන්. එතකොට මිථ්‍යා දෘෂ්ටියෙන් මිදිලා කර්මඵල විශ්වාස කරනවා. කර්මඵල විශ්වාස කරපු පලියටම අපාගත වෙන්නේ නැහැ කියලා සහතිකයක් නැහැ. ලෝකයට අයිති සම්මා දිට්ඨියට ආවා. දිව්‍ය ලෝකයට යන මාර්ගය දැනගත්තා. මාර්ගය දැනගත්තටම දිව්‍ය ලෝකයේ යන්න බැහැ. ඒ සඳහා පින් කරන්න ඕනේ. මේක ලෝකයට අයිති නිවැරදි දැක්ම - පව් කළොත් අපායේ යනවා, පින් කළොත් කවදා හරි හොඳ ප්‍රතිඵල ලැබෙනවා. පින පිරිසිදු නැත්නම් දිව්‍ය ලෝකේ සත්තු වෙලා ඉපදෙන්න පුළුවන්. අජානීය අශ්වයෝ එහෙම ඉන්නවා. දාන දීලා තියෙනවා නමුත් තුන්සිත පැහැදිලා නැහැ. විශේෂයෙන් සීලය පිරිසිදු නොවුන විට තමයි ඒ විදියට වෙන්නේ. දිව්‍ය ලෝකයේ, අපායේ යනවා කියලා දැනගන්න එක මිථ්‍යා දෘෂ්ටිය නෙවෙයි. ඒක සම්‍යක් දෘෂ්ටිය. නමුත් ඒක ලෝකයට අයිති දැක්මක්. ඒක

ලෞකික සම්මා දිට්ඨිය. එහෙම අය තමයි පව් කරන්නේ නැතුව පින් කරන්නේ. ඒක හොඳ දැක්මක්, මිථ්‍යා දෘෂ්ටියක් නෙවෙයි. මිථ්‍යා දෘෂ්ටිය කියන්නේ පින් පව් මොනවත් විශ්වාස කරන්නේ නැහැ.

**ප්‍රශ්ණයකට පිළිතුරක්:** දුක්ඛෙ අඥාණං නිසාමයි නිමිති ඉතුරු කරගන්නේ. අපි රූපයේ බැසගන්නේ, රූපය භාර ගන්නේ, රූපයේ සතුටු වෙන්නේ, ඒ ගැන කථා කරන්න කැමති වෙන්නේ දුක ගැන දන්නේ නැති නිසා. මේ ඉතුරු කරගන්නේ දුක කියන එක දන්නේ නැහැ. ඔය පංච උපාදාන ස්කන්ධයක් කියන එක දන්නේ නැහැ. නිමිත්තමයි පංච උපාදාන ස්කන්ධය. ඇයි නිමිත්ත පංච උපාදාන ස්කන්ධය කියන්නේ? වතුරට එබෙන බල්ලාගේ උපමාවේ බල්ලෙක් ඉන්නවා කියන එක තියෙන්නේ ගොඩ ඉන්න බල්ලාගේ මනසේ. ඌට ලිඳෙන් එහාට ගියත් නිමිත්ත අරගෙන බල්ලා ගැන හිතන්න පුළුවන්. ඒ හිතේ ඉතුරු කරගත්ත නිමිත්ත, සටහන. අර අපි ඉතුරු කරගත්ත පොල්ගහ වගේ. එතකොට ඔය නිමිත්තමයි පංච උපාදාන ස්කන්ධය. වෙන මොකක්වත් නෙවෙයි. එතන රූපයක් තියෙනවා, ඒකෙන් එන වේදනාවක්, වින්දනයක් තියෙනවා. සංඥාවත් තියෙනවා, සංඛාර, විඤ්ඤාණත් තියෙනවා. දැන් ඇස් දෙක වහගෙනත් ඕක ගැන හිතන්න පුළුවන්. ඒ ලෝකයේ ජීවත්වෙන්නේ. ඒක තමයි පංච උපාදාන ස්කන්ධය. ඒක ගැන එන වැරදි දෘෂ්ටිය තමයි සක්කාය දිට්ඨිය. නිමිත්තමයි ඇත්තටම සක්කාය වෙන්නේ. ඒ නිමිත්ත මට සාපේක්ෂවයි තියෙන්නේ. හිතන්න කෙනෙක් ඉන්නවා. දෙයක් පැනෙව්වාට පස්සේ ඒ දෙය අත්දකින්නත් කෙනෙක් ඉන්නවා. දෙය කියන එක බාහිරයි. මනසේ ඇති වුනාට එළියේ තියෙන දෙයක් ගැන තමයි හිතන්නේ. ඒක බාහිර ලෝකයට අයිති දෙයක්. මෙතන හිතන්න කෙනෙක් ඉන්නවා.

ඔතන තමයි සක්කාය දිට්ඨිය, ආත්ම සංඥාව පහළ වෙන්නේ. මනසින් ධම්ම සිහි කරන කොට තමයි ආත්ම සංඥාව පහළ වෙන්නේ. මනසට අරමුණු වෙන ධම්ම තමයි ඔය හදාගත්ත දෙය. ප්‍රපංච කියන්නෙත් ඕවා. විතක්ක කියන්නෙත් ඕවා. **යං වෙදෙති තං සංජානාති, යං සංජානාති තං විතක්කෙති, යං විතක්කෙති තං පපංචෙති** - ප්‍රපංච කියන්නේ මනසින්ම හදාගෙන තියෙනවා. මට හිතන්න ලෝකයක් තියෙනවා. ප්‍රපංච ලෝකයක්. **තතො නිධානං පපංච සංඥා** - මේක

තමයි මේ ප්‍රපංච සංඥාවේ නිධානය, ඇතිවෙන්නේ මෙහෙමයි. ප්‍රපංච තමයි අතීත, අනාගත, වර්තමාන කියලා බෙදන්නේ. හිතේ ඇති කරගත්ත ධම්ම කියන එක - ධම්ම කියන්නේ මනසට මෙනෙහි කරන්න දෙයක් තියෙනවා. මනසට අරමුණු වෙන්නේ ධම්ම. ඇහැට රූප වගේ මනසට ධම්ම. බල්ලා වතුරට එබුන විට හදාගත්තා ධම්මාරම්මණයක් - තව බල්ලෙක් කියලා. ඒක ධම්ම. ඒක තමයි සටහන කියන්නේ. ඔය සටහන දිහා හොඳට බැලුවොත් පෙනෙයි පංච උපාදාන ස්කන්ධයක්ම. ඒකේ රූප ගතිය තියෙනවා, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ ගතිය තියෙනවා. ඒ හදාගත්ත පංච උපාදාන ස්කන්ධයම, ධම්ම වෙන, නැත්නම් දෙයක් වෙන - සිහි කරන්න දෙයක් තියෙනවා. මනසින්ම හදපු දෙය තමයි මනසටම අරමුණ වෙන්නේ. දෙය නැත්නම් වතුරේ ඉන්න බල්ලා හැදුවේ මනස. මනසින්ම හදපු දෙයක් සිහි කරන්නේ - ධම්ම. ඒක නැවත නැවත සිහි කරන්න පුළුවන්. ඒකට නැවත අනෙක් ආයතන අවශ්‍ය නැහැ. නිදාගෙන හීනෙන් වුනත් බලන්න පුළුවන්.

මේ මනසට අරමුණු වෙන ධම්ම නිසා තමයි ආත්ම සංඥාව එන්නේ. ඒ නිසා මෙතන **සබ්බෙ ධම්මා අනත්තාති** කියන එක දකින්න තියෙනවා. එතෙන්දි කියන්නේ නැහැ අනිත්‍ය බලන්න කියලා. එතන කියන්නේ නැහැ දුක බලන්න කියලා. **සබ්බෙ සංඛාරා අනිච්චාති, සබ්බෙ සංඛාරා දුක්ඛාති** කියලා කියනවා. **සබ්බෙ ධම්මා අනත්තාති** - එතන ධම්මා කියන තැන තමයි ආත්ම සංඥාව එන්නේ. සක්කාය දිට්ඨිය පිහිටන්නේ ඔතන. ඇහෙන් රූප සංඥාව ගැනීමේදී මනසට භාර කරන්න දෙයක් හැදෙනවා. හිතට අඳුනගන්න දෙයක් භාරදෙනවා. රූප සංඥාව විතරයි ඇහැට ගන්න පුළුවන්, වර්ණ සටහනක් විතරයි. ඕක භාරදෙනවා මනසට. මනසට භාර දෙන්නේ ධම්ම කරලා. එතකොට මනසට නැවත ඇහැ ඕනේ නැහැ. දැන් ඇහේ වැඩේ කරලා ඉවරයි. මනසට හිතන්න දැන් ධම්ම හදලා දීලා තියෙන්නේ. එතකොට මනස තමයි ඔය ධම්ම කියන එක අරගෙන ඒක ගැන චේතනා ඇති කරන්නේ. චක්ඛු විඤ්ඤාණයේ කෘත්‍ය ඇහැයි රූපයයි තියෙනවා කියන එක විතරයි. ඊටපස්සේ මනස තමයි ඉතුරු වැඩ ටික කරන්නේ - මේ සංස්කරනය කරන්නේ. ඒකට තව දේවල් එකතු කරනවා - කලින් අත්දැකීම් ටික ආදිය. ඒ පරණ ධම්ම. අවිද්‍යාවෙන් පෙර එකතු කරපු දේවල් - ආශ්‍රව. පෙර ඇසුරු කරපු දේවලුත් ගන්නවා දැන් ගත්ත දෙයට. ඒ ටික දමලා

අළුත් එකක් හදනවා. චේතනා ටිකක් හදනවා. ඊට පස්සේ ඒ ගැන නැවත මෙනෙහි කරන්න පුළුවන්. එතකොට ඒක පුරාණ ආශ්‍රවය. අලුත් එකට ඒක එකතු කරන්න පුළුවන්. නැවත හිතන එක. ඒ බල්ලා නිසා තරහ ගන්න පුළුවන්, කැම දෙන්න පුළුවන්. ඒ කියන්නේ පින් සහ පව් කරන්න පුළුවන් ඒ හදාගත්ත ධම්මාරම්මනය නිසා. ඒ සම්බන්ධව භාවනා කරන්නත් පුළුවන්. ධ්‍යානයක් වඩාගන්නත් පුළුවන්. ඔය අරමුණම හිතේ තියාගෙන බලාගෙන හිටියොත් හොඳ සමාධියකට එනවා. ඒ සමාධිය ධ්‍යාන වලට වඩන්නත් පුළුවන්. කසින භාවනා වලදී එහෙම ඕක කරනවා. නිමිත්ත හෝ සටහන අරගෙන ඒ දිහා බලාගෙන ඉන්නවා. එහෙම බලාගෙන ඉඳලා අෂ්ඨසමාපත්ති දක්වාම වඩන්න පුළුවන්. රූපාවචර විතරක් නෙවෙයි අරූපාවචර දක්වාම වඩන්න පුළුවන්. අරූපාවචර වඩන කොට ඒවාට කියනවා පින් හෝ පව් නෙවෙයි **ආනෙඤ්ඤාභිසංඛාර කියලා.** මෙතනත් අවිද්‍යාව තියෙන්නේ. **අවිජ්ජා පච්චයා සංඛාරා.**

**ප්‍රශ්ණයකට පිළිතුරක්:** සංඥාව කියන කොට රූපයක් කියන හැඟීමක් තියෙනවා, වේදනාව, සංඥාව, සංඛාරය, විඤ්ඤාණයත් තියෙනවා. ඒක තමයි ධම්ම වෙන්නේ. පහම තියෙනවා කියලා අපි හිතනවා. මනසට අරමුණු කරන්න පුළුවන්. සංඥාව කියලා එළියේ තියෙන එකක්මයි මේ හිත හිතා ඉන්නේ කියලා ද හිතන්නේ, එළියේ තියෙන පොල්ගහ ගැන ද හිතන්නේ? එළියේ තියෙන රූපය ගැනයි ඔය හිතන්නේ. රූපමය හැඟීම එතන තියෙනවා. සංඥාව කිව්වාට ඔතන නාම ධර්ම ටික තියෙනවා. සබ්බ චිත්ත සාධාරණ චෛතසික කියන හතම තියෙනවා, තව වැඩිපුර චෛතසිකත් තියෙන්න පුළුවන්. චෛතසික තමයි වේදනා, සංඥා, චේතනා, ඵස්ස, මනසිකාර. ඒවා විතරක් නෙවෙයි - 52ක් තියෙනවා. ඒ 52ම යෙදෙනවාත් නෙවෙයි. මේවාට අමතරව තව කීපයක් යෙදෙන්නත් පුලුවන්. අපට ප්‍රකට වෙන්නේ එකක් හෝ කීපයක් වෙන්න පුළුවන්. සංඥාව කියලා හිතුවාට චිත්ත චෛතසික සියල්ලම තියෙනවා. ඔය පොදිය තමයි ධම්ම වෙලා හිතටම අරමුනු වෙන්නේ. එතනත් නෙවෙයි වැරැද්ද තියෙන්නේ. ධම්ම කියන එක මනසට අරමුණු වෙනවා කියන එකේ වැරැද්දකුත් නැහැ. **මේ අරමුණු කරන්නේ අර එළියේ තියෙන රූපයක්නේ, ලෝකයට අයිති දෙයක්නේ කියලා හිතන තැන තමයි ලොකුම වැරැද්ද තියෙන්නේ.** මේ මනසට අරමුණු වෙන

ධම්ම කියලා පෙනෙන්නේ නැහැ. හිතට අරමුණු වෙන ධම්ම කියන්නේ හිතෙන් දකින හීනයක් වගේ දෙයක්. හිතෙන්ම හදපු දෙයක් හිතෙන් බලනවා. ඕක එළියේ තියෙන දෙයක් වෙන්න බැහැ. නමුත් අපි ඉන්නේ එළියේ තියෙන දෙයක් මතක් කරනවා කියන දෘෂ්ටියේ. බල්ලාට වෙලා තියෙන්නේ ඕකයි. බල්ලාව හැදුවේ හිතෙන්. නමුත් ඌ බල්ලා ගැන මතක් කරන කොට හිතන්නේ එළියේ ඉන්න බල්ලෙක් ගැන හිතනවා කියලා. හිතෙන් හදපු බල්ලෙක් ගැන හිත හිතා ඉන්නවා කියලා අවබෝධයක් නැහැ. ලෝකයට අයිති සම්, මස්, නහර වලින් හැදුනු බල්ලෙක් ගැන හිතනවා කියලයි දකින්නේ. ඔය දෘෂ්ටියේ ඉඳන් ලෝකය ගැන හිතන කොටයි 'මම' පහළ වෙන්නේ.

එතකොට ධම්ම කියන එකේ ආත්ම හැඟීම ඇවිල්ලා. 'මම' තමයි එළියේ තියෙන දෙය ගැන හිතන්නේ. ඔතන තමයි වැරැද්ද තියෙන්නේ. ඒ නිසා තමයි බුදුහාමුදුරුවෝ දේශනා කරන්නේ **සබ්බෙ ධම්මා අනත්තාති** කියන එක තේරුම් ගන්න. අපි ඉන්නේ ආත්ම කියන තැන. ධම්මය දකින්නේ ආත්ම දෘෂ්ටියෙන්. එළියේ තියෙන දෙයක් කියලා දකින්නේ. එතකොට අපට **සබ්බෙ ධම්මා ආත්මාති** - ධම්මය හිතෙන්නේ ලෝකයේ තියෙන දෙයක් කියලා. ලෝකයට අයිති මම අත්දැකපු දෙයක් විදියට තමයි අනුන්ට කියන්නේ. ඒක කරන්නේ ආත්ම දෘෂ්ටියෙන්. ධම්ම නිසා ආත්ම දෘෂ්ටිය ඇවිල්ලා තියෙනවා. බුදුහාමුදුරුවෝ පෙන්නනවා **සබ්බෙ ධම්මා අනත්තාති** කියලා ඇත්ත ඇති හැටියට දකින්න. එහෙම කියන්නේ අපි ඉන්නේ ආත්ම දෘෂ්ටියෙන් නිසා මේ ධම්ම ආත්ම දෘෂ්ටියෙන් තමයි දකින්නේ. පුද්ගලයා ඉන්නවා, පුද්ගලයාට අත්දකින්න ලෝකය තියෙනවා කියන දෘෂ්ටියෙන් තමයි අපි ධම්ම භාරගන්නේ. **සබ්බෙ ධම්මා අනත්තාති යදා පඤ්ඤාය පස්සති** - ඇත්ත ඇති හැටියට තේරුම් ගන්න, ප්‍රත්‍යක්ෂ කරන්න. මනසට අරමුණු වෙන හැම ධර්මතාවයකම ආත්ම ස්වභාවයක් නැහැ, මේක හිතටම හිතුන සිතුවිල්ලක්. හිතට අරමුණු වුනු හිතෙන්ම හදන දෙයක්. එළියේ තියෙන දෙයක් නෙවෙයි. මනස ඇතුලේම සිද්ධ වුනු දෙයක්. මනස තියෙන්නේ ශරීරය ඇතුලේ කියල හිතුවොත්, ශරීරය ඇතුලේම සිද්ධ වුනු දෙයක්. එළියේ තියෙනවා කියලා හිතන හැම දෙයක්ම මේ බඹයක් පමණ වුනු ශරීරය තුළ සකස් කරපු දේවල්. **සබ්බෙ ධම්මා අනත්තාති** බව තේරුම් ගන්න පුළුවන් ඔය ටික මනසින්ම හදපු දෙයක් කියලා දැක්කොත්. **යදා**

**පඤ්ඤාය පස්සති** - රැවටීම නිසා යම්කිසි දුකක් ඇති කරගත්තා නම් ඒක අතහරිනවා - **අථ නිබ්බින්දති දුක්ඛෙ එස මග්ගො විසුද්ධියා** - එතකොට තේරුම් ගන්න ඕනේ මේ ලෝකය හදන්නේ මනසින්මයි.

නැවත අර වතුරට එබෙන බල්ලා මතක තියාගන්න - ඇහෙන් දැකලා තමයි රූපයක් තියෙනවා කියන අදහස ආවේ. ඊටපස්සේ ඒක මනසට භාරදුන්නා. නිමිත්තක් හදලා, ධම්මාරම්මනයක් හදලා, මනසට භාරදුන්නා. ඊටපස්සේ මනසට වැදගත් නැහැ ඇහැ තියෙනවාද, රූපය තියෙනවාද ආදී දේවල්. ලෝකයට අයිතියි කියලා විශ්වාස කරන එකේ සටහන තියෙනවා. ඒක තමයි මනසට ධම්මාරම්මනය වෙන්නේ. එතකොට ධම්ම කියන එක පැවතුනේ නැහැ, මනසින් හැදුවා. මනස තමයි මුලින් තියෙන්න ඕනේ, මනස තමයි ප්‍රධාන වුනේ. බල්ලාගේ මනසින් තමයි එළියේ ඉන්න බල්ලෙක් හැදුවේ. බාහිර බල්ලා ඉස්සෙල්ලා පහළ වෙලා ඊට පස්සේ මනස ඇතිවුනා නෙවෙයි. බාහිරව ඉන්න බල්ලා දකින්න මනසක් හැදුනා නෙවෙයි. මනස තමයි මුල් වෙන්නේ. **මනො පුබ්බංගමා ධම්මා** - ධම්ම කියන එක දෙවෙනුව. මනස මුල්කරගෙන මයි ධම්ම හදන්නේ. ඒ මනසමයි ශ්‍රේෂ්ඨ - **මනො සෙට්ඨා මනොමයා.** 'මයා' කියන්නේ කරන ලද. **මනොමයා** තමයි අපට තියෙන ලෝකය. බාහිර ලෝකය දකින්නේ නැහැ, **මනොමයා** මයි දකින්නේ. ඒ මනසින් හදපු දෙය ගැන අපි සමහර විට කැමතියි, සමහර විට අකැමතියි. ඒ දෙය ගැන තමයි අපි කථා කරන්නේ, ක්‍රියාකරන්නේ. **මනසා චෙ පසන්නෙන භාසති වා කරොති වා** - **මනසා චෙ පදුට්ඨෙන භාසති වා කරොති වා** - ප්‍රසන්න කරගෙන ඒ ගැන හිතන්නත් පුළුවන්, අකමැති විදියට ඒ ගැන කියන්න, හැසිරෙන්නත් පුළුවන්. ප්‍රසන්න විදියට කළොත් දිව්‍ය ලෝකයේ. ඒක **කම්මස්සකතා සම්මාදිට්ඨිය** - මනසින් හදපු දෙය ගැන ඊළඟට ඒ දෙය අමතක කරලා මේක හොඳයි කියලා භාර අරගෙන ප්‍රසන්න විදියට හිත සතුටු කරගෙන වැඩ කළොත් පින් කරනවා. අසතුටු විදියට වැඩ කළොත් පව් කරනවා. පව් කළොත් ගොනා පසුපස එන කරත්ත රෝදය වගේ - බේරෙන්න බැහැ, බර ඇදගෙනමයි යන්න ඕනේ - පව් විපාකමයි එන්නේ. කරත්තේ කියන්නේ බොහොම බර දෙයක්. අප්‍රසන්න විදියට වුනොත් බරට එන කරත්ත රෝදය වගේ. ප්‍රසන්න විදියට කළත් පස්සෙන් එනවා. හෙවනැල්ල වගේ, බර නැහැ. සනීපයි, සතුටුයි, සුවදායකයි. ඒවාට තමයි පින් කියන්නේ.

හොඳ විපාක කියලා සතුටු වෙන දේවල් කියන්නේත් අත හරින්නේ නැතුව පස්සෙන්ම එනවා. පස්සෙන් එනවා කියන්නේ ලෝකයේ යනවා. සංසාරයේ යනවා. නමුත් සුවදායකයි. දිව්‍යලෝකය වගේ, බර නැහැ.

**මනොමයා** පැත්ත තමයි අවබෝධ කරගන්න ඕනේ. මේ මනසින් හදපු දෙයක් නේද කියලා. අවබෝධ කළේ නැත්නම් පින් පව් කරනවා. පින් පව් ගැන විශ්වාස කරන එක තමයි ලෝකෙට අයිති සම්මා දිට්ඨිය. මිථ්‍යා දෘෂ්ටියෙන් මිදීම. එතනින් එහාට **මනොමයා** කියන එක දැකීම තමයි ලෝකෝත්තර සම්මා දිට්ඨිය. දැන් එලිය පැත්තට නෙවෙයි ප්‍රඥාව යොමු කරන්නේ, මනසට. මනසින් කරන **මනොමයා** කියන එකට. මනසින් කරන සකස් කිරීම දිහා විදර්ශනය කරනවා. විශේෂයෙන් දකිනවා. එතකොට මේ ලෝකයට අයිති දෙයක් තියෙනවා කියන දෘෂ්ටියෙන් මිදෙනවා. මනසින්ම සකස් කරන **මනොමයා** කියන ලෝකයක්නේ මේ තියෙන්නේ කියලා ප්‍රඥාවෙන් දකිනවා. බල්ලාගේ උපමාවේ බල්ලාට ප්‍රඥාව ටිකක් ආවොත් ඔය බල්ලත් මනසින්ම හදපු බල්ලෙක් නේ, මෙච්චර කල් ලෝකයට අයිති සතර මහා ධාතු රූපය කියලා හිතාගෙන හිටියාට ඔය බල්ලා එලියේ නෙවෙයි ඉන්නේ මනස තුළ - මනෝමය බල්ලෙක් කියලා දකිනවා. මනෝමය බල්ලා තමයි මනසට ධම්ම වෙන්නේ. ඒක හැදුවේ මනස - ඉස්සෙල්ලා ආවේ මනස. මනසින්ම හදපු බල්ලා තමයි ධම්ම. **මනො පුබ්බංගමා ධම්මා මනො සෙට්ඨා මනොමයා** - ඔය ටික තමයි තියෙන්නේ. එතන ඇතිවෙන විදිය දැක්කා නම් අපි ලෝකයට අයිති විදියට කථා කරන්න, ක්‍රියා කරන්න යන්නේ නැහැ.

**ප්‍රශ්ණයකට පිළිතුරක්:** දැන් ඔය මට්ටමට යනකොට **දිට්ඨෙ දිට්ඨ මත්තං** ද කියන එක ධර්මයට අනුව විමසන්න ඕනේ. පළවෙනි දෙය තේරුම් ගන්න වතුරට එබෙන බල්ලා **දිට්ඨෙ දිට්ඨ මත්තං** වුනාද බල්ලෙක්ව හදාගත්තාද? ධම්ම හදාගත්තා. **දිට්ඨෙ දිට්ඨ මත්තං** වුනා නම් මනසට සිහි කරන්න ධර්මයක් ඉතුරු කරගන්නේ නැහැ. **දිට්ඨෙ දිට්ඨ මත්තං** කියන එක රහතන් වහන්සේගේ මට්ටම කියලා තේරුම් ගන්න. එතකොට උපාදානයක් යෙදෙන්න බැහැ. අපි වතුරට එබුනා වගේ, අර බල්ලාගේ මුලාවේ නැහැ, අවිද්‍යාව යෙදිලා නැහැ. ඇහැ පාවිච්චි කළේ බල්ලාගේ දෘෂ්ටියෙන් නම්, අපේ මනස ක්‍රියා කළේ, එතකොට බල්ලෙක්

ඉන්නවා. බල්ලාට **දිට්ඨෙ දිට්ඨ මත්තං** වුනා නම් මොකද වෙන්නේ කියන එක අපේ නුවණින් බලන්න ඕනේ. අපිට වතුරේ බල්ලෙක් පිහිටලා නැහැ. මේක උපමාවක් විතරයි. එතනදී අපි **දිට්ඨෙ දිට්ඨ මත්තං** වගේ. බල්ලා දැකීමට අමතරව ලෝකයට අයිති බල්ලෙක් හදාගෙන. එතකොට දැකීමට අමතරව දකින්න දෙයක් හදාගෙන. දකින්න දෙයක් හදාගත්තහම දකින්න කෙනෙකුත් හදාගෙන. වතුරේ ඉන්න බල්ලෙක් හදාගත්තා නම් ඒ බල්ලා අත් දකින්න මම කියන බල්ලෙකුත් හදාගෙන. ඒ දෙකම හැදුවේ බල්ලාගේ මනස - **මනොමයා.** නැතුව වතුරේ බල්ලෙක් හිටියේ නැහැ. අපේ මට්ටමට පෙනෙනවා ඔය බල්ලාගේ මෝඩ කමටමනේ බල්ලෙක් හදාගෙන තරහා අරගෙන ඉන්නේ.

**ප්‍රශ්ණයකට පිළිතුරක්:** අපේ තැනට එන්න කලින් බල්ලාව තේරුම් ගන්න. මොකද අපි ඉන්නෙත් බල්ලාගේ දෘෂ්ටියේ. ඕකෙන් මිදෙන්න මේක තේරුම් ගන්න. ඇහෙන් දකින කොට බල්ලා වතුරට එබෙන කොට වගේ, ඒ බල්ලාට ඒ අවබෝධය ආවා නම් එතන යෙදෙන ඒ අවිද්‍යාව නැතිවුනා නම් බල්ලා තව දුරටත් බල්ලෙක් ඉන්නවා කියලා රැවටෙන්නේ නැහැ. එතකොට වතුරේ ඉන්න බල්ලා නිරෝධ වුනා. ඉස්සෙල්ලා හටගත්තා දැන් නිරෝධයි. අවිද්‍යාවෙන් බලන කොට බල්ලෙක් හටගන්නවා, අවිද්‍යාව යෙදෙන්නේ නැති වුන විට බල්ලෙක් හටගන්නේ නැහැ. රූපය පිහිටන්නේ නැහැ. රූපය හටගන්නේ නැහැ. සතර මහා ධාතු රූපය පිහිටන්නේ නැහැ. මනසේ රූපය සමහර විට හැදෙයි. බල්ලෙක් වගේ පෙනෙනවා කියන අදහස එයි. බල්ලෙක් වගේ පෙනෙනවා. නමුත් මනසටයි පෙනෙන්නේ. බාහිරයේ ඉන්න සතර මහා ධාතු බල්ලා පිහිටන්නේ නැහැ. අවිද්‍යාව තියෙන කොට සතර මහා ධාතු බල්ලා පිහිටනවා. මේක තමයි ලෝකයේ ඇතිවීම. අවිද්‍යාව යෙදෙන්නේ නැතිවෙන කොට සතර මහා ධාතු බල්ලෙක් පිහිටන්නේ නැහැ. දැකීම තියෙනවා. පෙනීම කියන සිද්ධිය තියෙනවා, රූපයක් තියෙනවා නෙවෙයි. සතර මහා ධාතු රූපයක් කියන දෙය පිහිටන්නේ නැහැ. ඔතනයි තේරුම් ගන්න ඕනේ. පෙනීම කියන සිද්ධිය තිබුණාට බාහිර රූප පිහිටන්නේ නැහැ. ලෝකය පිහිටන්නේ නැහැ. ලෝකයට අයිති බල්ලා පිහිටන්නේ නැහැ. පෙනීම කියන සිද්ධිය තියෙනවා.

එතන ලෝක නිරෝධයක් තියෙනවා. කලින් කලින් තියෙනවා

කියපු බල්ලා දැන් නිරෝධයි. ඉස්සෙල්ලා අවිද්‍යාවෙන් පෙනීම සිද්ධ කරන කොට සතර මහා ධාතු බල්ලෙක් හිටියා. ඒකේ හේතු ඵල දැකලා, ඇයි සතර මහා ධාතු බල්ලෙක් ඉන්නවා කියලා විශ්වාස කළේ කියන අවබෝධය ආ විට, ඒකේ පටිච්ච සමුප්පන්න බව දැක්කහම, ඒ බල්ලා නිරෝධයි. අරක පටිච්ච සමුප්පන්න වුනු බල්ලෙක්. මනසින් මවපු, පටිච්ච සමුප්පන්නව ඉපදුනු බල්ලෙක් තමයි ඉස්සෙල්ලා ඉන්නවා කියලා විශ්වාස කළේ. එතකොට පෙනීමට අමතරව මනසින් මවපු බල්ලෙක් හිටියා. එයා පටිච්ච සමුප්පන්න වුනු බල්ලෙක්. පටිච්ච සමුප්පන්න කියන්නේ එහෙම හිතන්න හේතු තියෙන කොට බල්ලෙක් පෙනුනා. හේතු තමයි අවිද්‍යාවයි, ඒකට අවශ්‍ය වුනු ඉතුරු දේවල් ටිකයි. ඒ හේතු ටික යෙදෙන කොට බල්ලෙක් හිටියා. දැන් බල්ලාගේ හටගැනීම දකිනවා. බල්ලෙක් වගේ පෙනෙන්න හේතු ටික දකිනවා. අවිද්‍යාව නිසා (අවිද්‍යාව විතරක් නෙවෙයි තව ප්‍රත්‍ය යෙදෙනවා. අවිද්‍යාව මුල් වෙනවා), සතර මහා ධාතු බල්ලෙක් හටගත්තා. අපි දැන් දන්නවා ඒ බල්ලාගේ දෘෂ්ටියෙන් බැලුවොත් බල්ලෙක්ව පෙනෙයි. අපේ දෘෂ්ටියෙන් බැලුවොත් බල්ලෙක් පිහිටන්නේ නැහැ. පෙනීම විතරයි. පෙනෙන්නෙත් නැහැ කියන්න බැහැ. පෙනෙනවා. එතනින් එහාට දකින දෙයක් පනවන්නේ නැහැ. බල්ලා දකින දෙයක් පනවනවා. දකින දෙයක් පැනෙව්වොත් ඒ නිසා 'මම' කියන බල්ලෙක්, මම කියන කෙනෙක් - සක්කාය දිට්ඨියක් හටගන්නවා.

බුදුරජාණන් වහන්සේ බාහියට දෙන උපදේශය තමයි ''**යතො ඛො තෙ බාහිය, දිට්ඨෙ දිට්ඨමත්තං භවිස්සති, සුතෙ සුතමත්තං භවිස්සති, මුතෙ මුතමත්තං භවිස්සති, විඤ්ඤාතෙ විඤ්ඤාතමත්තං භවිස්සති, තතො ත්වං බාහිය, න තෙන; යතො ත්වං බාහිය, න තෙන තතො ත්වං බාහිය, න තත්ථ ; යතො ත්වං බාහිය, න තත්ථ තතො ත්වං බාහිය, නෙවිධ න හුරං න උභයමන්තරෙන** - දැකීම දැකීම් මාත්‍රයක් විතරයි. එහෙම වුනොත් බාහිය, ඔබ **එයින් නොපිහිටයි,** (එයින් කියන්නේ බාහිර රූපයෙන් පිහිටන්නේ නැහැ) එවිට බාහිය ඔබ (ඔබ කියන්නේ කෙනා) එයින් නොපිහිටන්නේ **එහිද නොපිහිටයි** (ඒ රූපය තුළ පිහිටන්නෙත් නැහැ), **මෙහිද නොපිහිටයි.** ඕකේ අනිත් පැත්ත බැලුවොත්, රූපයක් පැනෙව්වොත්, සතර මහා ධාතු රූපයක් පැනෙව්වොත් එයින් ඔබ පිහිටනවා. ඒ බල්ලාව අත්දකින්න 'මම' ඉන්නවා. සමහර විට එහි

පිහිටන්නත් පුළුවන්. ඒක වෙනම තේරුම් ගන්න ඕනේ - බාහිර රූපයේ. නැත්නම් අපිට රූපයේ බල්ලෙක් ඉන්නවා කියන අදහසත් එනවා. තව කෙනෙක්ව ඇති කළා. ඒකත් සක්කාය දිට්ඨිය. අතන සත්වයෙක් ඉන්නවා කියන දෘෂ්ටියට එනවා. **දිට්ඨෙ දිට්ඨ මත්තං** වුනොත් එයින් නොපිහිටයි, එහිද නොපිහිටයි. ඒ කියන්නේ බල්ලා පැනෙව්වේ නැත්නම් දැකීමේ සිද්ධිය විතරයි. මෙහිද නොපිහිටයි. එතන තිබුණොත් තමයි මෙතනත් තියෙන්නේ. එහි පිහිටියේ නැත්නම් මෙහිත් පිහිටන්නේ නැහැ. මෙහෙ මම ඉන්නවා කියන දෘෂ්ටියක් එන්න විදියකුත් නැහැ. ඔය දෙක අතරත් නොපිහිටයි. මෙහෙයි එහෙයි කියන කොන් දෙක අතරේ කොහේවත් පිහිටන්නේ නැහැ කියලා තමයි බාහියට දේශනා කළේ. මේක ගැඹුරින් මෙනෙහි කළොත් දැකීම දැකීම් මාත්‍රයක් පමණක් වුනොත් ලෝකයට අයිති රූපයක් හටගන්න බැහැ. මෙහෙ කෙනෙක් හටගන්නත් බැහැ. දැකීම දැකීම් මාත්‍රයක් පමණක් නම්, ඒකේ පටිච්ච සමුප්පන්න බව හරියට දක්කා නම් (දැනට හිතාගන්න මනසින්ම හදපු දෙයක් කියලා දක්කා නම්) ඇත්තට පවතින ස්වභාවයක් නෙවෙයි, මනසින් පෙන්නුම් කරන ස්වභාවය - දැකීම් මාත්‍රයක් පමණයි. දැකීම් මාත්‍රය හීනෙනුත් දකින්න පුළුවන්, එළියේ තියෙන්නම අවශ්‍ය නැහැ. හිතට අරමුණු වෙන ධම්ම ස්වභාවයක් විතරයි. දැකීම් මාත්‍රය වුනොත් බාහිර රූපයක්, සතර මහා ධාතු රූපයක් පනවන්න බැහැ. සතර මහා ධාතු රූපයක් පැනෙව්වේ නැත්නම් දැකීම නිසා ලෝකයක් පනවන්න බැහැ. ඇහෙන් දැකලා විතරක් කවදාවත් එළියේ තියෙන්නේ මේ ස්වභාවය කියලා හඳුනා ගැනීමේ හැකියාවක් නැහැ. පෙන්නුම් කරන ස්වභාවයක් තියෙනවා කියන එක විතරයි කියන්න පුළුවන්. පෙන්නුම් කරන ස්වභාවය ඇහැට අයිති කෘත්‍යයක්. තියෙනවා කියලා හිතන ස්වභාවය ඇහේ කෘත්‍යයක් නෙවෙයි. ඒක අවිද්‍යාව මුල් වෙලා මනසින් කරන දෙයක්. පෙන්නුම් කරන ස්වභාවය ඇහේ ශක්තිය අනුව කරන දෙයක්. ඒ පෙන්නුම් කරන්නෙත් එළියේ තියෙන දෙය නෙවෙයි ඇහේ ශක්තිය අනුව හදලා දෙන ප්‍රතිබිම්බය. ඇහැ පෙනෙනවා අඩු නම් හදන ප්‍රතිබිම්බයත් එතරම් පැහැදිලි නැහැ. ඒක විඤ්ඤාණයෙන් තමයි ඔය එළියේ තියෙන දෙයක් කියන අදහස දෙන්නේ. ඒක අදහසක් මිසක් ඇත්ත ස්වභාවය නෙවෙයි.

එතකොට ඇහෙන් අරන් දෙන්නේ රූප සංඥාවක් විතරයි. සංඥාවක් කියන්නේ රූපයක් වගේ දෙයක්. රූපයක් වගේ දෙයක්

තියෙනවා කියන එක තමයි ඇහෙන් හදලා දෙන ප්‍රසාද රූපෙන් කරන්නේ. එතකොට විඥ්ඥාණයෙන් දැන ගන්නේ ඔය ප්‍රසාද රූපය විතරයි, එළියේ තියෙන රූපය දැනගන්න විඥ්ඥාණයට බැහැ. චක්ඛු විඥ්ඥාණය කියන්නේ ඇහැ නිසා හටගන්න විඥ්ඥාණය. ඇහැ නිසා හටගන්න විඥ්ඥාණයට අත්දකින්න පුළුවන් ඇහෙන් සකස් කරලා දෙන ප්‍රතිබිම්බය, ප්‍රසාද රූපය විතරයි. ඒ ප්‍රසාද රූපය දැනගැනීම තමයි දැකීම කියන්නේ. වෙන මොනවත් නෙවෙයි. දැකීම නිසා ඊට පස්සේ කරන වැඩ තමයි ලෝකයට අයිති දෙයක් තියෙනවා කියන එක. පෙනීම කියන සිද්ධිය චක්ඛු විඥ්ඥාණය එච්චරයි. නමුත් චක්ඛු විඥ්ඥාණයෙන් කරන මායාවක් තියෙනවා. ඒ තමයි මෙතන ඇහැක් තියෙනවා, ඒකට දකින්න සතර මහා ධාතු රූපයක් තියෙනවා කියන එක. ඕක තමයි විඥ්ඥාණයෙන් අපට කියන දෙය. විඥ්ඥාණයේ කෘත්‍ය තමයි ඇහැ නිසා සකස් කරලා දෙන ප්‍රතිබිම්බය, නැත්නම් ප්‍රසාද රූපය දකින එක. මේ ප්‍රසාද රූපයේ සතර මහා ධාතු ගතියක් නැහැ. මේක ඇහේ ඇතිවෙන වර්ණ සටහනක් විතරයි. ඒ වර්ණ සටහන එළියේ තියෙන දෙයට සමාන නැහැ. කාචයක සිද්ධ වෙන ක්‍රියාවලිය දන්නවා නම් හැම තිස්සේම එළියේ තියෙන එකට වඩා හුඟක් පොඩි එකක් තමයි ඇතුළේ හැදෙන්නේ. ප්‍රමාණයෙන් සමාන නැහැ. මෙහි පඨවි, ආපෝ, තේජෝ, වායෝගති නැහැ. නිකන් සටහනක් විතරයි. සටහන් මාත්‍රයක් විතරයි. සිනමා ශාලාවක තිරයේ වැටෙන වර්ණ සංඥා ටික වගේ. මේ වර්ණ සංඥාව බලනවා විඥ්ඥාණය. ශාලාවේ වාඩිවෙලා තිරය දිහා බලාගෙන ඉන්නවා වගේ. තිරය දිහා බලාගෙන අන්න ගෙඩි පිරුණු පොල් ගහක් තියෙනවා කියලා අපි හිතනවා. චිත්‍රපටිය නරඹන කොට අපි හිතන්නේ ඒක එළියේ තියෙනවා කියලා. අපි දකින්නේ ලෝකයට අයිති කරලා. ඕක තමයි සකස් කිරීම. විඥ්ඥාණයෙන් මුළාවෙන්, අවිද්‍යාවෙන්, මෝහයෙන් මේ සියල්ලම එකතු වෙලා සකස් කරන සංඛාර. හරියට අර බල්ලා සකස් කරන වතුරේ ඉන්න බල්ලා වගේ. ඡායාව දැකලා හිතනවා බල්ලෙක් ඉන්නවා කියලා. එතකොට අපි ඇහැට වැටෙන වැටෙන රූප සංඥාවක් ගානේ ඕක දැනගන්න කොට, ලෝකයට අයිති දෙයක් සකස් කරනවා නම් අර බල්ලා කරන වැඩේමයි කරලා තියෙන්නේ.

ඇහේ වැටෙන රූප සංඥාව සංඥා මාත්‍රයක් විතරයි. ඔය සංඥාව බුදුරජාණන් වහන්සේ උපමා කරනවා මිරිඟුවකට. අපි හිතන්නේ මිරිඟුව

කියලා නෙවෙයි, වතුර තියෙනවා කියලා. එළියේ තියෙන සතර මහා ධාතු රූපමයි මේ පෙනෙන්නේ කියලා. බුදුහාමුදුරුවෝ කියනවා ඔය සංඥාව විශ්වාස කරන්න එපා, ඕක මිරිඟුවක් - **මරිචිකූපමා සඤ්ඤා.** දැන් බල්ලා දන්නේ නැහැ ඇහේ ඇති වුන රූප සංඥාව ඔය මිරිඟුවක් දැක්කේ, ඒකට අදාලව හිතෙන් හැදුවා මනෝමයෙන් සකස් කලා. සකස් කලේ එළියේ ඉන්න බල්ලෙක්ව. හිතේ හදපු එක එළියේ තියෙනවා කියලා විශ්වාස කළා. දැඩි දෘෂ්ටියකට ගියා. ඕක තමයි දෘෂ්ටිගත වෙනවා කියන්නේ. මනසේ හදපු බල්ලා එළියේ ඉන්නවා කියලා දෘෂ්ටිගත වුනා. ලෝකයක් හැදුවා. එතකොට ඒ බල්ලා අත්දකින්නේ බාහිර ලෝකයෙන්. මේ තමන් තුළ මනසේ හදපු ලෝකයක් කියන අදහස නැහැ. අපි චිත්‍රපටිය බලන කොට අපි තුළ අදහසක් නැහැ මේ තිරයේ වැටෙන වර්ණ බලමින් අපි කථාව හදනවා කියලා. එළියේ තියෙනවා කියලා විශ්වාස කරනවා. මේක ප්‍රායෝගිකව අත් දකින්න බැරි අපි දෘෂ්ටිගත වෙලා ආපු දැඩි සංසාර පුරුද්ද නිසා. සංසාරයේ දිගටම අපි විශ්වාස කරලා තියෙන්නේ ඇහෙන් දකින්නේ එළියේ තියෙන දෙයමයි කියලා. ශාලාවේ ඇතුලේ චිත්‍රපටිය බලමින් ඉන්නවා වගේ. ඒකේ ඉඳන් එළිය ගැන හිතනවා. හිතනවා කියන්නේ දෘෂ්ටිගත වෙනවා. විශ්වාස කරනවා. විශ්වාස කරන්නේ සතර මහා ධාතු ලෝකයක් ගැන. එහෙම ලෝකයක් නෙවෙයි මේ විඤ්ඤාණයට අරමුණු වෙන්නේ සංඥා ගොඩක් විතරයි. ඇහෙන් නම් රූප සංඥා, කනෙන් නම් ශබ්ද සංඥා, නාසයෙන් නම් සාන සංඥා, දිවෙන් නම් රස සංඥා, කයෙන් නම් ස්පර්ශ සංඥා, මනසින් නම් මනෝ සංඥා. ඔය සංඥා ගොඩ හරියට අර චිත්‍රපටි ගොඩක් වගේ. එකක් ඇති වෙන කොට අනිත් ශාලාවට යනවා. කොහෙන් හරි ඇත්ත වගේ පෙනෙන එක අරගෙන ඒක ඇත්ත කරනවා. ඕවාට මුල් වෙන්නේ අවිද්‍යාව. අවිද්‍යාව නැත්නම් චිත්‍රපටියක් බලන්න බැහැ. වර්ණ ගොඩක් එහෙ මෙහෙ වෙන එක විතරයි තියෙන්නේ. පුරුදු කරන්න කලින් පොඩි ලමයෙක් පාට විතරයි බලන් ඉන්නේ. කථාව හදන්නේ නැහැ. කථාව හදන්න අවිද්‍යාවෙන් ගත්ත පෙර ඇසුර තවම මදි. ඒ ටික දෙමව්පියෝ දෙනවා. චිත්‍රපටි ශාලාවේ මුලින්ම කරන්නේ මුළුමනින්ම අඳුරු කරන එක. ඒක තමයි මෝහ අන්ධකාරය.

බුදුරජාණන් වහන්සේ පෙන්නලා දෙනවා මේ ආයතන හයෙන් බාහිර ලෝකය හදන කම් අපිව මෝහ අන්ධකාරයේ දමලා තියෙන්නේ.

ප්‍රඥාලෝකයෙන් බැලුවොත් විතරයි මිදෙන්න පුළුවන්. හීන ලෝකයෙන් අවදි වෙන්න පුළුවන් ප්‍රඥාවෙන් බැලුවොත්. ප්‍රඥාවෙන් තමයි මේ ඇහැ කරන මුලාව පෙන්වන්නේ. මෝහ අන්ධකාරයේ ඉන්න කල් ඒ ටික විශ්වාස කරනවා. ආයතන හය විශ්වාස කරනවා. හයදෙනාම කියන්නේ බොරු, සංඥා අරගෙන දෙන එක විතරයි කරන්නේ. මිරිඟු අරන් දෙනවා. අපි ඒ මිරිඟු ඇත්ත කියලා විශ්වාස කරනවා. මේ මනසින් කරන මායාව තේරුම් ගන්න. ඒ මනසින් කරන මායාව දන්නේ නැති තාක් කල් අපි අර වතුරට එබෙන බල්ලා වගේ ඇහෙන් පෙන්වන දෙය එලියේ තියෙනවාමයි කියලා දෘෂ්ටිගත වෙලා. ප්‍රඥාව කියන්නේ ඒකේ පටිච්ච සමුප්පන්න බව දැනගන්නවා. බාහිර ලෝකයක් පනවන්නේ නෑ.

බුදුරජාණන් වහන්සේ ඕක දේශනා කරනවා කච්චායනගොත්ත සූත්‍රයේ. කච්චායන හාමුදුරුවන්ට දේශනා කරනවා මේ ලෝකයා ඇත යන දෘෂ්ටියකට වැටෙනවා - **අත්ථි**. නැත යන දෘෂ්ටියකටත් වැටෙනවා - **නත්ථි**. ඇත යන දෘෂ්ටියකට වැටෙන්නේ හටගන්න ස්වභාවයක් දකින කොට ඒක තියෙනවා කියන දෘෂ්ටියට යනවා. වතුරට එබෙන බල්ලා හටගත්තා. එළියේ ඉන්න බල්ලෙක්ව ඉපදුනා. ඇත යන දෘෂ්ටිය. අපි ඕක දැකලා නැහැ කිව්වොත් ඒකත් දෘෂ්ටියක්. ඔතන තමයි ගැඹුර. **අත්ථි**, **නත්ථි** වාද දෙකම දෘෂ්ටි. භාවනා කරලා දැන් මොනවත් නැහැනේ කියන එක දෘෂ්ටියක් මිසක් ධර්මය දැක්මක් නෙවෙයි. මොනවත් නැහැ කියන එක හිත රවටවා ගැනීමක්. හිස් නම්, ශූන්‍ය නම් පෙනීමක් තියෙන්න බැහැ. පෙනෙන්නේ නැත්නම් **දිට්ඨෙ දිට්ඨ මත්තං** කරන්නත් බැහැ. තියෙනවා කියන එක දෘෂ්ටියක් වගේම නැහැ කියන එකත් දෘෂ්ටියක්. ශූන්‍යතා වාදයට වැටෙනවා. මේක සුතමය ඥානයෙන් කරන්න පුළුවන් වැඩක් නෙවෙයි. එතකොට අපි එක එක මත හදාගන්නවා. පටිච්ච සමුප්පාදය කියන එක **ජානතො පස්සතො** - අහන්න, ඊට පස්සේ මෙනෙහි කරලා ප්‍රත්‍යක්ෂ කරගන්න. කච්චායනගොත්ත සූත්‍රයේ කෙනෙක් ඇත හෝ නැත යන දෘෂ්ටියට වැටෙන්නේ ඇයි කියන එක තමයි පැහැදිලි කරන්නේ. ඒ පැහැදිලි කිරීම තමයි අපට උදව් වෙන්නේ. කෙනෙක් තියෙනවා කියන දෘෂ්ටියට වැටෙන්නේ ඒකේ හටගන්න, තියෙන ස්වභාවය දකින නිසා. බල්ලා බල්ලෙක් ඉන්නවා කියන දෘෂ්ටියට ගියේ ඇහැට පෙනෙන නිසා. පෙනෙන නිසා බල්ලෙක් ඉන්නවා කියන විශ්වාසයට ගියා. යම් කෙනෙක් නැහැ කියන දෘෂ්ටියට

වැටෙන්නේ ඇයි කියලා දේශනා කරනවා. කච්චානය, ලෝකය නැතැයි කියන දෘෂ්ටියට වැටෙනවා නිරෝධ වෙන ස්වභාවය දකින කොට. යම්කිසි දෙයක් නැතිවෙලා යන ස්වභාවය දකින කොට. නැතිවෙලා යන ස්වභාවය දකිනවා නම් තියෙනවා කියන එකේ ඉන්න බැහැ. යම්කිසි දෙයක නැතිවෙන ස්වභාවයක් දකින කෙනා යනවා නැත කියන දෘෂ්ටියට. පවතින්නේ නැහැ කියන දෘෂ්ටියට. සමහරු අනිත්‍ය බලලා ඔය දෘෂ්ටියට යනවා. අනිත්‍ය බලලා පෙනෙන දෙයට පෙනෙන්නේ නැහැ කියන්න හදනවා. ඒක මධ්‍යම ප්‍රතිපදාව නෙවෙයි. දෘෂ්ටිගත වීමක්. එතකොට අන්ත දෙකටම වැටෙන්නේ නැතුව තථාගතයන් වහන්සේ **මජ්ඣිම** ප්‍රතිපදාවක් දේශනා කළා.

**ප්‍රශ්ණයකට පිළිතුරක්:** නිරෝධ කියන කොට තේරුම් ගන්න ඔතන තියෙනවා හටගන්න ස්වභාවය. පටිච්ච සමුප්පාදය දේශනා කරන්නේ ඔය දෙකෙන්ම මිදෙන්න. ඇත නැත යන දෘෂ්ටි දෙකෙන්ම මිදෙන්න පුළුවන් පටිච්ච සමුප්පාදයෙන්. මේ හේතු යෙදෙන කොට මෙහෙම විද්‍යමාන වෙනවා. ඒ හේතු යෙදෙන්නේ නැත්නම් එහෙම විද්‍යමාන වෙන්නේ නැහැ. එතකොට තියෙනවා කියන්නෙත් නැහැ, නැහැ කියන්නෙත් නැහැ. උදාහරණයේ බල්ලාට බල්ලෙක් ඉන්නවා කියලා පෙනෙන්නේ ඇයි කියලත් දන්නවා ඒ හේතු නොයෙදුනානම් බල්ලෙක් හටගන්නේ නැහැ කියන ස්වභාවයත් දන්නවා. දැන් ඇත නැත යන දෘෂ්ටි දෙකේම නැහැ. දැකීමක් තිබුණට දැකීම නිසා දෘෂ්ටිගත වෙන්නේ නැහැ. කිසිවක් පනවන්නේ නැහැ. දැකීම පටිච්ච සමුප්පන්න ධර්මතාවයක් බව දන්නවා. පටිච්ච සමුප්පන්න බව දැක්කොත් පච්චයා කියන ධර්මතාවය දැක්කොත් නිරෝධා කියන ධර්මතාවයත් දකින්න පුළුවන්. (අනුලෝම-පටිලෝම) පච්චයා කියන ධර්මතාවයයි නිරෝධා කියන ධර්මතාවයයි තමයි පටිච්ච සමුප්පාදය කියන්නේ. පච්චයා කියන්නේ - **ඉමස්මිං සති ඉදං හොති ඉමස්ස උප්පාදා ඉදං උප්පජ්ජති** - මේ දෙය තියෙනවා නම් මේ දෙය තියෙනවා, මේ දෙය හටගත්තොත් මේ දෙයත් හටගන්නවා. නිරෝධ කිව්වේ - **ඉමස්මිං අසති ඉදං න හොති ඉමස්ස නිරොධා ඉදං නිරුජ්ඣති**. එතකොට පච්චයා කියන ධර්මතාවයයි නිරෝධා කියන ධර්මතාවයයි දකින කෙනා පච්චයා හින්දා නැත යන දෘෂ්ටියකට එන්නේ නැහැ. හේතු යෙදුන විට මෙහෙම පෙන්නුම් කරන ස්වභාවයක් තියෙනවා. මේ හේතු යෙදුනු විට නැත කියන්න බැහැ.

නැත්තං කොහොමද පෙන්නුම් කරන්නේ? ඒ හේතු යෙදෙන්නේ නැත්නම් එහෙම ස්වභාවයක් නැහැ. නිරෝධා. එතකොට බල්ලාගේ හටගැනීමත් දන්නවා, නිරෝධයත් දන්නවා. මේකම අපේ ඇහෙන් හටගන්න බාහිර රූප වලටත් යොදන්න. මේ හේතු යෙදුනොත් ඔහොම තියෙනවා කියලා හිතෙනවා, මේ හේතු යෙදුනේ නැත්නම් එහෙම හිතෙන්නේ නැහැ. මේවා සියල්ලම මනෝමයා - මනසින් හදන දේවල්. අවිද්‍යාව යෙදෙන නිසා පටිච්ච සමුප්පන්න වෙන දේවල්. ප්‍රත්‍ය යෙදෙන නිසා පෙන්නුම් කරන ස්වභාවයක්. මේ සියල්ලම හිතෙන් අවිද්‍යාව නිසා පෙන්නුම් කරන දේවල් මිසක් ස්ථිර දෙයකුත් නෙවෙයි අස්ථිර දෙයකුත් නෙවෙයි. දෙයක් නෙවෙයි. ධර්මතාවයක්. මනසට අරමුණු වෙන ධර්මතා ස්වභාවයක් තියෙනවා. එතන ආත්ම ස්වභාවයක් නැහැ. එතනත් පටිච්ච සමුප්පන්නයි. මනසත් පටිච්ච සමුප්පන්නයි, ධම්මත් පටිච්ච සමුප්පන්නයි. අභ්‍යන්තර ආයතනත් පටිච්ච සමුප්පන්නයි, බාහිර ආයතනත් පටිච්ච සමුප්පන්නයි, විඤ්ඤාණයත් පටිච්ච සමුප්පන්නයි.

මේ පටිච්ච සමුප්පන්න බව නිතරම මෙනෙහි කරන්න. **යො ධම්මං පස්සති සො පටිච්චසමුප්පාදං පස්සති යො පටිච්චසමුප්පාදං පස්සති සො ධම්මං පස්සති** - මෙතන පටිච්ච සමුප්පාදයත් තියෙනවා, පංච උපාදාන ස්කන්ධයත් තියෙනවා, චතුරාර්ය සත්‍යයත් තියෙනවා, සත්තිස් බෝධිපාක්ෂික ධර්‍මම තියෙනවා. නිවන් අවබෝධ කරගන්න තුරු අවශ්‍ය දේවල් ටික සේරම තියෙනවා පටිච්ච සමුප්පන්න බව දැක්කොත්. ඒක තමයි **මජ්ඣිමා ප්‍රතිපදා** කියන්නේ, පටිච්ච සමුප්පාදය දකින එක. එතකොට ඇත නැත යන අන්තයන්ට වැටෙන්නේ නැහැ, පටිච්ච සමුප්පන්න බවක් අවබෝධ කරනවා. එයින්ම දුක කෙලවර කරනවා. ඔය අවබෝධය ගත්තොත් පටිච්ච සමුප්පාදය දැක්කා වෙනවා, සක්කාය දිට්ඨිය පිහිටන්නේ නැහැ. ඊටපස්සේ සක්කාය විතරයි. එවිට තියෙන්නේ සක්කායෙන් මිදෙන්න.

අද අපි කථා කළේ පටිච්ච සමුප්පාදය තව විදියකට. දැන් තමන්ට කරන්න වැඩ ගොඩක් තියෙනවා. තව කෙනෙක් දැකපු දෙය තමන්ට හරියන්නේ නැහැ. මේවා ධර්‍මයට අනුව නුවණින් විමසන්න. පටිච්ච සමුප්පාදයේ භාගයක් හරි භාගයක් වැරදි කියලා ගන්න එපා. තණ්හාවෙන් පටන් අරන් දුකට යනකල් විතරයි නැති කරන්නේ,

සංඛාරයෙන් පස්සේ විඤ්ඤාණ, නාමරූප, සළායතන, ඵස්ස, වේදනා තියෙනවා, රහත් වුනත් ඔය ටික තියෙනවා, තණ්හාවෙන් පස්සේ ටික තමයි රහත් වුනාම අයින් වෙන්නේ - එහෙම හිතුවොත් ඒක වැරදියි, එතන පටිච්ච සමුප්පාදයෙන් භාගයයි. බුදුහාමුදුරුවෝ දේශනා කළේ තණ්හා, උපාදාන, භව, ජාති ඒවා විතරක් නෙවෙයි නිරෝධ වෙනවා කියලා. ඊට කලින් තියෙන ටිකත් නිරෝධ වෙනවා. ඒ නිරෝධ වෙන විදියේ දැක්මක් ඇති කරගන්න. පටිච්ච සමුප්පාදයේ එහෙම දැක්මක් තියෙන්නේ. අවිද්‍යාව නිරෝධ වුනොත් සංඛාර, විඤ්ඤාණ, නාමරූප, සළායතන, ඵස්ස, වේදනා, තණ්හා, උපාදාන, භව, ජාති නිරෝධයි කියන දැක්මකින් ධර්මය හොයන්න. ඒක තමයි පටිච්ච සමුප්පාදය. පච්චයා කිව්වා වගේ නිරෝධා කියන පැත්තත් එහෙමමයි. අපට තේරුම් කරන්න බැරි වුනා කියලා වෙන වෙන විදියේ තේරුම් දමලා හරියන්නේ නැහැ. මේක උපමාවත් සමග සංසන්දනය කරලා බැලුවොත් පෙනෙයි එහෙම නිරෝධයක් තමයි තියෙන්නේ කියලා. අවිද්‍යාව නිරෝධ වුනොත් ඊට පස්සේ එන කිසිවක් නැහැ. අංග 12ම පිහිටන්නේ නැහැ. ලෝකයට අයිතියි කියලා භාරගත්තා නම් මතක තියාගන්න උපාදානයත් හටගත්තා, ඉතුරු අංග 12ම හටගෙන ඉවරයි. දුකත් හටගත්තා කියන මට්ටමින් හෙව්වොත් යම්කිසි අවබෝධයක් ගන්න පුළුවන්.

**************************